මැතිවරණ කොමිෂන් සභාවේ
2019 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව
(2019.01.01 – 2019.12.31)

පටුන

පිටු අංකය

01. මැතිවරණ කොමිෂන් සභාවේ සංයුතිය 1

02. මැතිවරණ කොමිෂන් සභාවේ දැක්ම හා මෙහෙවර 1

03. අරමුණු හා පරමාර්ථ 1

04. කොමිෂන් සභාවේ කාර්යභාරය 1

05. ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ ඡන්ද විමසීම - 2019.11.16 2

06. නිවේදිත කාර්යාල පිහිටුවීම 5

07. මැතිවරණ ආරවුල් කළමනාකරණය 7

08. පශ්චාත් මැතිවරණ රාජකාරී කටයුතු ඉටුකිරීම 7

09. 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත 7

10. 2017 අංක 17 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත 7

11. පළාත් සභා ඡන්ද විමසීම ප්‍රමාද වීම 8

12. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පැවැත්වීම

12.1 ඇල්පිටිය ප්‍රාදේශීය සභා ඡන්ද විමසීම - 2019 10

12.2 දිවයිනේ සියලුම පළාත් පාලන ආයතන මහජන නියෝජිතයන් විසින් පාලනය කිරීම .. 11

13. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත (26 දරන අධිකාරය) 12

14. ඡන්දහිමි නාමලේඛනය ප්‍රතිශෝධනය - 2019 12

15. 18-DS යොවුන් හා ආබාධිත පුරවැසි තොරතුරු ලබා ගැනීමේ ආකෘතිය 16

16. ඡන්දහිමියන්ගේ දිනය - ජූනි 01 16

17. දේශපාලන පක්ෂ සම්බන්ධ කටයුතු 16

18. විශේෂ ව්‍යාපෘති

18.1. උපායමාර්ගික සැලැස්ම 17

18.2. කතිරයේ බලය 18

18.3. පාර්ලිමේන්තු මැතිවරණය අලලා ත්‍රෛභාෂික ග්‍රන්ථය මුද්‍රණය 18

18.4. කාන්තා 18

18.5. තරුණ 19

18.6. ආබාධිත 19

18.7. පෞර 20

18.8. වාර්ෂික පර්යේෂණ සැසිය 2019 21

19. අන්තර්ජාතික දින සැමරුම්

19.1. නිර්ප්‍රචන්ඩත්වය හා සාමය පිළිබඳ පාසල් දිනය 22

19.2. ජාත්‍යන්තර මව්භාෂා දිනය 22

19.3. ජාත්‍යන්තර කාන්තා දිනය 22

19.4. ජාත්‍යන්තර තරුණ දිනය 22

19.5. ආබාධ සහිත පුද්ගලයින්ගේ ජාත්‍යන්තර දින සැමරුම 22

20. නීති කටයුතු

20.1. නීති උපදෙස් ලබා ගැනීම හා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යවන ලද ලිපි..... 23

21. නීති සංශෝධනවලට අදාල කාර්යයන්

21.1. මැතිවරණ වියදම් පාලනය සඳහා වන නීති සම්පාදනය..... 24

21.2. 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත..... 24

21.3. අනෙකුත් මැතිවරණ සංශෝධන..... 25

22. මැනව හිමිකම් කොමිෂන් සභාව, අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව, පොලිස් කොමිෂන් සභාව, අධිකරණ කොමිෂන් සභාව සම්බන්ධ කටයුතු..... 25

23. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන සභාව සම්බන්ධ කටයුතු..... 25

24. අධිකරණ සේවා කොමිෂන් සභාව සම්බන්ධ කටයුතු..... 25

25. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනතට අදාලව තොරතුරු ලබාදීම්..... 26

26. කාර්ය මණ්ඩල තොරතුරු

26.1. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය..... 26

26.2. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය..... 26

26.3. රියදුරු සේවය..... 26

26.4. කාර්යාල සේවක සේවය..... 26

27. තනතුරු ඇති කිරීම..... 27

28. උසස් කිරීම්..... 27

29. නව පත්කිරීම්..... 27

30. රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු ලැබීම මත නිදහස් කිරීම්..... 28

31. සේවය අවසන් කිරීම..... 29

32. කාර්යක්ෂමතා කඩඉම් පැවැත්වීම..... 29

33. නව බඳවා ගැනීම්..... 29

34. පුරප්පාඩු තනතුරුවල රාජකාරී කටයුතු ආවරණය කිරීම..... 29

35. ස්ථාන මාරු

35.1. අභ්‍යන්තර ස්ථාන මාරු..... 30

35.2. දෙපාර්තමේන්තුවෙන් පිටතට ලබාදෙන ලද ස්ථාන මාරු..... 30

36. විශ්‍රාම ගැනීම්..... 30

37. මියයාම්..... 31

38. පොදු පහසුකම් සැපයීම..... 31

39. ආරක්ෂක කටයුතු..... 32

40. පුහුණු

40.1. දේශීය පුහුණුවීම්..... 32

40.2. විදෙස් පුහුණු හා නිල චාරිකා

40.2.1. නිල චාරිකා..... 33

40.2.2. පුහුණු..... 34

41. ඉදිකිරීම් හා වත්කම්
41.1. ඉදිකිරීම් හා අළුත්වැඩියා
41.1.1. වැය විෂය - 2001 35
41.1.2. වැය විෂය - 2104 35
41.1.3. වැය විෂය - 2105 35
42. වාහන හා පාලනය 36
43. යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම / අළුත්වැඩියා කිරීම / නඩත්තු කිරීම 37
44. කාර්යාල භාණ්ඩ මිලදී ගැනීම 37
45. පොදු 37
46. තොරතුරු තාක්ෂණික කටයුතුවල ප්‍රගතිය
46.1. 2019 වර්ෂයේ ප්‍රතිශෝධනට අදාළ කටයුතු 38
46.2. මැතිවරණවලට අදාල කටයුතු 38
47. විගණනය සහ මූල්‍ය තොරතුරු
47.1. මූල්‍ය තොරතුරු 40
47.2. විගණන තොරතුරු 41
48. සමස්ථ මූල්‍ය කාර්යසාධනය සහ අනුකූලතා වාර්තාව
48.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 42
48.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 44
48.3. මුදල් ප්‍රවාහ ප්‍රකාශය 45
48.4. මූල්‍ය ප්‍රකාශ සටහන්
48.4.1. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 47
48.5. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 47
48.6. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිදාන 48
48.7. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 48
48.8. විගණකාධිපතිවරයාගේ වාර්තාව 48
48.9. කාර්ය සාධන දර්ශකය 49
48.10. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය
48.10.1. හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු 49
48.10.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 49
48.11. මානව සම්පත් පැතිකඩ
48.11.1. සේවක සංඛ්‍යා කළමනාකරණය 49
48.11.2. මානව සම්පත් සංවර්ධනය 50
48.12. අනුකූලතා වාර්තාව 58
49. සමාප්තිය 65

සටහන්

I.	නාම යෝජනා භාරදෙනු ලැබූ අපේක්ෂකයින්ගේ නාමාවලිය	69
II.	මැතිවරණ කොට්ඨාස මට්ටමින් එක් එක් අපේක්ෂකයන් ලබාගත් ඡන්ද සංඛ්‍යාව	70
III.	එක් එක් ඡන්ද ප්‍රදේශ අනුව අපේක්ෂකයන් ලබාගත් ඡන්ද සංඛ්‍යාව	72
IV.	පාර්ලිමේන්තු මන්ත්‍රීධුර පුරප්පාඩු පිරවීම - 2019	98
V.	පළාත් සභා මන්ත්‍රීධුර පුරප්පාඩු පිරවීම - 2019	99
VI.	පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ක්‍රමය සංශෝධනය වීමට අදාළ කරුණු හා ඒ හේතු නිසා පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ප්‍රමාදවීම	114
VII.	2019 වර්ෂයේ පළාත් පාලන ආයතන පුරප්පාඩු පිරවීම	120
VIII.	ඡන්දභිමියන් ගණන් ගැනීමට අදාළ නව බීසී ආකෘතිය හඳුන්වාදීමේ නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පිළිබඳ විස්තර	134
IX.	උතුරු සහ නැගෙනහිර පළාත්වල පිහිටි ගෙයින් ගෙට ගොස් ඡන්දභිමියන් ගණන් ගැනීම සිදු නොකළ එක් එක් ග්‍රාම නිලධාරී වසම් පිළිබඳ විස්තර	135
X.	ප්‍රවර්තන නාමලේඛනයේ (2019) සියලුම මැතිවරණ කොට්ඨාසවලට අදාළව ඉවත්වන නම් ("අ" නම්) සංඛ්‍යාව සහ අලුතෙන් ඇතුලත්වන නම් ("ආ" නම්) සංඛ්‍යාව	136
XI.	නියෝජිතයින් පත්කරනු ලැබූ දේශපාලන පක්ෂ, පත්කරනු ලැබූ ප්‍රමාණයන් හා ඡන්දභිමියන් ගණන් ගැනීමේ කාර්යය සඳහා සහභාගී වූ නියෝජිතයන් පිළිබඳ විස්තර	137
XII.	1980 අංක 44 දරන ඡන්දභිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 14 වන වගන්තිය යටතේ හිමිකම් ඉල්ලීම හා විරෝධතා ඉදිරිපත් කිරීම	138
XIII.	ජාතික ක්‍රමසම්පාදන සාකච්ඡා පැවති දින වකවානු	139
XIV.	2019 වර්ෂයේදී කටයුතු කරන ලද නඩු	140
XV.	2019 වර්ෂයේ සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරීන් නාමලේඛනය	142
XVI.	විගණකාධිපතිවරයාගේ වාර්තාව	143

1. මැතිවරණ කොමිෂන් සභාවේ සංයුතිය

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව, අතිගරු ජනාධිපතිතුමා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත මැතිවරණ කොමිෂන් සභාව සඳහා පත්කරන ලද සාමාජිකයින් තිදෙනෙකුගෙන් එක් අයෙකු සභාපති වශයෙන් පත් කරන ලද අතර 2015.11.17 වන දින රාජකාරී භාර ගැනීමෙන් පසු මැතිවරණ කොමිෂන් සභාව ස්ථාපිත විය. කොමිෂන් සභාවේ සංයුතිය පහත පරිදි වේ.

- මහින්ද දේශප්‍රිය මහතා (සභාපති)
- ජනාධිපති නීතිඥ එන්.ජේ. අබේසේකර මහතා (සාමාජික)
- මහාචාර්ය එස්. රත්නජීවන් එච්. හූල් (සාමාජික)

2. මැතිවරණ කොමිෂන් සභාවේ දැක්ම හා මෙහෙවර

"සර්වජන ඡන්ද බලය සුරකින දේශයක්" යන්න කොමිෂන් සභාවේ දැක්මයි.

එකී දැක්ම සාක්ෂාත් කරගැනීම සඳහා "ජනතා පරමාධිපත්‍ය, සර්වජන ඡන්ද බලය හා සබැඳි ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම ආරක්ෂා කරමින් පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත වන පරිදි අදාළ සියළු පාර්ශව දැනුම්වත් කෙරෙන නිදහස්, සාධාරණ හා විශ්වාසනීය මැතිවරණ ක්‍රියාවලියක් කාර්යක්ෂමව හා සඵලතාවයෙන් යුතුව මෙහෙය වීම" යනුවෙන් මෙහෙවර ප්‍රකාශය වේ.

3. අරමුණු හා පරමාර්ථ

- සුදුසුකම් ඇති සියලුම පුරවැසියන්ට නිදහස් හා සාධාරණ ලෙස පවත්වනු ලබන්නා වූ ඡන්ද විමසීම්වලදී නොබියව, නිදහසේ, විශ්වාසයක් ඇතිව සිය ඡන්දය පාවිච්චි කිරීමට අවස්ථාව සැලසීම.
- ඡන්දය පාවිච්චි කිරීම තමන් වෙත ඇති අන්සතු කළ නොහැකි අයිතියක් බවත්, තමන් මැතිවරණ ක්‍රියාවලිය තුළ ක්‍රියාකාරී ලෙස සහභාගී වන බවත් අවබෝධ කරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- ඡන්ද විමසීම් කාලසීමාව තුලදී සියලු ඡන්ද අපේක්ෂකයන්ට සම හා සාධාරණ අවස්ථාවන් ලැබෙන පරිදි ක්‍රියාකිරීමට පියවර ගැනීම.
- සියලුම ඡන්ද විමසීම්වලට පූර්වයෙහි සුදුසුකම්ලත් සියලු පුරවැසියන් ඇතුළත් වූ, යථාවත් කරන ලද ඡන්දහිමි නාමලේඛනයක් සකස් කිරීම.
- සමාජය තුළ ආන්තික ලෙස ජීවත්වන සියලු පුරවැසියෝ විශ්වාසවන්ත ලෙස හා ප්‍රමාණවත් ලෙස ඡන්ද විමසීම් ක්‍රියාවලියට සහභාගී කරවීමට අවශ්‍ය පියවර ගැනීම.
- මැතිවරණ ක්‍රියාවලිය දක්ෂ ලෙස හා පාරදෘශ්‍ය ලෙස පරිපාලනය කිරීම.
- ඡන්ද විමසීම් ක්‍රියාවලියට හා මැතිවරණ කොමිෂන් සභාවට අදාළ දත්ත හා තොරතුරු පාර්ශවකරුවන්ට ලබාගැනීමේ පහසුකම් කාලානුරූපව හා ප්‍රමාණවත් ලෙස සලසනු ලැබීම.

4. කොමිෂන් සභාවේ කාර්යභාරය

මැතිවරණ කොමිෂන් සභාව ස්ථාපිත කිරීමෙන් පසුව, එතෙක් මැතිවරණ කොමසාරිස්වරයා ප්‍රමුඛ මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් ඉටුකරන ලද මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳ කටයුතු කොමිෂන් සභාව යටතට පත්විය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 (2) අනුව නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් පැවැත්වීම, කොමිෂන් සභාවේ මූලික කාර්යභාරය වේ. ඒ අනුව ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම, පාර්ලිමේන්තු මැතිවරණය, පළාත් සභා ඡන්ද විමසීම්, පළාත් පාලන ඡන්ද විමසීම් හා ජනමත විචාරණ යනාදී ඡන්ද විමසීම් නිදහස් හා සාධාරණව පැවැත්වීම ද ඊට අදාලව වාර්ෂික ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය ද සිදුකළ යුතුවේ. මෙම ව්‍යවස්ථාපිත කටයුතුවලට අමතර වශයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී පුරප්පාඩු පිරවීම, පළාත් සභා සභිකධූරවල පුරප්පාඩු පිරවීම හා පළාත් පාලන ආයතනවල සභිකධූරවල පුරප්පාඩු පිරවීම ද දේශපාලන පක්ෂ පිළිගැනීම හා ලියාපදිංචි කිරීමද යන ව්‍යවස්ථාපිත කාර්යයන්ද මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇත.

5. ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ ඡන්ද විමසීම - 2019.11.16

ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම සඳහා ඡන්ද විමසීම,ධුරය දරණ ජනාධිපතිවරයාගේ ධුර කාලය ඉකුත් වීමට පෙර මාසයකට අඩු නොවෙන හා මාස දෙකකට වැඩි නොවන කාලසීමාවක් තුළදී පැවැත්විය යුතු යැයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 වැනි ව්‍යවස්ථාවේ (3) වැනි අනු ව්‍යවස්ථාවේ නියමිතව ඇති හෙයින්ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ වැනි ව්‍යවස්ථාව සමග කියවෙන 1981 අංක 15 දරණ ජානාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ පනතේ 2 වැනි වගන්තියේ මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2 වැනි වගන්තිය යටතේ වූ දැන්වීම 2019.09.08 දින අංක 2141/25 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අතර එම දැන්වීම මඟින් නාමයෝජනා භාර ගැනීම 2019.10.07 වන දිනට හා ඡන්ද විමසීම පැවැත්වීම 2019.11.16 දිනට නියම කරන ලදි.

නාම යෝජනා භාර ගැනීම 2019.10.07 දිනට නියම කිරීම නිසා තරඟ කිරීමට බලාපොරොත්තුවන අපේක්ෂකයින් 2019.10.06 දින මධ්‍යාහ්න 12.00ට පෙර ඇප මුදල් තැන්පත් කළ යුතු විය. ඒ අනුව නියමිත දිනය වනවිට පිළිගත් දේශපාලන පක්ෂ වලින් අපේක්ෂකයින් 19ක් ද, වෙනත් දේශපාලන පක්ෂ වලින් අපේක්ෂකයන් 03ක් ද, අනෙකුත් අපේක්ෂකයින් 19 ක් වෙනුවෙන්ද ඇප මුදල් තැන්පත් කරන ලදී.

නාමයෝජනා භාර ගැනීම 2019.10.07 දින රාජගිරිය මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී සිදු කරන ලද අතර, ඇප මුදල් තැන්පත් කරන ලද අපේක්ෂකයින් අතුරින් පිළිගත් දේශපාලන පක්ෂ 18 කින්, වෙනත් දේශපාලන පක්ෂ 02 කින් හා අනෙක් අපේක්ෂකයන් 15 දෙනෙකු සිය නාමයෝජනාපත්‍ර මැතිවරණ කොමිෂන් සභාව වෙත ඒ සඳහා නියම කරන ලද වේලාව තුළ භාර දීම සිදු කෙරිණි. නාමයෝජනා භාර ගැනීමෙන් පසුව මැතිවරණ කොමිෂන් සභාව විසින් එම නාමයෝජනා පත්‍ර පරීක්ෂා කර, ඒවා පිළිගන්නේද නැතිද යන්න ප්‍රකාශ කිරීම කළ යුතු විය. ඒ අනුව භාරදෙන ලද සියළුම නාමයෝජනා පත්‍ර 1981 අංක 15 දරණ ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනතේ විධිවිධාන වලට අනුකූලව භාරදී තිබූ බැවින් සියළුම නාමයෝජනා පත්‍ර පිළිගනු ලැබූ බව මැතිවරණ කොමිෂන් සභාව විසින් ප්‍රකාශ කරන ලදී. නාමයෝජනා භාරදෙනු ලැබූ අපේක්ෂකයින්ගේ නාමාවලිය ***අංක I දරන සටහනෙහි*** දක්වා ඇත.

ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීම පිළිබඳ පනතේ 2 වගන්තිය යටතේ ඡන්ද විමසීම පිළිබඳ දැන්වීම 2019.09.18 දින නිකුත් කිරීම අනුව, අදාළ පනතේ 23(2) වගන්තියට අනුව ඡන්ද විමසීම් රාජකාරි වලට සම්බන්ධවන රජයේ නිලධාරීන් සඳහා තැපෑලෙන් ඡන්දය දීමේ පහසුකම් සැලසිය යුතුව තිබුණි. ඒ අනුව තැපැල් ඡන්ද ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමට 2019.09.30 දක්වා නියමිතව තිබූ කාලය නාමයෝජනා භාරගැනීමේ අවසන් දිනය වූ 2019.10.04 දින දක්වා දින හතරකින් දීර්ඝ කරන ලදී. මෙම ඡන්ද විමසීම වෙනුවෙන් තැපැල් ඡන්ද අයදුම්පත් 717,675 ක් ලැබුණු අතර, ඒවායින් පිළිගත් තැපැල් ඡන්ද අයදුම්පත් සංඛ්‍යාව 659,029 ක් විය. සහතික කිරීමේ නිලධාරීන්ගේ කාර්යාල වලදී තැපැල් ඡන්ද සලකුණු කිරීම සඳහා 2019.10.31 හා 2019.11.01 යන දෙදින නියම කරන ලද අතර, එදිනට සලකුණු කළ නොහැකිවූ තැපැල් ඡන්ද පැකැට්ටු තේරීම්භාර නිලධාරි වෙත භාරගෙන ඒවා සලකුණු කිරීම සඳහා දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරි කාර්යාල වලදී 2019.11.07 දින පහසුකම් සලසන ලදී.

2019 ඡන්දහිමි නාමලේඛනයේ ප්‍රතිශෝධන කටයුතු නාමයෝජනා කැඳවන අවස්ථාවේදී අවසන් නොවී තිබුණ බැවින් 2018 ඔක්තෝබර් මස 25 දින සහතික කල නාමලේඛණය ජනාධිපතිවරණය සඳහා යොදා ගන්නා ලදි. 2018 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයට අනුව ඡන්දහිමියන්ගේ සංඛ්‍යාව 15,992,096 කි. ඡන්ද කොට්ඨාස සංඛ්‍යාව 12644 ක් වූ අතර, ගැහැණු ඡන්ද දායිකාවන් සඳහා වෙන්කරන ලද ඡන්ද පොළවල්ද සමඟ මුළු ඡන්ද පොළවල් සංඛ්‍යාව 12845 ක් විය.

2014 අංක 14 දරණ ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනතට අනුව ඡන්ද විමසීමකදී ඡන්ද පත්‍රිකාවක් කිසියම් ඡන්ද දායකයකු වෙත ලබාදීමට පෙර ඡන්දදායකයා ජාතික හැඳුනුම්පත අනුව හඳුනාගත යුතු වේ. එහෙත් කිසිදු බාධාවකින් තොරව ජාතික හැඳුනුම්පත මහජනතාව වෙත ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සලසන තෙක් හා සියළුම ඡන්ද දායකයන් වෙත ජාතික හැඳුනුම්පත් නිකුත් කර අවසන්වන තෙක්

වෙනත් අනන්‍යතා ලේඛන ද ඡන්දය විමසීමේ කාර්යය සඳහා පිළිගැනීමට තීරණය කෙරිණි. ඊට අමතරව ජාතික හැඳුනුම්පත හෝ වෙනත් අනන්‍යතා ලේඛනයක් නොමැති ඡන්ද දායකයන් වෙත මැතිවරණ කොමිෂන් සභාව විසින් තාවකාලික හැඳුනුම්පත් නිකුත් කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව ජනාධිපතිවරණ ඡන්ද විමසීමේදී අළුතින් තාවකාලික හැඳුනුම්පත් 195,433 ක් නිකුත් කරන ලදි.

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 24 වගන්තියට අනුව ලියාපදිංචි සියළුම ඡන්ද දායකයන් වෙත නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් යැවිය යුතු වේ. ඒ අනුව ඡන්දදායකයන්ගේ ලියාපදිංචි විස්තර හා ඡන්දපොළට අදාළ විස්තර සටහන් කරන ලද නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා ඡන්ද දායකයන් වෙත බෙදාහැරීම සඳහා 2019.10.23 දින තැපැල් දෙපාර්තමේන්තුව වෙත භාරදෙන ලදී. ඡන්දභිමි නාමලේඛනයේ නම් සඳහන් ඡන්ද හිමියන්ගෙන්, ඡන්ද විමසීමට ආසන්න කාල සීමාවක් දක්වා විදේශගතව සිටි සහ මියගොස් සිටි අයගේ විස්තර ග්‍රාම නිලධාරීන්ගෙන් ලබාගෙන, එම තොරතුරු අදාළ නිල දැන්වීම් පත්‍රිකාවල මුද්‍රාවක් මඟින් තබන ලදී. තවද, ඡන්ද විමසීමේදී තැපැල් ඡන්ද හිමියන්ගේ නම් වලට අදාළවද නිල ඡන්ද දැන්වීම් පත්වල මුද්‍රා තබා භාරදෙන ලදී. ඡන්දපොළභාර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් වෙත ලබා දී තිබූ ඡන්දභිමි නාමලේඛන වලද විදේශගතව සිටින, මියගොස් ඇති සහ තැපැල් ඡන්දභිමියන්ගේ විස්තර සටහන් කර යවන ලද අතර, ඒ තුළින් හොර ඡන්ද දැමීම වැළැක්වීම අපේක්ෂා කරන ලදී.

17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් තහවුරු කිරීම සඳහා අවශ්‍ය පියවර වශයෙන්,

- සියළුම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතන වෙත මාධ්‍ය උපමාන නිකුත් කිරීම
- රාජ්‍ය සම්පත් අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සඳහා සියළුම රාජ්‍ය ආයතන වෙත ලිඛිත දැන්වීම් කිරීම
- මැතිවරණ මහලේකම් කාර්යාලයේ සහ සියළුම දිස්ත්‍රික් ත්‍රේරීම්භාර නිලධාරි කාර්යාලවල පැමිණිලි මධ්‍යස්ථාන විවෘත කර, වගකිව යුතු නිලධාරීන් පත්කර, පැමිණිලි භාරගැනීම හා ඒ සඳහා ක්ෂණික විසඳුම් ලබාදීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම
- අපේක්ෂක ආචාරධර්ම පද්ධතියක් හඳුන්වා දීම
- මැතිවරණ රාජකාරි සඳහා පත් කරනු ලබන පොලිස් නිලධාරීන්ට මහ පෙන්වීමේ උපදෙස් මාලාවක් පොලිස්පතිවරයා මාර්ගයෙන් ලබාදීමට ක්‍රියාකරන ලදී.

අපේක්ෂකයින් 35 දෙනෙකු නාමයෝජනා ලබා දීම හේතුවෙන් ඡන්ද පත්‍රිකාව අඩි 02 ක ප්‍රමාණයෙන් විශාල වීම නිසා මැතිවරණ සංවිධාන කටයුතු වලදී යම් අභියෝගයන්ට මුහුණ පාන්නට සිදු විය.විශේෂයෙන්ම සාමාන්‍යයෙන් භාවිත කරනු ලබන ලී ඡන්ද පෙට්ටියට බහාලිය හැකි ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව හරි අඩකින් අඩු වූ බැවින් විකල්ප ඡන්ද පෙට්ටි සපයා ගැනීමට සිදු විය.ඒ අනුව විශාලන ප්‍රමාණ තුනකින් විශේෂිත ආරක්ෂිත සණ කාඩ්බෝඩ් ඡන්ද පෙට්ටි හඳුන්වා දෙන ලදි. මේ සඳහා ආනයනික ප්ලාස්ටික් හෝ විශේෂිත සහ කාඩ්බෝඩ් වලින් සාදන ලද ඡන්ද පෙට්ටි භාවිතා කිරීමට යෝජනා ඉදිරිපත් වූ නමුත්, ජාතික මැතිවරණ විෂයභාර අතිරේක මැතිවරණ කොමසාරිස්වරයා ප්‍රමුඛ සෙසු නිලධාරීන් විසින් දේශීය සැපයුම්කරුවන් උනන්දු කර, නිසි උපදෙස් ලබාදී, කාඩ්බෝඩ් ඡන්ද පෙට්ටි ලබාගැනීමට ක්‍රියාකිරීම හේතුවෙන් සැලකිය යුතු මුදලක් ඉතුරු කර ගැනීමට හැකිවිය.

තවද ඡන්ද පත්‍රිකාව දිගු වීම හේතුවෙන් ඡන්ද දායකයන් තම ඡන්දය ප්‍රකාශ කිරීමට ගතවන කාලය සාපේක්ෂව වැඩිවීමක් සිදුවිය හැකි බවට උපකල්පනය කර, ඡන්දය ප්‍රකාශ කිරීම පෙ.ව. 7.00 සිට ප.ව 5.00 දක්වා අවස්ථාව ලබාදීමට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කරන ලදි.

තරඟකරන අපේක්ෂකයන් සඳහා ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීමේ පනතේ 117(1) වන වගන්තිය අනුව, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව හා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මඟින් නොමිලයේ ප්‍රචාරණ පහසුකම් ලබාදෙන ලද අතර, තරඟකරන අපේක්ෂකයන් 35 දෙනා වෙනුවෙන් එලෙස ලබාදෙන ලද මුළු ප්‍රචාරක කාලසීමාව පැය 28 කුත් විනාඩි 30 ක් විය.

ඡන්ද විමසීම සහ ගණන්කිරීමේ කාර්යය සඳහා රජයේ දෙපාර්තමේන්තු / ආයතනවල සේවයේ නියුතු නියමිත සුදුසුකම් සපුරන ලද රාජ්‍ය නිලධාරීන් 220,438 ක ප්‍රමාණයක් යොදවනු ලැබිය. ඡන්ද මධ්‍යස්ථාන 12845 කදී ඡන්ද විමසීම පැවැත්වූ අතර ඡන්ද ගණන් කිරීම, ගණන් කිරීමේ මධ්‍යස්ථාන 1419 කදී සිදුකරන ලද අතර, එම සංඛ්‍යාවෙන් 304 ක් තැපැල් ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන විය.

ඡන්ද විමසීමේ සහ ඡන්ද ගණන් කිරීමේ කටයුතු නිරීක්ෂණය සඳහා දේශීය/ විදේශීය නිරීක්ෂණ ආයතන සඳහා අවස්ථාව සලසා දෙන ලදී. දේශීය නිරීක්ෂණ සංවිධාන අතරින් නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය (PAFFREL) හා මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයට (CMEV) ඡන්ද පොළ අවට මෙන්ම ඡන්ද පොළ තුළ ද නිරීක්ෂකයන් රඳවා තබමින් නිරීක්ෂණ කටයුතු කිරීමට අවසර ලබා දුන් අතර, දේශීය නිරීක්ෂණ සංවිධාන හතරකට ඡන්ද පොළින් පිටත සිට නිරීක්ෂණ කටයුතු කිරීමට අවස්ථාව සලසන ලදී.එහෙත් ජනාධිපතිවරණයේ දී තේරීම්භාර නිලධාරී කාර්යාලවලදී ඡන්ද ගණන් කිරීමේ කටයුතු මෙන්ම, ප්‍රතිඵල වගුගත කිරීමේ කටයුතු නිරීක්ෂණයට ද ඉහත නිරීක්ෂණ සංවිධානවලට ඉඩසලසන ලදි. ඊට පරිබාහිරව මැතිවරණ මහලේකම් කාර්යාලයේ අවසන් ප්‍රතිඵලය සකස් කිරීමේ කටයුතු නිරීක්ෂණයටද නිරීක්ෂණ සංවිධානවලට මෙන්ම දේශපාලන පක්ෂ වලට අවස්ථාව ලබාදෙන ලදි.

විදේශීය නිරීක්ෂණ සංවිධාන වශයෙන්, පොදුරාජ්‍ය මණ්ඩලය,යුරෝපා සංගමය,ANFREL සහ දකුණු ආසියාතික මැතිවරණ බලධාරීන්ගේ සංගමය (FEMBoSA) යන සංවිධානවල නිරීක්ෂකයන් සෘජුවම මැතිවරණ කොමිෂන් සභාවේ සම්බන්ධීකරණයෙන් සහභාගී විය.

ඡන්ද විමසීමට සහ ඡන්ද ගණන්කිරීමට අදාළව දේශපාලන පක්ෂ / අපේක්ෂකයන් තුළ පැවති සැක සංකා දුරුකිරීමේ පියවර රැසක් දේශපාලන පක්ෂ ලේකම්වරුන් / අපේක්ෂකයන් දැනුවත් කරමින් ක්‍රියාත්මක කළ අතර, ඡන්ද ගණන්කිරීමේ කටයුතු හා ප්‍රතිඵල වගුගතකිරීමේ කටයුතු නිරීක්ෂණය සඳහා මෙයට පෙර මැතිවරණවලදී දිස්ත්‍රික්කය තුළදී පමණක් අවස්ථාව සලසන ලද නමුත්, මෙම ජනාධිපතිවරණයේදී අවසන් සමස්ථ ප්‍රතිඵලය සකස්කරන ලද මැතිවරණ මහලේකම් කාර්යාලයේ ප්‍රතිඵල වගුගතකිරීමේ කටයුතු නිරීක්ෂණය සඳහාද දේශපාලන පක්ෂ ලේකම්වරුන්ට / නියෝජිතයන්ට මෙන්ම තෝරාගනු ලැබූ නිරීක්ෂණ සංවිධාන වලටද අවස්ථාව සලසන ලදී. ගණන් කිරීමේ මධ්‍යස්ථාන වලට අවශ්‍ය ආරක්ෂාව සඳහා පොලිසිය යොදවන ලදී.

ඡන්ද විමසීම සඳහා අවශ්‍ය බඩුබාහිරාදිය සහ නිලධාරීන් ඡන්ද මධ්‍යස්ථාන වෙත පිටත්කර යැවීම 2019.11.15 දින සිදුකරන ලද අතර, ඊටපසු දින එනම්, 2019.11.16 දින ඡන්ද විමසීම අවසන් කොට ඡන්ද පෙට්ටි සියල්ල ගණන්කිරීමේ මධ්‍යස්ථාන වෙත ලැබීමෙන් පසුව මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් පරිදි ඡන්ද ගණන්කිරීමට අදාළ කටයුතු සිදුකොට ප්‍රතිඵලය මැතිවරණ කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම තේරීම්භාර නිලධාරීන්ගේ වගකීම විය. එලෙස තේරීම්භාර නිලධාරීන්ගෙන් ලැබෙන ඡන්ද ගණන්කිරීමේ ශාලා මට්ටමේ ප්‍රතිඵලය තුළින් දිස්ත්‍රික්කයේ ඡන්ද ප්‍රදේශ හා දිස්ත්‍රික් ප්‍රතිඵලය සැකසීම මැතිවරණ මහලේකම් කාර්යාලයේදී සිදුකරන ලදී. ඒ ආකාරයෙන්ම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ද ඡන්ද ප්‍රදේශ මට්ටමේ සහ දිස්ත්‍රික් මට්ටමේ ප්‍රතිඵලය සකස්කර මැතිවරණ කොමිෂන් සභාව වෙත එවන ලදී. මෙම ජනාධිපතිවරණයේදී මැතිවරණ මහලේකම් කාර්යාලයේදී ප්‍රතිඵල වගුගතකිරීම, මාණ්ඩලික නිලධාරීන්ගෙන් සමන්විත කණ්ඩායමක් විසින් ප්‍රතිඵලය අතින් සැකසීම, මෙම ජානාධිපතිවරණයට අදාළව ජාතික තොරතුරු තාක්ෂණ නියෝජිතායතනය (ICTA), කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යනාංශය හා ලංකා මෘදුකාංග පදනම මෙන්ම ස්වේච්ඡා පරිගණක තාක්ෂණවේදීන්ගේ සහයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ පරිගණක අංශය විසින් නිර්මාණය කරන ලද විශේෂ පරිගණක වැඩසටහන මගින් ප්‍රතිඵල සැකසීමට අමතරව, දිස්ත්‍රික්ක මගින් ප්‍රතිඵල ලේඛන පරිලෝකණය කර, ගෙන්වා ගැනීමෙන් අනතුරුව මැතිවරණ මහලේකම් කාර්යාලයේ පරිගණක අංශයෙන්ද ප්‍රතිඵල වගුගත කිරීම තුන් ආකාරයකින් සිදු කරන ලදී. ඒ අනුව මැතිවරණ මහලේකම් කාර්යාලයේ අංශ තුනකින් පිළියෙල කරන ලද ප්‍රතිඵල ලේඛන හා දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් එවන ලද අවසන් ප්‍රතිඵලය පරීක්ෂා

කරමින්, එම සිව් ආකාරයේ ප්‍රතිඵලය සමානවේ නම් පමණක් ඒ ඒ ඡන්ද ප්‍රදේශ හා මැතිවරණ කොට්ඨාස මට්ටමෙන් ප්‍රතිඵල ප්‍රකාශයට පත්කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව, දිස්ත්‍රික් ත්‍රේරීම්භාර නිලධාරි විසින් දිස්ත්‍රික් මට්ටමේදී ඡන්ද ප්‍රදේශ හා දිස්ත්‍රික් අවසන් ප්‍රතිඵලය මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය ලද පසු ප්‍රචාරණය කරනු ලැබූ අතර, ප්‍රතිඵල නිවැරදි බවට තහවුරු කරගැනීමෙන් පසු මැතිවරණ කොමිෂන් සභාව විසින් ප්‍රතිඵලය රූපවාහිනී හා ගුවන්විදුලි මාධ්‍ය මඟින් ප්‍රචාරය කිරීමට කටයුතු කරන ලදී.

ඉහත කී ආකාරයෙන් මැතිවරණ කොට්ඨාශ 22 කට අදාළ ප්‍රතිඵල ලේඛන ලැබීමෙන් පසුව එක් එක් අපේක්ෂකයාගේ වාසියට දී ඇති ඡන්ද සංඛ්‍යාව මැතිවරණ කොමිෂන් සභාව විසින් ගණන් බලා, ජනාධිපතිවරයා ලෙස ත්‍රේරීපත්වන අපේක්ෂකයා කවුරුන්ද යන්න මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් ප්‍රකාශ කළ යුතු විය. ඒ අනුව අපේක්ෂක ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපතිවරණයේ දී දෙන ලද මුළු ඡන්ද සංඛ්‍යාව වූ 13,338,951 න් හරි අඩක් වූ 6,693,976 යන සංඛ්‍යාව ඉක්මවා ඡන්ද 230279 ක් ද සමඟ මුළු ඡන්ද 6,924,255 ක් ලබාගෙන තිබූ බැවින්, 2019 ජනාධිපතිවරණයට අදාළවද මනාප ගණන්කිරීමේ අවශ්‍යතාවක් නොවීය. 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීම පිළිබඳ පනතේ 64(2) වගන්තිය අනුව, ජනාධිපතිධුර අපේක්ෂක ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපතිවරයා ලෙස තෝරාපත්කර ගනු ලැබූ බව 2019.11.17 දින මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති විසින් මැතිවරණ මහලේකම් කාර්යාලයේදී ප්‍රකාශ කරන ලදී. අපේක්ෂක ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපතිවරයා ලෙස තෝරාපත්කරගත් බවට වූ නිවේදනය 2019.11.17 දින අංක 2149/34 දරන අතිවිශේෂ ගැසට් ප්‍රකාශයේ පළ කරන ලදී. එක් එක් අපේක්ෂකයා ලබාගත් ඡන්ද සංඛ්‍යාව පිළිබඳ විස්තර ***අංක II දරන සටහනෙහි*** දක්වා ඇති අතර ඡන්ද ප්‍රදේශ අනුව ප්‍රතිඵල ***අංක III දරන සටහනෙහි*** දක්වා ඇත.

6. නිවේදිත ඡන්ද කාර්යාල පිහිටුවීම

2019 නොවැම්බර් මස 16 වන දින පැවැති ජනාධිපතිවරණයේ දී අපේක්ෂිත ප්‍රචාරක කටයුතු සඳහා නිවේදිත ඡන්ද කාර්යාල යන්න පිළිබඳව සැලකිමේදී නිවේදිත යනුවෙන් අදහස් කරන්නේ, අදාළ දිස්ත්‍රික්කයේ ත්‍රේරීම්භාර නිලධාරිට හා කාර්යාලය පිහිටුවනු ලබන පොලිස් බල ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපතිට දැනුම් දීම වන අතර ඡන්ද කාර්යාල පිහිටුවීම සඳහා නියම කරනු ලබන කොන්දේසිවලට එකඟව පිහිටුවනු ලබන කාර්යාල අවසරලත් නිවේදිත කාර්යාල වේ.මෙහිදී පළාත් පාලන ඡන්ද විමසීම් අංශය ප්‍රධාන වශයෙන් සිදුකලයුතු වූයේ නිවේදිත ඡන්ද කාර්යාල වර්ග, ඒ ඒ නිවේදිත ඡන්ද කාර්යාල වලට අදාල නෛතික තත්වය පහදා දීමත්, නිවේදිත ඡන්ද කාර්යාල පිහිටුවීමට අදාල උපදෙස් හා ඉල්ලුම් පත්‍ර සියලුම ජනාධිපති ධුර අපේක්ෂකයන් ඇතුළු ඡන්ද නියෝජිත හා බලයලත් නියෝජිතයන් වෙත ලබා දීම වැනි කරුණුය. මේ සම්බන්ධයෙන් සියලුම උපදෙස් අඩංගු ලිපියක් 2019.09.29 දිනැතිව මැතිවරණ කොමිෂන් සභාව සියලුම ජනාධිපති ධුර අපේක්ෂකයන් ඇතුළු ඡන්ද නියෝජිත හා බලයලත් නියෝජිතයන් වෙත නිකුත් කරන ලදී.

1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 73 වගන්තිය යටතේ පවත්වාගෙන යා හැකි ඡන්ද කාර්යාල සම්බන්ධයෙන් වූ විධි විධාන අනුව පවත්වාගෙන යා හැකි මැතිවරණ ප්‍රචාරක කාර්යාල වර්ග හතරක් (4) පමණක් වන අතර, එවැනි කාර්යාල පිහිටුවීමට බලය ඇති අය, කාර්යාල පවත්වාගෙන යා හැකි කාලය, කාර්යාල පිහිටුවිය හැකි බල ප්‍රදේශය, පිහිටුවිය හැකි කාර්යාල ගණන පහත වගුවේ දැක්වෙන අතර එක් එක් කාර්යාල වර්ගය පිහිටුවීමට අවසර ලබා ගැනීමට අවශ්‍ය අයදුම් පත්‍ර හඳුනාගැනීමේ පහසුව තකා දකුණු පස කෙළවර තීරුවේ අඩංගු වර්ණ සහිත කඩදාසි වල මුද්‍රණය කරනු ලැබිණි. එමඟින් කාර්යාලයට අදාල නිවැරදි ඉල්ලුම් පත්‍රය නොපිරවීම නිසා ඇතිවන දෝෂය අවම කරගත හැකි වූ අතර අනෙක් අතට කාර්යාල වර්ගීකරණය අනුව සංඛ්‍යාත්මක අගයන් විමසීමේ දී එය කාර්යක්ෂමව සිදුකිරීමට මෙලස වෙනස් වර්ණයන්ගෙන් යුතු කඩදාසි වල මුද්‍රණය හේතු විය.

පිහිටුවිය හැකි කාර්යාල වර්ගය	කාර්යාල පිහිටුවීමට බලය ඇති අය	කාර්යාල පවත්වාගෙන යා හැකි කාලය	කාර්යාල පිහිටුවිය හැකි බල ප්‍රදේශය	පිහිටුවිය හැකි කාර්යාල ගණන	අයදුම් පත්‍රයේ වර්ණය
නිවේදිත මධ්‍ය ඡන්ද කාර්යාල	අපේක්ෂක/ ඡන්ද නියෝජිත/ බලයලත් නියෝජිත	2019.10.07 දින සිට 2019.11.17 දින මධ්‍යම රාත්‍රිය දක්වා	මැතිවරණ කොට්ඨාස බල ප්‍රදේශය	එක් කාර්යාලයක් පමණි	ලා රෝස
නිවේදිත ශාඛා ඡන්ද කාර්යාල (i)	අපේක්ෂක/ ඡන්ද නියෝජිත/ බලයලත් නියෝජිත/ ප්‍රාදේශීය නියෝජිත	2019.10.07 දින සිට 2019.11.14 දින මධ්‍යම රාත්‍රිය දක්වා	එක් එක් ඡන්ද කොට්ඨාසය	ඡන්ද කොට්ඨාසය කට එකක් බැගින්	සුදු
නිවේදිත ශාඛා ඡන්ද කාර්යාල (ii)	අපේක්ෂක/ ඡන්ද නියෝජිත/ බලයලත් නියෝජිත/ ප්‍රාදේශීය නියෝජිත	2019.11.15 දින සිට 2019.11.17 දින මධ්‍යම රාත්‍රිය දක්වා	එක් එක් ඡන්ද ප්‍රදේශය	ඡන්ද ප්‍රදේශයකට එකක් බැගින්	කහ
සාමාන්‍ය පදිංචි නිවස, කාර්යාලය ලෙස	අපේක්ෂක/ බලයලත් නියෝජිත	2019.10.07 දින සිට 2019.11.17 දින මධ්‍යම රාත්‍රිය දක්වා	මැතිවරණ කොට්ඨාස බල ප්‍රදේශය	එක් කාර්යාලයක් පමණි	ලා දම්

මීට අමතරව එම ලිපියේ කරුණු පැහැදිලි කිරීම යටතේ **මැතිවරණ කොට්ඨාස, ඡන්ද ප්‍රදේශ හා ඡන්ද කොට්ඨාස යන භූමි ප්‍රදේශ සහ ඡන්ද නියෝජිත, බලයලත් නියෝජිත හා ප්‍රාදේශීය නියෝජිත** යන තනතුරු මොනවාද යන්න පිළිබඳව පැහැදිලිව විස්තර කිරීමක් සිදු කරන ලද අතර එමඟින් මැතිවරණ කටයුතු හා අදාලව යෙදෙන මෙම වචන භාවිතයන් නුහුරු නිසා සිදුවන දෝෂයන් අවම කර ගැනීමට හැකිවිණි.

තව ද මෙම උපදෙස් ලිපිය හරහා නිවේදිත කාර්යාලවල ප්‍රචාරක පුවරු, ධජ, අපේක්ෂකයාගේ ඡායාරූපය වැනි දෑ ප්‍රදර්ශනය කිරීමේ දී අනුගමනය කළ යුතු පියවර පිළිබඳ දැනුම් දෙනු ලැබූ අතර මෙමඟින් මැතිවරණ සමයකදී බහුලව සිදුකෙරෙන මැතිවරණ නීති උල්ලංඝණයක් වන නීති විරෝධී ප්‍රචාරක කටයුතු පිළිබඳ පැමිණිලි නිවේදිත කාර්යාල සම්බන්ධයෙන් අවම කර ගැනීමට බලාපොරොත්තු විණි. තව ද බලයේ සිටින කණ්ඩායම විසින් රජයට අයත් භූමි ප්‍රදේශ, ආයතන වැනි පොදු ස්ථාන මැතිවරණ ප්‍රචාරක කටයුතු වලට අයුතුව යොදාගැනීම වැලක්වීම සඳහා රජය/ පළාත් සභා/ පළාත් පාලන ආයතන/ රාජ්‍ය සංස්ථා හෝ මණ්ඩල සතු ගොඩනැගිල්ලක, ඉඩමක, නිල නිවසක, රක්ෂිතයක පෙර කී කිසිදු කාර්යාලයක් ස්ථාපිත කල නොහැකි බව දන්වන ලද අතර රජය සතු ජනපද නිවාසයක හෝ රජය සතු නිවාස සංකීර්ණයක වූ නිවාසයක නිසි අවසරය සහිතව පදිංචි වී සිටින අපේක්ෂකයකුට ස්වකීය නිවසේ කාර්යාලයක් ප්‍රචාරක කාර්යාලයක ලෙස භාවිතා කිරීමේ හැකියාව පිළිබඳව ද,නිවේදිත කාර්යාලයකට යාබද විදුලි කණු, මහාමාර්ග, පදික වේදිකා, මායිම් තාප්ප ආදිය ප්‍රචාරණ කටයුතු සඳහා යොදාගැනීම පිළිබඳව, යම්කිසි අපේක්ෂකයකුගේ කාර්යාලයක වෙනත් අපේක්ෂකයකු ප්‍රවර්ධනය වන අයුරින් හෝ අගතියක් වන අයුරින් ප්‍රචාරක කටයුතු කිරීම වැනි නීති විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් මෙමඟින් පැහැදිලි කල අතර නීති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් නෛතික ක්‍රියා මාර්ග ගන්නා බවට ද අදාල පාර්ශව දැනුවත් කෙරුණි.

සෘජුවම ඡන්ද විමසීම හා සම්බන්ධ රාජ්‍ය ආයතනයක් ආසන්නයේ නිවේදිත ඡන්ද කාර්යාලයක් පිහිටුවීමේ දී අනුගමනය කළ යුතු නියමිත දුර ප්‍රමාණයන් සඳහන් කිරීමෙන් එක් පක්ෂයකට කණ්ඩායමකට වාසි සහගත තත්වයක් අතිවීම හැකිතාක් අවම කිරීමටත්, රජයේ පාසල්, රෝහල්, අධිකරණ සංකීර්ණ, පළාත් පාලන ආයතන, තැපැල් කාර්යාල වැනි පොදු මහජනතාව නිරතුරුව සේවා ලබාගැනීමට පැමිණෙන රාජ්‍ය ආයතනවලට පැමිණෙන මහජනතාවට බාධාවන සේ එකී ආයතන ආසන්නයේම හෝ අධ්‍යාපන කටයුතුවල නිරත වන දරුවන්ට බාධා වන සේ රජයේ පාසල් ආසන්නයේම ඡන්ද කාර්යාල පිහිටුවීමෙන් වැලකී සිටින ලෙස ස්වකීය ප්‍රාදේශීය නියෝජිතයන්, ක්‍රියාකාරී ආධාරකරුවන් දැනුවත් කරන ලෙස සියලුම අපේක්ෂකයන්ගෙන්/ ඡන්ද නියෝජිතයන්/ බලයලත් නියෝජිතයන්ගෙන් හා පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන්ගෙන් ඉල්ලා සිටීම මඟින් පොදු මහජනතාවට සිදුවන බාධා අවහිරතා අවම කරගැනීමටත් බලාපොරොත්තු වූ අතර මෙම නීති හා ඉල්ලීම් පැනවීමේ ඒකායන අරමුණ වූයේ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් යන අවධාරිත මූලික කරුණ ආරක්ෂා කර ගැනීමය.

7. මැතිවරණ ආරවුල් කළමනාකරණය

ජාතික මැතිවරණ පැමිණිලි කළමනාකරණ මධ්‍යස්ථානය මෙහෙයවීම හා සම්බන්ධීකරණය, පැමිණිලි හා විමසීම් භාරගැනීම අවශ්‍ය උපදෙස් ලබාදීම හෝ ,අදාල අංශ වෙත යොමු කිරීම, දිස්ත්‍රික් මැතිවරණ පැමිණිලි මධ්‍යස්ථාන සහ ප්‍රාදේශීය මැතිවරණ පැමිණිලි මධ්‍යස්ථාන සමඟ සම්බන්ධීකරණය, ශ්‍රී ලංකා පොලීසිය, පොලිස් මැතිවරණ පැමිණිලි කළමනාකරණ ඒකකය සමඟ සම්බන්ධීකරණය, පැමිණිලි කළමනාකරණ පරිගණක වැඩසටහන පවත්වාගෙන යාම, දෛනික සාරාංශ වාර්තා සැකසීම හා මාධ්‍ය වෙත නිකුත් කිරීම, ජනාධිපතිවරණයට අදාල චක්‍රලේඛ X සහ ගැසට් නිවේදන නිකුත් කිරීමේ කාර්යයන් සිදුකරන ලදි.

8. පශ්චාත් මැතිවරණ රාජකාරි කටයුතු ඉටුකිරීම

- 2019 ජනාධිපතිවරණයට අදාල විමර්ශන කටයුතු සිදුවෙමින් පවතින පැමිණිලි සම්බන්ධ කටයුතු
- පැමිණිලි හා විමසීම් සාරාංශ වාර්තා සකස් කිරීම
- අවසන් වාර්තාව සකස් කිරීම
- පැමිණිලි සම්බන්ධ පශ්චාත් විමර්ශන සම්බන්ධයෙන් කටයුතු කිරීම
- ජනාධිපතිවරණයට අදාල පැමිණිලි සම්බන්ධයෙන් ඉදිරි නීතීමය පියවර ගැනීමට නියමිත හා නීතීමය කටයුතු ආරම්භ කර ඇති පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම
- පාර්ලිමේන්තු මැතිවරණ පනතට අනුව මැතිවරණ පැවැත්වීම සහ පුරප්පාඩු පිරවීම.
- පළාත් පාලන ඡන්ද විමසීම් පනතට අනුව මැතිවරණ පැවැත්වීම සහ පුරප්පාඩු පිරවීම.

9. 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත

2019 වර්ෂය තුළ පාර්ලිමේන්තු මන්ත්‍රීධුර පුරප්පාඩු 05ක් පිරවීම සඳහා ක්‍රියා කර ඇත. ඒ පිළිබඳව තොරතුරු ***අංක IV දරන සටහනෙහි*** ඇතුළත් කර ඇත.

10. 2017 අංක 17 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත

2019 වර්ෂය තුළ පළාත් සභා සභිකධූර 01 ක පුරප්පාඩු පිරවීමට ක්‍රියාකර ඇත. ඒ පිළිබඳ තොරතුරු ***අංක V දරන සටහනෙහි*** ඇතුලත් කර ඇත.

11. පළාත් සභා ඡන්ද විමසීම ප්‍රමාද වීම.

1988 අංක 02 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත සංශෝධනය කරමින් 2017 අංක 17 දරන පළාත් සභා ඡන්ද විමසීම් සංශෝධන පනත ව්‍යවස්ථාදායකය විසින් සම්මත කිරීමෙන් පසු එකී සංශෝධන පනත ප්‍රකාරව පළාත්වල සීමා නිර්ණය සඳහා "සීමා නිර්ණය කමිටුවක්" පත් කළ යුතු වූ අතර එම සීමා නිර්ණය කමිටුව 2017 ඔක්තෝම්බර් මස පත් කරනු ලැබීමෙන් පසු එම වාර්තාව නියමිත කාලය වූ මාස හතරක කාලයක් තුළ 2018 පෙබරවාරි මස ලබා දෙන ලදී. එම සීමා නිර්ණය කොමිෂන් වාර්තාව නොපමාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වූ නමුත් එසේ කිරීම 2018 අගෝස්තු දක්වා ප්‍රමාද විය. එසේ ඉදිරිපත් කළ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සම්මත නොකිරීම හේතුවෙන් පනතේ විධිවිධාන ප්‍රකාරව එම වාර්තාව සමාලෝචනය සඳහා අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත සමාලෝචන කමිටුවක් කථානායකවරයා විසින් 2018 අගෝස්තු 28 දින පත් කරන ලදී. එම සමාලෝචන කමිටුව මාස දෙකක් තුළ සමාලෝචන කටයුතු නිමකර අදාළ වාර්තාව ගරු ජනාධිපතිවරයා වෙත භාර දිය යුතුව තිබුණද එම කමිටුව කිසිම සමාලෝචනයක් සිදුකර නොමැති බැවින් ඒ පිළිබඳව තව දුරටත් ක්‍රියා කිරීමට ප්‍රතිපාදන සලසා නොමැත.

මේ නිසා 1988 අංක 02 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත ප්‍රකාරව පැරණි ක්‍රමයට ඡන්ද විමසීම පැවැත්වීමට 2018 ඔක්තෝම්බර් මස 28 සහ දෙසැම්බර් මස 10 දක්වා කාලය තුළ පැවති ආණ්ඩුව විසින් අමාත්‍ය මණ්ඩල තීරණයක්ද ගන්නා ලදී . එසේම ගරු ජනාධිපතිවරයා විසින්ද 1988 අංක 02 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත ප්‍රකාරව (පැරණි ක්‍රමයට) ඡන්ද විමසීම පවත්වන ලෙසට ඉල්ලීමක් කරමින් අමාත්‍ය මණ්ඩලය වෙත 2019 ජනවාරි මස 29 වන දින අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී.

මැතිවරණ කොමිෂන් සභාව විසින් පළාත් සභා ඡන්ද විමසීම කඩිනමින් පැවැත්වීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙසට නොයෙක් වර ගරු ජනාධිපතිවරයා, ගරු අග්‍රාමාත්‍යවරයා, ගරු කථානායකවරයා, ගරු විපක්ෂ නායකවරයා සහ පිළිගත් දේශපාලන පක්ෂ නායකයින් අමතමින් නිරතුරුවම ඉල්ලීම් කරනු ලැබීය.

දිවයිනේ මේ වන විට සියලුම පළාත් සභාවල නිල කාලය මතු දැක්වෙන දිනවලදී අවසන් වී ඇති නමුත් පාර්ලිමේන්තුව විසින් 2017 අංක 17 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් පළාත් සභා ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා පැවති ඡන්ද ක්‍රමය වෙනස් කර තිබීම නිසා ඡන්ද විමසීම් දිනෙන් දින කල් යන ලදී.

පළාත	පළාත් සභාවේ නිල කාලය අවසන් වූ දිනය
නැගෙනහිර	2017.09.30
සබරගමුව	2017.09.26
උතුරු මැද	2017.10.01
මධ්‍යම	2017.10.08
වයඹ	2018.10.10
උතුර	2018.10.24
දකුණ	2019.04.10
බස්නාහිර	2019.04.21
ඌව	2019.10.08

පළාත් සභා ඡන්ද විමසීම පැවැත්වීමට නම් අදාළ සංශෝධන, පනතේ විධිවිධාන අනුව පළාත් සභා මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කර, එම වාර්තා පාර්ලිමේන්තුවේ 2/3 විශේෂ බහුතරයකින් අනුමත කර ගරු ජනාධිපතිවරයා විසින් එම කොට්ඨාසවල නම්, අංක සහ මායිම් යනාදිය ගැසට් මගින් ප්‍රකාශයට පත් කළ යුතුව තිබේ. එමෙන්ම පාර්ලිමේන්තුවේ විශේෂ බහුතරයකින් අනුමත නොකළේ නම් ගරු කථානායකවරයා විසින් පත් කරනු ලබන, ගරු අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් යුතු පංච පුද්ගල

සමාලෝචන කමිටුවක් විසින් එකී වාර්තා සමාලෝචනය කර, එම සමාලෝචිත සීමා නිර්ණය වාර්තාව ගරු ජනාධිපතිවරයා විසින් ප්‍රසිද්ධියට පත් කළ යුතුව ඇත.

ඉහත කරුණු සඳහා 2017 අංක 17 පනතින් කාල සීමා නියම කර ඇති අතර මෙම පනතට අදාළව පාර්ලිමේන්තුවේ විවාද කෙරෙන විටදී පළාත් සභා ඡන්ද විමසීම් පැවැත්වීම කල්යාමකින් තොරව පැවැත්වීමට ක්‍රියා කරන බව ප්‍රකාශ වී ඇතත් මෙම පනතට එරෙහිව පැවති පෙත්සම්වලදී රජය වෙනුවෙන් ප්‍රකාශ කර ඇත්තේ පනතේ විධිවිධාන නියමිත කාල රාමුවක් තුළ ක්‍රියාත්මක වන හෙයින් ඡන්ද විමසීම් පැවැත්වීම කල් නොයනු ඇති බවයි.

මැතිවරණ කොමිෂන් සභාව දිගින් දිගටම මේ සම්බන්ධයෙන් කරුණු දැක්වීම නිසා සහ නීතිපතිවරයා ද මේ අයුරින් මේ කාර්යය ප්‍රමාද වීම අනීතික බව පෙන්වා දීම නිසා මාස 04 කට වඩා වැඩි කාලයක් ප්‍රමාද වී එම වාර්තාව 2018 අගෝස්තු 24 වන දින පාර්ලිමේන්තුවේ දී විවාද කරනු ලදුව 2/3 විශේෂ බහුතරයකින් අනුමත වීම වෙනුවට කිසිදු මන්ත්‍රීවරයකු පක්ෂව ඡන්ද නොදීමෙන් ද මන්ත්‍රීවරු 130 කට වැඩි ප්‍රමාණයක් එයට එරෙහිව ඡන්දය දීමෙන් ද එකී වාර්තාව පාර්ලිමේන්තුව විසින් ප්‍රතික්ෂේප කර ඇත.

ඉන් අනතුරුව පනතේ විධිවිධාන අනුව ගරු කතානායකවරයා විසින් ගරු අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් සීමා නිර්ණය වාර්තාව සමාලෝචනය කිරීම සඳහා පංච පුද්ගල සමාලෝචන කමිටුවක් 2018 අගෝස්තු 28 දින පත් කරනු ලැබූ අතර එම කමිටුව මාස 02 ක් ඇතුළත එනම් 2018 නොවැම්බර් මස 27 දින වන විට සමාලෝචන කටයුතු අවසන් කර සමාලෝචිත සීමා නිර්ණය වාර්තාව ගරු ජනාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු විය.

එසේ වුවත් මෙම සමාලෝචන කමිටුව පූර්වයෙන් සඳහන් සීමා නිර්ණය වාර්තාව සමාලෝචනය සඳහා නිසි පියවර ගෙන නැත. එම කමිටුව රැස්වී ඇත්තේ 2018 සැප්තැම්බර් 07 දින හා 20 පමණක් වන අතර ඔක්තෝම්බර් මස කිසිදු රැස්වීමක් පවත්වා නැත. පැවැත්වූ රැස්වීම්වලදී ද සමාලෝචනයක් සිදු කර නැති අතර සමාලෝචන වාර්තාවක් සැකසීමට ද පියවර ගෙන නැත. අවම වශයෙන් සංශෝධන රහිත බව සඳහන් වාර්තාවක් හෝ ඉදිරිපත් කර නැති බැවින් ගරු ජනාධිපතිවරයාට ‘‘පළාත් සභා මැතිවරණ කොට්ඨාස’’ පිළිබඳ වාර්තාවක් ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමේ හැකියාවක් නොමැති හෙයින්, 2017 අංක 17 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධිත) පනතින් හඳුන්වා දුන් මිශ්‍ර සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ ඡන්ද විමසීම් පැවැත්විය නොහැකිය. මක්නිසාද යත් 2017 අංක 17 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධිත) පනත අක්‍රිය නැතහොත් ක්‍රියාත්මක කළ නොහැකි තත්ත්වයට පත්ව ඇති හෙයිනි.

එබැවින් බොහෝ සෙයින් ප්‍රමාද වී ඇති පළාත් සභා ඡන්ද විමසීම් කඩිනමින් පැවැත්විය හැකි පහසුම ක්‍රියාමාර්ගය වන්නේ දැනට ක්‍රියාත්මක කළ නොහැකි තත්ත්වයකට පත්වී ඇති 2017 අංක 17 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධිත) පනත බලාත්මක කිරීම කල්දමා හෝ අවලංගු කර, 1988 අංක 2 දරන පළාත් සභා පනතේ පැවති ඡන්ද විමසීම් ක්‍රමය නැවත භාවිත කිරීමට පාර්ලිමේන්තුව හරහා නව පනතක් සම්මත කිරීම වන බැවින් මේ සඳහා කඩිනම් මූලික ක්‍රියාමාර්ග ගන්නා ලෙස හා පාර්ලිමේන්තුවේ දී එම පනත සම්මත කර ගැනීමේ දින වකවානු නියම කිරීමේ මාර්ග සිතියමක් සැකසීමට 2019 මාර්තු මස 03 වන සතිය වන විට දී වත් පියවර ගන්නා ලෙස මැතිවරණ කොමිෂන් සභාව විසින් ඉල්ලා සිටින ලදී.

ගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, ඇතුළු අමාත්‍ය මණ්ඩලය මේ සඳහා අවශ්‍ය නීති සම්පාදනයට නොපමාව පියවර ගනිමින් පාර්ලිමේන්තුව හරහා අදාළ පනත් සම්මත කර ගැනීමට පියවර ගත හොත් එම දිනයේ සිට සති හතක් ඇතුළත ඡන්ද විමසීම පැවැත්වීමට මැතිවරණ කොමිෂන් සභාවට හැකියාව ඇති බව අතිගරු ජනාධිපතිතුමන් වෙත මැතිවරණ කොමිෂන් සභාව විසින් නොයෙක්වර දන්වන ලදී.

ඒ සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ විශ්වාසය වූයේ මේ ඡන්ද විමසීම නොපමාව පැවැත්වීම වඩාත් පහසුම හා සුදුසුම ක්‍රමය වූ පාර්ලිමේන්තු පනතක් හරහා 2017 අංක 17 දරන පනතින් යෝජිත නව ක්‍රමය වෙනුවට පැරණි ක්‍රමය භාවිතා කිරීමේ ක්‍රමවේදයක් නීතිගත කිරීමේ ක්‍රියාමාර්ගයක් ගරු

ජනාධිපතිවරයා, ගරු අග්‍රාමාත්‍යවරයා හා අමාත්‍ය මණ්ඩලය හා පාර්ලිමේන්තුව එනම් පාර්ලිමේන්තුව නියෝජනය කරන දේශපාලන පක්ෂවල නායකයින් නොපමාව ගනු ඇති බවටයි. එහෙත් මේ සම්බන්ධයෙන් අධිකරණයට යාමට හෝ එයිනුත් ඔබ්බට ගොස් නාමයෝජනා දැන්වීම නිකුත් කිරීමට මැතිවරණ කොමිෂන් සභාව තීරණය නොකළ නමුත් එම විකල්ප යෝජනා පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාව අධ්‍යයනය කරන ලදී. එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ ව්‍යවස්ථාව ප්‍රකාරව ඡන්ද විමසීම පැවැත්වීම මැතිවරණ කොමිෂන් සභාවේ බලතල, කාර්යය හා කර්තව්‍යයන් වන බැවිනි.

පළාත් සභා ඡන්ද විමසීම් නියමිත වකවානුවේ නොපැවැත්වීම සම්බන්ධව මැතිවරණ කොමිෂන් සභාව ජනතාවගේ දෝෂ දර්ශනයට ලක් වී ඇති අතර, මැතිවරණ කොමිෂන් සභාව කෙරෙහි විශ්වාසය පළුදු වීමට ද එම කාරණය යම් ආකාරයකින් හේතු වීමේ අවධානමක් පැවතුණි. ප්‍රජාතන්ත්‍රීය ආයතන කෙරෙහි ජනතා විශ්වාසය ගිලිහී යාම ප්‍රජාතන්ත්‍ර විරෝධී, මානව විරෝධී ක්‍රියාකාරකම් සඳහා ජනතාව යොමු වීමට හේතු වන බව ද අපගේ ඉතිහාසය අපට පෙන්වා දී තිබේ.

එහෙයින් රජය හා ආණ්ඩුව ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය අයිතිය හා මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමෙන් වැළකී මේ ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා අවශ්‍ය මූලික ක්‍රියාමාර්ග කඩිනමින් ගනු ඇතැයි මැතිවරණ කොමිෂන් සභාව අපේක්ෂා කෙරේ.

12. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පැවැත්වීම.

12.1 ඇල්පිටිය ප්‍රාදේශීය සභා ඡන්ද විමසීම - 2019

පළාත් පාලන ආයතන 341 ක් සඳහා ඡන්ද විමසීම 2018.02.10 දින පැවැත්වීමට කටයුතු කර ඒ සඳහා නාමයෝජනා කැඳවන ලද අතර, ගාල්ල දිස්ත්‍රික්කයේ ඇල්පිටිය ප්‍රාදේශීය සභාව සඳහා ලබාදුන් නාමයෝජනා අතුරින් ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණ විසින් තම නාමයෝජනා පත්‍රය ප්‍රතික්ෂේප වීම හේතුවෙන් පවරන ලද නඩුවේ වාරන නියෝගය මත ඇල්පිටිය ප්‍රාදේශීය සභාව හැර අනෙක් පළාත් පාලන ආයතන 340 වෙනුවෙන් ඡන්ද විමසීම 2018.02.10 දින පවත්වන ලදී.

අනතුරුව, ඇල්පිටිය ප්‍රාදේශීය සභා ඡන්ද විමසීම වෙනුවෙන් ලබාදුන් අධිකරණ තීන්දුව මත මෙම ඡන්ද විමසීම පැවැත්වීම සඳහා නව දිනයක් නියම කරන ලෙසට තේරීම්භාර නිලධාරී වෙත දැන්වීමෙන් පසුව තේරීම්භාර නිලධාරී විසින් එම දිනය 2019.10.11 දිනය ලෙසට ප්‍රකාශ කරන ලද අතර, මැතිවරණ කොමිෂන් සභාවේ 2/3 ක ඡන්දයෙන් එම දිනය සම්මත කරගන්නා ලදී. ඒ අනුව, ඇල්පිටිය ප්‍රාදේශීය සභාව සඳහා 2019.10.11 දින ඡන්ද විමසීම පැවැත්වීමට තීරණය විය.

ඇල්පිටිය ප්‍රාදේශීය සභාව සඳහා කොට්ඨාස 17 ක් වෙනුවෙන් අපේක්ෂකයන් 17 දෙනෙකු ද, අතිරේක ලැයිස්තුවෙන් අපේක්ෂකයන් 14 ක් ද, වශයෙන් දේශපාලන පක්ෂ 5 ක් තුලින් අපේක්ෂකයන් 155 ක් තරග කරන ලදී.

මෙම ඡන්ද විමසීම ඡන්ද මධ්‍යස්ථාන 47 කදී ද, ගණන් කිරීමේ මධ්‍යස්ථාන 47 කදී ද පවත්වන ලද අතර ඡන්ද දායකයන් 53384 ක් ලියාපදිංචි ඡන්ද දායකයන් ලෙස සටහන් විය. ඉන් 42100 ක් ඡන්දය ප්‍රකාශ කරන ලද අතර එය සමස්ථයක් ලෙස 78.9% ක ප්‍රතිශතයක් ගන්නා ලදී.

ඇල්පිටිය ප්‍රාදේශීය සභාව සඳහා තරග කරන ලද පක්ෂ අතුරින් ලබාගත් ඡන්ද සංඛ්‍යාව අනුව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සහික ධුර 17 ක් ද, එක්සත් ජාතික පක්ෂය සඳහා සහික ධුර 7 ක් ද, එක්සත් ජනතා නිදහස් සන්ධානය සඳහා සහික ධුර 3 ක් ද, ජනතා විමුක්ති පෙරමුණ සඳහා සහික ධුර 2 ක් ද, යනාදී වශයෙන් හිමිකර ගන්නා ලද අතර, සමස්ථ සභාවේ මන්ත්‍රී ආසන 50% කට වැඩි ප්‍රතිශතයක් හිමි වීම මත ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂය විසින් සභාපති සහ උප සභාපති පත් කිරීමේ අවස්ථාව හිමි කර ගන්නා ලදි. ඒ අනුව අංක 2147/28 හා 2019.10.30 දිනැති ගැසට් නිවේදනයෙන් සහ අංක 2152/62 හා 2019.12.06 දිනැති අතිවිශෙෂ ගැසට් නිවේදන මගින් සහික ධුර ප්‍රසිද්ධියට පත්කරන ලද අතර අංක

2153/9 හා 2019.12.10 දිනැති ගැසට් නිවේදනයෙන් සභාපති හා උපසභාපති ධුර සම්බන්ධයෙන් ප්‍රසිද්ධියට පත්කර ඇත.

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද අංක 2151/ 23 හා 2019.11.26 දිනැති ගැසට් නිවේදනය මගින් ඇල්පිටිය සභාවේ ධුර කාලය 2019 නොවැම්බර් මස 05 වන දින සිට ආරම්භ වියයුතු බව දන්වා ඇත.

12.2 දිවයිනේ සියලුම පළාත් පාලන ආයතන මහජන නියෝජිතයන් විසින් පාලනය කිරීම.

දීර්ඝ කාලයක් තිස්සේ දිවයිනේ ක්‍රියාත්මක වූ මහානගර සභා, නගර සභා, සුළු නගර සභා හා ගම් සභා යන පළාත් පාලන ආයතනවල කොට්ඨාස නියෝජනය සඳහා මහජන නියෝජිතයන් තෝරා ගැනීමේ ඡන්ද විමසීම් 1969 /1970 කාලසීමාවෙන් පසු පවත්වා නැති අතර, එම ඡන්ද ක්‍රමය යටතේ අවසන් අතුරු ඡන්ද විමසීම 1971 මාර්තු මස (කොළඹ මහ නගර සභාව - සුදුවැල්ල කොට්ඨාසය) පවත්වා තිබුණි. 1971 අප්‍රේල් රාජ්‍ය විරෝධි කැරැල්ල හේතුවෙන් දිවයින පුරා හදිසි නීතිය බලාත්මක වූ බැවින්, 1970 - 1977 කාලය තුළ එම පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පැවැත්වීමේ හැකියාවක් නොවූ අතර, 1970 දශකයේ මැද භාගය වන විට, එම කාලසීමාව තුළ නිල කාලය දීර්ඝ නොකළ පළාත් පාලන ආයතන හැර, දිවයිනේ පළාත් පාලන ආයතන රැසක් පාලනය වූයේ රාජ්‍ය නිලධාරීන් විසිනි.

1977 බලයට පත්වූ ආණ්ඩුව විසින් පළාත් පාලනය සඳහා හඳුන්වා දුන් දිස්ත්‍රික් සංවර්ධන සභා පිහිටුවීමත් සමඟ ගම් සභා හා සුළු නගර සභාවල පැවැත්ම අහෝසි වූ අතර, දිස්ත්‍රික් සංවර්ධන සභා ඡන්ද විමසීම 1981 වර්ෂයේදී පවත්වන ලදී. එම කාලසීමාවේදී, 1979 හා 1983 වර්ෂවලදී මහනගර සභා හා නගරසභා ඡන්ද විමසීම පවත්වා, එකී සභා සඳහා මහජන නියෝජිතයන් පත්කර ගන්නා ලදී.

1987 අප්‍රේල් 15 දින දිස්ත්‍රික් සංවර්ධන සභා අහෝසි කරන ලද අතර, මහනගර සභා හා නගර සභා බල ප්‍රදේශවලට අයත් නොවූ ප්‍රදේශ සඳහා පළාත් පාලන ආයතන ලෙස (උප දිසාපති කොට්ඨාස මට්ටමින්) ප්‍රාදේශීය සභා ලෙස හඳන්වාදෙන ලදී.

එම ප්‍රාදේශීය සභා, නගර සභා හා සුළු නගර සභා සඳහා මහජන නියෝජිතයින් තෝරාපත් කර ගැනීමේ මහා ඡන්ද විමසීමක් 1987 වර්ෂයේදී පැවැත්වීමට නියමිතව තිබූ අතර, ඉන්දු- ලංකා ගිවිසුමට එරෙහිව පැවති ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන්, එම ඡන්ද විමසීම කල්තැබීමට සිදුවිය. එහෙයින්, පළාත් පාලන ආයතන රාශියක් සඳහා මහජන නියෝජිතයන් පත්කර ගරනීමට එම වර්ෂයේදීද හැකියාවක් නොලැබීම හේතුවෙන්, සුපුරුදු පරිදි එම ආයතන දිගටම නිලධාරී පාලනය යටතේ පවත්වාගෙන යන ලදී.

1970 දශකයේ උතුරු ප්‍රදේශයේ ආරම්භව, පසුව, උතුරු - නැගෙනහිර හා තවත් ප්‍රදේශ කිහිපයක යුදමය තත්වයක් දක්වා වර්ධනය වූ වෙනම රාජ්‍යක් පිහිටුවීමේ සන්නද්ධ කැරැල්ල හේතුවෙන්, 1991 වර්ෂයේදී පවත්වන ලද පළාත් පාලන ආයතන මහා ඡන්ද විමසීමේදී ද උතුරු - නැගෙනහිර ප්‍රදේශවල බොහෝමයක් පළාත් පාලන ආයතන සඳහා මහජන නියෝජිතයන් තෝරාගැනීමේ ඡන්ද විමසීම් පැවැත්වීමට හැකියාවක් නොවීය. මේ යුදමය වාතාවරණය හේතුවෙන් 1997 හා 2002 හා 2006 පළාත් පලාන ආයතන මහා ඡන්ද විමසීම්වලදී ද, පළාත් පාලන ආයතන සැලකිය යුතු සංඛ්‍යාවක මහජන නියෝජිතයන් තෝරා පත්කර ගත නොහැකි වූ අතර, වරින් වර නැගෙනහිර පළාතේ සමහර ප්‍රදේශවල හා යාපනය දිස්ත්‍රික්කයේද, වවුනියාව නගරයේද, පළාත් පාලන ආයතන සඳහා මහජන නියෝජිතයන් තෝරාපත් කර ගැනීමේ අතුරු ඡන්ද විමසීම් පවත්වා තිබේ. එසේ වුවද, ඒ කිසිදු අවස්ථාවක සමස්ථ දිවයිනේම පළාත් පාලන ආයතන මහජන නියෝජිතයන්ගේ පාලනය යටතේ ක්‍රියාත්මක වීමක් සිදු නොවුණි.

2011 වර්ෂයේ මුළු දිවයිනේම පැවැත්වූ පළාත් පාලන ඡනද විමසදීම් වලදී පවා මුලතිව් දිස්ත්‍රික්කයේ පුදුකුඩ්ඉරිප්පු හා මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභා දෙකෙහි ඡන්ද විමසීම පැවැත්වීමට නොහැකි විය. බිම් බෝම්බ ඉවත් කිරීමට ප්‍රමාද වීම හා ඡන්ද විමසීම පැවැත්වීමට එරෙහි අධිකරණ ක්‍රියාමාර්ග නිසා 2017

තෙක් ප්‍රමාද වූ එම ඡන්ද විමසීම 2011 දී භාරගනු ලැබූ නාමයෝජනා පත්‍ර, පාර්ලිමේන්තු පනතින් අවලංගු කිරීමෙන් අනතුරුව පැවැත්වීමට හැකිවූයේ 2018 පෙබරවාරි මස 10 දිනයේදීය. එදින පැවැත්වීමට නියමිතව තිබූ ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ ඡන්ද විමසීම, නාමයෝජනා පත්‍රයක් ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව ගන්නා ලද අධිකරණ ක්‍රියාමාර්ග හේතුවෙන් 2019 ඔක්තෝම්බර් මස 11 දින තෙක් පැවැත්වීමට නොහැකි වූ නිසා ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන සියල්ල මහජන නියෝජිතවරුන්ගේ පාලනය යටතේ පවත්වා ගැනීමේ අභිප්‍රාය ඉටු නොවීය.

2019.10.11 දින ඇල්පිටිය ප්‍රාදේශිය සභා ඡන්ද විමසීම පැවැත්වීමෙන් පසු, 2019.12.24 දින ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ ප්‍රථම රැස්වීම පැවැත්වූ අතර දැන් දිවයිනේ සියළුම පළාත් පාලන ආයතන ජනතාවගේ ඡන්දයෙන් තේරීපත් වූ මහජන නියෝජිතයන්ගේ හා ඔවුන් අතුරෙන් තෝරාගන්නා ලද නගරාධිපතිවරුන්/ සභාපතිවරුන්ගේ පාලනය යටතේ පවතී.

1977 වර්ෂයේ සිට 2017 දක්වා පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ක්‍රමය සංශෝධනය කිරීමෙන් හදුන්වා දෙන ලද ඡන්ද ක්‍රමය 1977 සිට 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන (සංශෝධන) පනත තෙක් සංශෝධනය වීමට අදාළ කරුණු හා ඒ හේතු නිසා පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ප්‍රමාදවීම පිළිබඳ තොරතුරු ***අංක VI දරන සටහන*** ලෙස මේ වාර්තාවට ඇතුළත් කර ඇත.

13. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත (262 දරන අධිකාරය) - පුරප්පාඩු පිරවීම.

2019 වර්ෂය තුළ පළාත් පාලන ආයතන පුරප්පාඩු පිරවීමට ක්‍රියාකර ඇත. ඒ පිළිබඳ තොරතුරු ***අංක VII දරන සටහනෙහි*** ඇතුලත් කර ඇත.

14. ඡන්දහිමි නාමලේඛනය ප්‍රතිශෝධනය - 2019

2019 වර්ෂයේ ඡන්ද හිමියන් ගණන් ගැනීම ආරම්භ කිරීම සම්බන්ධයෙන් ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 12(1) වගන්තිය යටතේ වූ දැන්වීම අංක 2123/10 හා 2018.05.16 දිනැති ලෙස ගැසට් පත්‍රයේ පළ කරන ලද අතර, එදිනම එම දැන්වීම සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් ඒ ඒ පුවත්පත්වල පළකිරීමටද කටයුතු කරන ලදී.

2012 වර්ෂය දක්වාම ගෘහයෙන් ගෘහයට ගොස් ඡන්ද හිමියන් ගණන් ගැනීම සෑම වර්ෂයකම ජුනි මස 01 වන දින ආරම්භ කරනු ලැබුවද 2012 වර්ෂයෙන් පසුව ඡන්ද හිමියන් ගණන් ගැනීම අදාළ වර්ෂයේ මැයි මස මැද භාගයේ ආරම්භ කරන ලදී. ඒ අනුව 2019 වර්ෂයේ ඡන්ද හිමියන් ගණන් ගැනීම 2019.05.15 ආරම්භ කරන ලදී. එහෙත් ඡන්ද හිමියෙකු වීම සඳහා සුදුසුකම් ලැබීමේ දිනය ලෙස සලකා බලන ලද්දේ, 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ නියමය පරිදි 2019 වර්ෂයේ ජුනි මස 01 වන දිනයටය.

සියලුම මැතිවරණ කොට්ඨාසවල ඡන්ද හිමියන් ගණන් ගැනීමට අදාළ ලිඛිත උපදෙස් දිස්ත්‍රික් ලියාපදිංචි කිරීමේ නිලධාරීන් වෙත 2019.03.02 දින නිකුත් කරන ලද ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය සම්බන්ධව ඊට අදාළ ඒ ඒ දේශපාලන පක්ෂවල, පක්ෂ නියෝජිතයන් පත්කළ යුතු ආකාරය පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2019.03.02 වන දින ලිඛිතව පිළිගත් දේශපාලන පක්ෂවල ලේකම්වරුන් දැනුවත් කිරීමටද කටයුතු කරන ලදී.

පසුගිය වර්ෂවලදී මෙන්ම සුදුසුකම්ලත් සියලුම ඡන්ද හිමියන් ඡන්ද හිමි නාමලේඛනයට ඇතුළත් කර ගැනීම අරමුණු කර ගනිමින් මෙතෙක් ඡන්ද හිමි නාමලේඛනයට නම් ඇතුළත් නොවූ ජන කණ්ඩායම් මෙන්ම ආන්තික කොටස් හඳුනාගෙන ඔවුන් ඡන්ද හිමියන් ලෙස ලියාපදිංචියට පසුගිය වර්ෂයේ මෙන්ම වැඩි අවධානයක් මෙම වර්ෂයේදී ද යොමු කරන ලදී. ඒ යටතේ නාගරික ප්‍රදේශවල පදිංචියක් සහිත අඩු ආදායම් ලබන පිරිස්, නාගරික මහල් නිවාසවල පදිංචිකරුවන්, නාගරික ප්‍රදේශ වෙත සංක්‍රමණය වූ පුද්ගලයන්, මධ්‍යම, ඌව හා සබරගමුව පළාත්වල මෙන්ම කළුතර, ගාල්ල, මාතර යන දිස්ත්‍රික්කවල වතු

ආශ්‍රිත රැකියාවල නියුතු දෙමළ භාෂාව කතා කරන ජනතාව, මෙන්ම උතුරු නැගෙනහිර පැවති ආයුධ සන්නද්ධ කණ්ඩායම්වල ක්‍රියාකාරකම් නිසා අවතැන්ව දිවයිනේ විවිධ ප්‍රදේශවල පදිංචි ජනතාව ඡන්ද හිමියන් ලෙස ලියාපදිංචි කිරීම සඳහා අත්‍යාවශ්‍ය බවට අදාළ දිස්ත්‍රික් ලියාපදිංචි කිරීමේ නිලධාරීන්/ දිසාපතිවරුන්, නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ටද උපදෙස් ලබාදෙන ලදී.

උපන් දිනය සනාථ නොකිරීම, පුරවැසිභාවය සම්බන්ධ ගැටලු, ගණන් ගන්නා කාල සීමාව තුළ නිවෙස්වලින් බැහැරව සිටීම හා ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචියට උනන්දුවක් නොමැතිවීම වැනි විවිධ හේතු මත මෙතෙක් ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචි නොවූ වැවිලි කර්මාන්තය ආශ්‍රිත රැකියාවල නියුතු දෙමළ භාෂාව කතා කරන ජනතාව ලියාපදිංචි කිරීම සඳහා පසුගිය වර්ෂවල මෙන්ම 2019 වර්ෂයේද වතු ආශ්‍රිතව විශේෂ වැඩපිලිවෙලක් ඒ ඒ දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ගේ පෞද්ගලික අධීක්ෂණය යටතේ සිදු කිරීමට උපදෙස් ලබාදෙන ලදී. මේ සඳහා වතු අධිකාරී වරුන්, වැවිලි ප්‍රජා පහසුකම් සලසන නිලධාරීන්, වතු ආශ්‍රිත සුබසාධක නිලධාරීන් මෙන්ම වතු ආශ්‍රිත වසම්වල සේවයේ නියුතු ග්‍රාම නිලධාරීන්ගේ සහායද ලබාගත් අතර ඒ තුළින් ඡන්දදායකයන් පසුගිය වසරට සාපේක්ෂව වැඩි පිරිසකගේ නම් ඡන්ද හිමි නාමලේඛනයට ඇතුළත් කර ගැනීමට අවස්ථාව ලැබිණි. මූලික ගණන් ගැනීමේ අවස්ථාවේදී නම් ඇතුළත් කර ගැනීමට නොහැකි වූ වතු ආශ්‍රිත පදිංචි ඡන්ද හිමියන්ගේ නම් අභියාචනා කාලසීමාව තුළ ඇතුළත් කර ගැනීමට දිස්ත්‍රික් මට්ටමින් විශේෂ වැඩපිළිවෙළක් දියත් කරන ලදී.

සියලු සුදුසුකම් සහිත පුරවැසියන් අත් නොහැරෙන ඡන්ද හිමි නාමලේඛනයක් සැකසීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් 2019 ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනයේදීද පහත ජන කොටස් කෙරෙහි දැඩි අවධානයක් දක්වන ලදී.

- දිවයිනේ විවිධ ප්‍රදේශවලින් පැමිණ කටුනායක, බියගම, කොග්ගල යනාදී ආයෝජන ප්‍රවර්ධන කලාපවල කර්මාන්තශාලාවල විවිධ සේවා නියුක්තිකයන් හා විවිධ ප්‍රදේශවල සේවයේ නියුතු ගෘහ සේවක/ සේවිකාවන්
- මෑත කාලීනව දකුණු කොරියාව, සවුදි අරාබිය යනාදී විදේශ රටවල සේවය කරන විගමණික ශ්‍රමිකයන්
- අගනුවර හෝ වෙනත් නාගරික ප්‍රදේශවල රැකියා සඳහා පැමිණෙන උඩරට හා පහත රට වතු ආශ්‍රිතව නිත්‍ය පදිංචිය ඇති ජනතාව
- දකුණු හා බටහිර වෙරළාසන්න ප්‍රදේශවලින් වාරකන් සමයේදී නැගෙනහිර ප්‍රදේශයට සංක්‍රමණය වන ධීවර ප්‍රජාව
- කුලී නිවාසවල විශේෂයෙන්ම මහනගර හා නගර ආශ්‍රිතව කුලී/ බදු ක්‍රමය මත පදිංචිව සිටින ජනතාව
- නිවාස ඒකක වැඩි සංඛ්‍යාවක් පවත්වාගෙන යන නිවාස සංකීර්ණ සහ නිවාස ඒකක රාශියක් පිහිටි තනි ගොඩනැගිලිවල පදිංචි ඡන්ද හිමියන්

ඉහත සඳහන් ශ්‍රී ලාංකික පුරවැසියන් ඡන්ද හිමිනාමලේඛනයේ ලියාපදිංචි කිරීම සඳහා සුවිශේෂී වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. විශේෂයෙන්ම කුලී නිවාසවල පදිංචිකරුවන් ලියාපදිංචි කිරීමේදී අදාළ ගෘහ අංකය සමඟ "R" අක්ෂරය යොදා ගෘහ අංකයක් ලබාදී ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි කිරීමට කටයුතු කර ඇත.

දැනට භාවිත වන ඡන්ද හිමියන් ගණන් ගැනීමේ ආකෘති පත්‍රයට වඩා සරලවූත් , භාවිතය පහසුවූත් නව ඡන්ද හිමියන්ගේ ගණන් ගැනීමේ ආකෘති පත්‍රයක් හඳුන්වාදීමේ නියමු ව්‍යාපෘතිය 2018 වර්ෂයේ ඇරඹිය අතර පසුව එහි දිගුවක් 2019 වර්ශයේද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 34ක සිදුකරන ලදී. එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 34හි විස්තර ***සටහන අංක VIII හි*** ඇතුලත් වේ. මෙම නියමු ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාවට නැංවූ අතර ජනතාව ග්‍රාම නිලධාරිවරුන් හා මැතිවරණ කොමිෂන් සභාවේ දිස්ත්‍රික් මැතිවරණ

කාර්යාලවලට අනුයුක්ත ඡන්ද ප්‍රදේශ භාර නිලධාරීන් මෙම නව ඡන්ද හිමියන් ගණන් ගැනීමේ ආකෘතිය සම්බන්ධව ධනාත්මක ප්‍රතිචාර දක්වා තිබීම ඉතා වැදගත් කරුණකි.

2018 වර්ෂයේ මෙන්ම 2019 වර්ෂයේදී ද උතුරු පළාතේද සියලුම ප්‍රදේශවල ගෘහයෙන් ගෘහයට ගොස් ඡන්ද හිමියන් ගණන් ගැනීමට අවස්ථාව ලැබුණු නමුත්, තවමත් තම මුල් පදිංචි නිවාසවල පදිංචියක් නොමැති තැනැත්තන්ට අදාළව යාපනය මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද කොට්ඨාස 27කද, වන්නි මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද කොට්ඨාස 01කද, ගෘහයෙන් ගෘහයට ගොස් ඡන්ද හිමියන් ගණන් ගැනීමක් සිදු නොවීය. එම කොට්ඨාසවලට අදාළව මියගියේ යැයි වාර්තා වූ තැනැත්තන් හැර, පූර්ව වර්ෂයේ ලියාපදිංචි හා අළුතින් සුදුසුකම් සැපිරූ සියලුදෙනා ඡන්දහිමි නාමලේඛනයට ඇතුළත් කරන ලදී. එලෙස ගෙයින් ගෙට ගොස් ඡන්ද හිමියන් ගණන් ගැනීමක් සිදු නොවන ලද ඡන්ද කොට්ඨාසවලට අදාළ විස්තර ***අංක IX දරන සටහනෙහි*** දක්වා ඇත.

2019 මැයි 15 වන දින ක්ෂේත්‍ර මට්ටමින් ආරම්භ කරන ලද ප්‍රතිශෝධන කටයුතු 2019 වර්ශයේදීම අවසන් කිරීමට සැලසුම් කළ අතර 2019.11.16 දින පැවති ජනාධිපතිවරණය හේතුවෙන් ඡන්ද හිමි නාමලේඛනය සහතික කිරීම 2020.01.24 දින දක්වා කල් තැබීමට තැබීමට සිදුවිය.

2019 මැයි මස 15 වන දින ආරම්භ කරන ලද ගෙයින් ගෙට ගොස්, ඡන්ද හිමියන් ගණන් ගැනීමේ කටයුතු 2019 අගෝස්තු මස මුල් සතියේදී අවසන් කිරීමටත් 2018 වර්ෂයේ ඡන්ද හිමි නාමලේඛනයෙන් ඉවත්වන නම් ඇතුළත් ‘‘අ’’ නම් ලැයිස්තු හා ප්‍රවර්තන නාමලේඛනයට අළුතෙන් ඇතුළත් වන නම් ඇතුළත් ‘‘ආ’’ ලැයිස්තු සකස් කිරීමට අදාළ කටයුතු 2019.08.22 දින අවසන් කොට 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 13 වන වගන්තිය යටතේ ‘‘අ’’ සහ ‘‘ආ’’ ලැයිස්තු 2019.08.23 සිට 2019.09.19 දින දක්වා වූ කාලයක් ප්‍රදර්ශනය කිරීමටත් එම කාල සීමාව තුළ මහජනතාවට තමාගේ නම ඡන්ද හිමි නාමලේඛනයට ඇතුළත්ව තිබේද නොතිබේද යන්නත්, එතෙක් ඇතුළත්ව නොමැති නම් සඳහා අභියාචනා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසමින් අදාළ ලැයිස්තු සියලුම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල, සියලුම ග්‍රාම නිලධාරී කාර්යාලවල සහ සියලුම පළාත් පාලන ආයතන කාර්යාලවල ප්‍රදර්ශනය කිරීමටත් පියවර ගන්නා ලදී. 2019 ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධන කාර්යයට අදාළව ප්‍රවර්තන නාමලේඛනයෙන් (2018) සියලුම මැතිවරණ කොට්ඨාසවලට අදාළව ඉවත්වන නම් සංඛ්‍යාව ("අ" නම්) 874,612 ක් වූ අතර අලුතෙන් ඇතුළත් වන නම් (‘‘ආ’’ නම්) 1,137,050 ක් විය. අදාළ විස්තර ***අංක X සටහනෙහි*** දක්වා ඇත. එසේම ප්‍රදර්ශන කාල සීමාව තුළදී හිමිකම් සහ විරෝධතා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසන ලදී. නිශ්චිත හිමිකම් ආකෘතියෙන් ඉදිරිපත් නොකළද අදාළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත ලිපියක් මඟින් පැමිණිල්ලක් හෝ වෙබ් අඩවියෙන් ඉදිරිපත් කළ පණිවුඩද ‘‘හිමිකම් පෑමේ’’ ඉල්ලීමක් ලෙස සලකා කටයුතු කිරීමට දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ට (සහකාර ලියාපදිංචි කිරීමේ නිලධරයන්ට) උපදෙස් ලබා දී ඇත. ‘‘අ’’ සහ ‘‘ආ’’ ලැයිස්තු ප්‍රදර්ශනය කිරීම පිළිබඳව ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 13 (2) වගන්තිය යටතේ වූ දැන්වීම අංක 2083/40 හා 2019.08.23 දිනැති ගැසට් පත්‍රයේ සහ 2019.08.23 දින දිවයින, වීරකේසරි සහ ඩේලි නිව්ස් පුවත්පත්වල පළ කරන ලදී.

ඡන්ද හිමියන් ගණන් ගැනීමේදී ගෘහයෙන් ගෘහයට ගොස් ගණන් ගැනීමේ ආකෘති (බීසි ආකෘති) පත්‍ර ගෘහ මූලිකයන් වෙත භාරදීම සහ ආපසු භාර ගැනීමේ කටයුතු නිරීක්ෂණයටත් ක්ෂේත්‍ර ගණන් ගැනීමේ කටයුතු අවසන් වූ පසු ගණන් ගන්නා නිලධාරීන්ගේ කාර්යාලවලට ගොස් ඒවා පරීක්ෂා කර බලා තම නිරීක්ෂණ ඉදිරිපත් කිරීමට නියෝජිතයන් පත් කරන ලෙස සියලුම පිළිගත් දේශපාලන පක්ෂවලට ඡන්ද හිමියන් ගණන් ගැනීමේ කටයුතු ආරම්භ කිරීමට පෙර දන්වා යවන ලදී. විශේෂ ගණන් ගන්නා නිලධාරීන්ගේ සහ ගණන් ගන්නා නිලධාරීන්ගේ කටයුතු නිරීක්ෂණයට දේශපාලන පක්ෂ නියෝජිතයන් නිරීක්ෂණ මට්ටමින් සහභාගිවන්නේ නම් එය නිවැරදි ඡන්ද හිමි නාමලේඛනයක් සකස් කර ගැනීමට මනා පිටුවහලක් වන බැවින්, ඒ ගැන අවධානය යොමුකොට මෙම අවස්ථාව 1981 වර්ෂයේ සිට සියලුම පිළිගත් දේශපාලන පක්ෂවලට ලබාදී ඇත. ඡන්ද විමසීම් අවස්ථාවකදී හෝ තම පාක්ෂිකයෙකුගෙන් පැමිණිල්ලක් ලද අවස්ථාවක හෝ තම පාක්ෂිකයන්ගේ ඡන්ද අයිතිය අහෝසිකර ඇති බව චෝදනා

නොකොට ගණන් ගැනීමේ අවස්ථාවට තම නියෝජිතයන් සහභාගි කරවා එම කටයුතු නිවැරදිව සිදුවන බවට වග බලා ගැනීම සියලුම දේශපාලන පක්ෂවල වගකීමක්ද වේ. එහෙත් ඒ සඳහා තම නියෝජිතයන් පත් කරනු ලබන පිළිගත් දේශපාලන පක්ෂ සංඛ්‍යාව ඉතා සීමිත වන අතර එම පත් කරනු ලබන සංඛ්‍යාවෙන්ද මෙම කාර්යය සඳහා සහභාගිවන සංඛ්‍යාව ඉතා අල්පය. දේශපාලන පක්ෂ විසින් පත් කරන ලද නියෝජිතයන්ට නාමලේඛන ප්‍රතිශෝධන කාර්යය පිළිබඳව හා පක්ෂ නියෝජිතයන්ගේ කාර්ය භාරය පිළිබඳව වැඩි අවබෝධයක් ලබාදීම සඳහා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරු මඟින් පක්ෂ නියෝජිතයන් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක්ද 2019 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලදී. 2019 වර්ෂයේ ප්‍රතිශෝධනය සඳහා දේශපාලන පක්ෂවලින් නියෝජිතයින් පත්කරනු ලැබූ ප්‍රමාණයන් හා ගණන් ගැනීමේ කාර්යය සඳහා සහභාගි වූ නියෝජිතයින් සම්බන්ධ විස්තර ***අංක XI දරන සටහනෙහි*** දක්වා ඇත.

2019 වර්ෂයේ ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනයේදී ද ගණන් ගන්නා නිලධාරින්ගෙන් ගණන් ගන්නා ආකෘතිපත් (බීසී ආකෘතිය) පරීක්ෂාකර භාරගැනීමේදී, ගෘහ මූලිකයින් විසින් ඇතුළත් කර ඇති එහෙත් විවිධ හේතු මත ගණන් ගන්නා නිලධාරීන් විසින් නිර්දේශ කර නොමැති සහ 2018 වර්ෂයේ ලියාපදිංචිව තිබී 2019 වර්ෂයේ සම්පූර්ණ ගෘහයේම ඡන්දහිමියන්ගේ නම් ඉවත්ව ඇති හා ඡන්ද හිමියන් ගණන් ගැනීමේ ආකෘතිය (බීසී) භාරනොදීම වැනි හේතු නිසා ඉවත්ව ඇති නම් සඳහා අදාළ ගෘහයේ ගෘහමූලිකයා ලිඛිතව දැනුවත් කර වැඩිදුර තොරතුරු ලබා ගැනීමටද කටයුතු කරන ලදී. ගෘහමූලිකයින් විසින් එවන ලද පිළිතුරු අනුව ඉල්ලුම්කර ඇති ස්ථානයේ ලියාපදිංචිය සඳහා පිළිගත හැකි ඡන්ද හිමියන්ගේ නම් ගණන් ගන්නා නිලධාරියාගේ නිර්දේශය තිබේ නම් පිළිගෙන "ආ" ලැයිස්තුගත කිරීමත්, අනෙකුත් සියළුම ඉල්ලීම් නියමිත කාලය තුළ ලද හිමිකම් ඉල්ලීම් සේ සලකා පරීක්ෂණ සඳහා කැඳවීම් කර පරීක්ෂණයේදී අනාවරණය වූ කරුණු පදනම් කරගෙන පිළිගත හැකිව තිබූ ඡන්ද හිමියන්ගේ නම් ඡන්දහිමි නාමලේඛනයට ඇතුළත් කර ගැනීමට කටයුතු කරන ලදී.

"අ" සහ "ආ" ලැයිස්තු ප්‍රදර්ශනය යටතේ, 2019 වර්ෂයේ ප්‍රතිශෝධනයට අදාළව එක් එක් මැතිවරණ කොට්ඨාසය යටතේ දිස්ත්‍රික් ලියාපදිංචි කිරීමේ නිලධාරීන් වෙත හිමිකම් ඉල්ලීම් හා විරෝධතා ලැබී තිබිණි. එමෙන්ම ප්‍රතිශෝධන කාලසීමාව තුළ ඡන්දය ලියාපදිංචිව නොමැති බවට ලිපි මඟින් ලැබී ඇති ඉල්ලීම්, UE ආකෘති, ප්‍රතිශෝධනයට අදාළ බීසි ආකෘති ගණන් ගන්නා නිලධාරීන්ගෙන් මැතිවරණ කාර්යාලයට භාරගත් පසුව ග්‍රාම නිලධාරි නිර්දේශය සහිතව හෝ රහිතව ලැබී ඇති බීසි ආකෘතිපත්වලින් හෝ ග්‍රාම නිලධාරි විසින් නිර්දේශ නොකරන ලද නම් සඳහා යවන ලද ලිපිවලට අදාළව ලැබී ඇති ඉල්ලීම් ආදී කුමන හෝ ආකාරයෙන් ඉදිරිපත් කරන ලද ඉල්ලීම්, හිමිකම් සේ සලකා සුදුසුකම්ලත් සියලු දෙනාගේ ඡන්ද අයිතිය ආරක්ෂාකර දීම සඳහා පරීක්ෂණවලට කැඳවා අවස්ථාව ලබාදීමට කටයුතු සිදුකරනු ලැබුවේ නිවැරදි සහ සුදුසුකම්ලත් සියලුම දෙනා ඇතුළත් ඡන්ද හිමි නාමලේඛනයක් සකස් කර ගැනීමේ අරමුණෙනි. එමෙන්ම 2016 වර්ෂයේදී ප්‍රථම වරට මැතිවරණ කොමිෂන් සභා වෙබ් අඩවිය මඟින් ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළ ගැටළු, පරිගණක වැඩසටහනටම යොමුකළ හැකි පරිදි, පරිගණක වැඩසටහනක් හඳුන්වා දෙනු ලැබීය. ඒ අනුව 2019.08.23 සිට 2019.09.19 දක්වා 2018 වර්ෂය සඳහා ඉවත්වන නම් (අ) හා ඇතුළත්වන නම් (ආ) ඇතුළත් කෙටුම්පත් නාමලේඛනය වෙබ් අඩවිය හරහා ප්‍රදර්ශනය කරන ලදී. ඒ අනුව තමාගේ නම නිවැරදි නොවීම, ජාතික හැඳුනුම්පත් අංකය නිවැරදි නොවීම ආදී කරුණු සම්බන්ධයෙන් අන්තර් ජාලය හරහා පැමිණිලි ඉදිරිපත් කිරීමේ හැකියාව ලබාදෙන ලදී. ඊට අමතරව කෙටුම්පත් නාමලේඛනය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල සහ සියලුම ග්‍රාම නිලධාරි කාර්යාලවල ප්‍රදර්ශනය කරන ලදි. ඒ බවට පුවත්පත් දැන්වීම් හා විද්‍යුත් මාධ්‍ය මඟින් මහජනතාව දැනුවත් කරමින් තම නම ඡන්ද හිමි නාමලේඛනයට ඇතුළත්ව ඇත්ද යන්න පරීක්ෂා කර, නම ඇතුළත් වී නොමැති නම් 2019.09.19 දිනට පෙර මැතිවරණ කොමිෂන් සභාව වෙත හෝ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත ඒ බව දැනුම් දෙන ලෙසට 2018 වර්ෂයේ ප්‍රතිශෝධනයේදී මෙන්ම 2019 වර්ෂයේදී ද මහජනතාව දැනුවත් කරන ලදී. ඒ අනුව මැතිවරණ කොට්ඨාස මට්ටමින් ලැබුණු හිමිකම් සහ විරෝධතා ප්‍රමාණයන්, ඒවායින් පිළිගත් හා ප්‍රතික්ෂේප කළ ප්‍රමාණයන්ට අදාළ විස්තර ***අංක XII දරන සටහනෙහි*** දක්වා ඇත.

15. 18-DS යොවුන් හා ආබාධිත පුරවැසි තොරතුරු ලබා ගැනීමේ ආකෘතිය

1980 අංක 44 දරණ ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත ඉදිරියේදී සංශෝධනය වීමට නියමිතය. එහිදී වයස අවුරුදු 18 සපිරෙන යොවුන් පුරවැසියන්ට අදාළ වර්ෂය තුළදීම ඡන්ද අයිතිය ලබා දීමට අවශ්‍ය කරන නෛතිකමය ප්‍රතිසංස්කරණ ඇති කරනු ලැබේ. ඒ අනුව වයස අවුරුදු 16 -18 අතර යොවුන් පුරවැසියන්ගේ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සකස් කර ගැනීම ඉදිරියේදී ඉහත සඳහන් ප්‍රතිසංස්කරණ වලට අනුව වයස අවුරුදු 18 පිරුණු තැනැත්තන්ට ආදාළ වර්ශය තුළදීම ඡන්ද අයිතිය ලබා දීමේදී වැදගත් වනු ඇතැයි මැතිවරණ කොමිෂන් සභාව තීරණය කරන ලදි. ඒ අනුව 2019 ඡන්දහිමි නාමලේඛනයට සමගාමීව යොවුන් පුරවැසි තොරතුරු ලබා ගැනීමේ ආකෘති පත්‍රයක් ද ගෘහයන් වෙත ලබා දෙන ලදි.

ඉහත ආකෘතියෙම අනෙක් පස ආබාධිත පුරවැසියන් හට ඡන්දය ප්‍රකාශ කිරීමේ දී අවශ්‍ය කරන ප්‍රවේශ පහසුකම් සම්බන්ධව තොරතුරු ලබා ගැනීමේ විස්තර පත්‍රිකාවක් ද ලබා දෙන ලදි.මෙමගින් ලබාගන්නා තොරතුරු ඇසුරෙන් දත්ත ගබඩාවක් නිර්මාණය කර ආබාධිත පුරවැසියන් හට ඉදිරි ඡන්ද විමසීම් වලදී පහසුකම් සැපයීමට බලාපොරොත්තු වේ.

16. ඡන්ද හිමියන්ගේ දිනය - ජුනි 01

පසුගිය වර්ෂවලදී මෙන්ම 2019 ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළව ඡන්ද හිමියන් ගණන් ගැනීමේදීද පොදුවේ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මඟින් මහජනතාව දැනුවත් කිරීමේ ක්‍රියාවලියට සමගාමීව ජුනි මස 01 වන දිනට යෙදෙන ඡන්ද හිමියන්ගේ දිනය පාදක කර ගනිමින් දිස්ත්‍රික් මට්ටමින් විවිධ වැඩසටහන් සැළසුම් කර තිබිණ. 2013 වර්ෂයේදී කොළඹ දිස්ත්‍රික්කය කේන්ද්‍ර කොටගෙන ඡන්ද හිමියන්ගේ දිනයට අදාළ ප්‍රධාන උත්සවය කොළඹදී සංවිධානය කරනු ලැබුවද 2014 වර්ෂයෙන් පසු අනෙකුත් දිස්ත්‍රික්කවල ද ඡන්ද හිමියන්ගේ දිනයට අදාළ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී. ඡන්ද නාමලේඛනයේ ලියාපදිංචිවීමේ අවශ්‍යතාව අවධාරණය කරමින් මාධ්‍ය සාකච්ඡා, රථ පෙළපාලි, ජන හමු, පා ගමන්, වීදි නාට්‍ය, කෙටි චාර්තා චිත්‍රපට, අත් පත්‍රිකා, පෝස්ටර්, කටවුටි හා බැනර් ප්‍රදර්ශනය ආදී ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරන ලදී. 2019 වර්ෂයේදී ඡන්ද හිමියන්ගේ දින ප්‍රධාන වැඩසටහන් 9ක් සෑම පළාතක්ම ආවරණය වන පරිදි සංවිධානය කරන ලදී. කෙසේ වුවද 2019.04.21 දින එල්ල වූ පාස්කු ඉරුදින සිදු වූ බෝම්බ ප්‍රහාර හේතුවෙන් ඇති වූ තත්වයන් හේතුවෙන් එම ප්‍රධාන වැඩසටහන් සියල්ලම අවලංගු කිරීමට සිදු විය.කෙසේ වුවද 2019 ජුනි 01 දින මොරටුව 552/A දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඡන්දහිමියන් ගණන් ගැනීමේ ආකෘති එකතු කිරීමේ වැඩසටහනතක් සංවිධානය කරන ලදි. ඡන්ද හිමියන්ගේ දිනයට අදාළව තෝරාගත් නගර සභා මහ නගර සභා බල ප්‍රදේශවල පිහිටි තෝරාගත් ග්‍රාම නිලධාරී වසම්වල පිහිටි නිවෙස් වෙත ගණන් ගන්නා නිලධාරීන් මෙන්ම මැතිවරණ කාර්යාලයීය නිලධාරීන් ගොස් ගණන් ගැනීමේ ආකෘති පත්‍ර භාර ගැනීම 2019.06.03 දින සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සිදු කරන ලදී. මෙම වැඩපිළිවෙල නිසා සැබෑලෙසම යම් ලිපිනයක සාමාන්‍ය පදිංචිය දරන තැනැත්තන් වෙතින් බීසී ආකෘති පත්‍ර භාර ගැනීමේ අවස්ථාව ලැබුනු බැවින් විශේෂයෙන්ම ජනප්‍රිය පාසල්වලට ළමුන් ඇතුළත් කර ගැනීම සඳහා වංචනිකව නම් ඇතුළත් කර ගැනීමට දරන ලද උත්සාහයන් අවමකර ගත හැකි වූ බව මෙම කාර්යය අධීක්ෂණය කළ, දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ගේ අදහස විය.

17. දේශපාලන පක්ෂ සම්බන්ධ කටයුතු

සියලුම පිළිගත් දේශපාලන පක්ෂ සඳහා 2019 වර්ෂයට අදාළව වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දෙන ලෙසට දන්වමින් ලිපියක් යොමු කර ඇත.

සියලුම පිළිගත් දේශපාලන පක්ෂවල නායකවරුන්, ලේකම්වරුන් සහ නිත්‍ය නියෝජිතයන් අමතමින් රජයේ පොදු ස්ථාන සඳහා ජීවත්ව සිටින දේශපාලනඥයින්ගේ නම් යෙදීම සම්බන්ධව 2019.05.10

දිනැතිව ලිපියක් යොමු කෙරින. මෙම ලිපිය සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, විසුරුවා ඇති පළාත් සභාවල හිටපු මහ ඇමතිවරුන් සහ අනෙකුත් ප්‍රධානීන් වෙත ද, අමාත්‍යාංශ ලේකම්වරුන්, ආණ්ඩුකාරවරුන්, පළාත් ප්‍රධාන ලේකම්වරුන්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් , කළාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත ද යොමු කර ඇත.

මීට අමතරව දේශපාලන පක්ෂවලින් ලැබෙන ගිණුම ප්‍රකාශ සහ නිලධාරී මණ්ඩල වෙනස් වීම් පිළිබඳව කොමිෂන් සභාවට පත්‍රිකා ඉදිරිපත් කර අදාළ වෙනස්කම් සිදු කිරීමත් ලද බව දන්වමින් ලිපි යෙමු කිරීමත් සිදු කර ඇත.

දේශපාලන පක්ෂවල නිලධාරී මණ්ඩල වෙනස් වීම්, නම වෙනස්වීම් හා ලිපිනයන් වෙනස්වීම් පිළිගැනීම.

i. ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණේ නව නිලධාරී මණ්ඩලයේ ලැයිස්තුව කොමිෂන් සභා අනුමැතියට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පිළිගැනීම.
ii. ශ්‍රී ලංකා සමාජවාදී පක්ෂයේ ලිපිනය වෙනස් වීම පිළිගැනීම.
iii. ප්‍රජාතන්ත්‍රවාදී ජාතික ව්‍යාපාරයේ නම ජාතික ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ ලෙස වෙනස් වීම පිළිගැනීම.
iv. යහපාලනය සඳහා වූ ජාතික පෙරමුණ පක්ෂය විසින් නිලධාරී මණ්ඩලය වෙනස් කිරීම සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපිය මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතියට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පිළිගැනීම.

ලිබරල් පක්ෂය, අහිල ඉලංගෙයි මහජන කොංග්‍රසය, ඊලවර් ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ, එක්සත් ලංකා මහසභා පක්ෂය, ශ්‍රී ලංකා ප්‍රගතිශීලී පෙරමුණ යන අර්බුදකාරී තත්ත්වයේ පසුවන පක්ෂ සමඟ සාකච්ඡාවක් පැවැත්වීය. මෙම පක්ෂවල පවතින අභ්‍යන්තර ආරවුල් සහ අධිකරණමය ක්‍රියාමාර්ග හේතුවෙන් ඒ පිළිබඳව අභ්‍යන්තර එකඟතාවකට නොපැමිණියහොත් 2019 ජනාධිපතිවරණය සඳහා එම පක්ෂවලට නාම යෝජනා භාර දීමට ඉඩ ලබා දිය නොහැකි වනු ඇති බව මැතිවරණ කොමිෂන් සභාව පෙන්වා දුන්නේය.

2019 දෙසැම්බර් 31 දිනට පෙර සියලුම දේශපාලන පක්ෂවල වාර්ෂික ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙසත්, එසේ නොකළහොත් පක්ෂ ලියාපදිංචිය අවලංගු කිරීමට සිදු වන බවත් දන්වමින් දේශපාලන පක්ෂ ලේකම්වරුන්ට ලිපියක් යොමු කරන ලදී.

18. විශේෂ ව්‍යාපෘති

18.1උපායමාර්ගික සැලැස්ම

මැතිවරණ කොමිෂන් සභාවේ 2017-2020 දක්වා වූ සිවු අවුරුදු උපාය මාර්ගික සැලැස්මේ දක්වා ඇති ආකාරයට දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල හරහා කොමිෂන් සභාවේ කාර්යයන් හා කර්තව්‍යන්, ඡන්ද විමසීම් නීති රීති, මැතිවරණ ක්‍රම හා ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචිය පිළිබඳව විද්‍යාර්ථීන්/ ශිෂ්‍ය ප්‍රජාව / විවිධ ආයතනවල /සංවිධානවල නිලධාරීන් /පොදු මහජනතාව/ ස්වේච්ඡා සංවිධානවල සාමාජිකයන් දැනුවත් කිරීමේ වැඩමුළු, දේශන, චිත්‍ර හා පෝස්ටර් තරඟ, දැනුම මිනුම තරඟ පැවැත්වීමට සහාය වීම හා එම කටයුතු සම්බන්ධීකරණය කිරීම, ඒ පිළිබඳව ප්‍රගතිය විමර්ශනය කිරීම, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මගින් අතරමැදි ඇගයුමක් සිදුකිරීමට ක්‍රියාකර ඇත.

- සිවු අවුරුදු උපාය මාර්ගික සැලැස්ම සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මගින් අතරමැදි ඇගයුමක් සිදුකිරීම. දිස්ත්‍රික් කාර්යාල හා ප්‍රධාන කාර්යාලය ආවරණය වන පරිදි සම්මුඛ සාකච්ඡා හා ක්ෂේත්‍ර කටයුතු සිදුකොට මෙම අතරමැදි ඇගයුම පිළිබඳව වාර්තාවක් සකස් කිරීමට ක්‍රියාකර ඇත. අදාල සාකච්ඡාව පැවති දිනවකවානු ***සටහන් අංක XIII*** ලෙස දක්වා ඇත.

- උපාය මාර්ගික සැලැස්මේ දක්වා ඇති දැනුම්වත් කිරීමේ වැඩසටහන් කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා සහාය කරගැනීම පිණිස පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් 2019.02.26-28 දින දක්වා ගම්පහ හේනේගම නෙරළු නිවාඩු නිකේතනයේ දී (සිංහල මාධ්‍යය) හා 2019.04.04 සහ 05 දිනවල වවුනියාව ඔවියා හෝටලයේ දී (දෙමළ මාධ්‍යය) IFES සංවිධානයේ අනුග්‍රහය ඇතිව පවත්වන ලදී.

- සිවු අවුරුදු උපාය මාර්ගික සැලැස්මට අදාළව පරිගණකගත මෙහෙයුම් හා ඇගයුම් පුහුණු වැඩමුළුවක් 2019.04.08 දින මැතිවරණ කොමිෂන් සභාවේ දී පවත්වන ලදී.

- 2019 අප්‍රේල් 21 දින පාස්කු ඉරුදින සිදුවූ බෝම්බ ප්‍රහාර හේතුවෙන් රටේ ඇති වූ අයහපත් වාතාවරණය නිසා උපායමාර්ගික සැලැස්මේ කාර්යයන් අපේක්ෂිත පරිදි ඉටුකිරීමට බාධා ඇති වූ බව මෙහි සඳහන් කළ යුතුව තිබේ.

18.2 කතිරයේ බලය

මැතිවරණ කොමිෂන් සභාවේ 2017-2020 දක්වා වූ සිවු අවුරුදු සහභාගීත්ව උපාය මාර්ගික සැලැස්මේ හඳුනාගන්නා ලද අවධාරිත ක්ෂේත්‍ර යටතේ කොමිෂන් සභාවේ කාර්යයන් හා කර්තව්‍යන් අළලා කාර්තුමය වශයෙන් කතිරයේ බලය නමින් (News Letter) පුවත් සඟරාවක් එළි දක්වන ලදී. එහි තුන්වන වෙළුමේ පළමු කලාපය 2019 ජනවාරි - අප්‍රේල් පළමු කලාපය නිකුත් කරන ලදී.

18.3 පාර්ලිමේන්තුවට වසර 70ක් පිරීම නිමිති කරගෙන 1947 සිට 2015 දක්වා පැවැති පාර්ලිමේන්තු මැතිවරණ අළලා සකස් කරන ලද ත්‍රෛභාෂික ග්‍රන්ථය මුද්‍රණය කිරීමට කටයුතු කරන ලදී.

18.4 කාන්තා

ශ්‍රී ලංකාවේ සමස්ථ ජනගහනයෙන් 52.60%ක් වන කාන්තාවන්ගේ සහභාගීත්වය ආර්ථික හා සාමාජීය ක්ෂේත්‍රවලදී ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කළ ද, දේශපාලන ක්ෂේත්‍රයේ විශේෂයෙන්ම මන්ත්‍රීධුර සඳහා තරඟ කිරීමට ඉදිරිපත්වීම හා සක්‍රීය ලෙස දේශපාලනයේ නිරතවීමේ සැලකිය යුතු අඩුවක් පවතින හෙයින්, මැතිවරණ ක්‍රියාවලිය තුළ කාන්තා දායකත්වය අනෙකුත් රටවලට සාපේක්ෂව ප්‍රශස්ත මට්ටමක පවත්වාගෙන යාම සඳහා දේශපාලන පක්ෂවල කාන්තා බලමණ්ඩල හා කාන්තා ක්‍රියාකාරීන්, වැඩමුළු ඔස්සේ දැනුවත් කිරීමට කටයුතු කර ඇත.

ශ්‍රී ලංකාවේ මහජන නියෝජිත ආයතනවල කාන්තා නියෝජනය ඉහළ නැංවිය යුතු බව පිළිගෙන ඇති කරුණක් බවට පත්වී තිබෙන මෙම කාලවකවානුවේදී, දේශපාලනය කෙරෙහි කාන්තාවන්ගේ සහභාගීත්වය ප්‍රවර්ධනය වන ආකාරයේ වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කිරීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් ගෙන ඇති තීරණයකට අනුව වැඩසටහන් පවත්වා ඇත. ශ්‍රී ලංකාවේ දේශපාලනමය තීන්දු තීරණ ගැනීම සම්බන්ධයෙන් කාන්තාවන්ගේ කාර්යභාරය ඉතාමත් සුළු පිරිසක් මත රදා පැවතීම ජාතික මට්ටමෙන් ද, පළාත් හා ප්‍රාදේශීය මට්ටමෙන් ද දක්නට ඇත. එබැවින් පළාත් පාලන බල ප්‍රදේශයන් යටතේ වූ ගම් මට්ටමේ මෙවැනි වැඩසටහන් පැවැත්වීම තුළින් සක්‍රීය දේශපාලනය තුළ කාන්තාවන්ගේ සහභාගීත්වය වැඩි දියුණු කර ගත හැකි බවට විශ්වාස කළ හැක.

මීට අමතරව, 2018.02.10 දින පැවති පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී එක් එක් පළාත් පාලන ආයතන වෙනුවෙන් තේරී පත්වූ කාන්තා සභිකයන් සියළු දෙනා කැඳවා ප්‍රජාතන්ත්‍රවාදය, සර්වජන ඡන්ද බලය, ජනතා පරමාධිපත්‍ය සහ මැතිවරණ නීති සම්බන්ධයෙන් දැනුම්වත් කිරීමේ වැඩමුළු කිහිපයක් ගාල්ල, කුරුණෑගල හා මොණරාගල දිස්ත්‍රික්ක මගින් පවත්වන ලදි.

තවද, මැතිවරණ කොමිෂන් සභාවේ සිවු අවුරුදු උපාය මාර්ගික සැළැස්මට අනුව අන්තර්ජාතිකව සමරනු ලබන දින 20 කට වැඩි සංඛ්‍යාවක් තෝරා ගෙන ඒ මඟින් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි. ඒ අනුව මාර්තු 8 වැනි දිනට යෙදී ඇති ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව එක් එක් දිස්ත්‍රික්ක තුළ විවිධ වැඩසටහන් පවත්වන ලදී.

18.5 තරුණ

තරුණ ප්‍රජාව ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයේ සජීවී කොටස්කරුවන් බවට පත් කිරීම හා මැතිවරණ ක්‍රියාවලිය වෙනුවෙන් ඔවුන්ගේ සක්‍රීය සහභාගීත්වය වර්ධනය කිරීම කාලීන අවශ්‍යතාවන් ලෙස සැළකිය හැක. ජාතික තරුණ සේවා සභාව වැනි ජාතික මට්ටමේ තරුණ සංවිධාන, තරුණ වෘත්තිකයන්, ප්‍රාදේශීය මට්ටමේ ක්‍රීඩා හා වෙනත් තරුණ සංවිධාන හා එක්ව විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව දැනුම්වත් කිරීම්, නිර්මාණාත්මක වැඩසටහන්, ජාත්‍යන්තර තරුණ දින වැඩසටහන සටහන හා තරුණ සහභාගීත්වය සහිත වෙනත් වැඩසටහන් සංවිධානය කරන ලදි.

මැතිවරණ කොමිෂන් සභාව සහ IFES ආයතනය සමඟ එක් ව 2019 මාර්තු මස Youth Committee on Elections (YCE) නැමැති තරුණ නියෝජිතයන්ගෙන් සමන්විත කමිටුවක් පත්කර ගෙන ඇති අතර තරුණ පිරිස් වල සක්‍රීය දායකත්වය ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහය වෙත ලබාගැනීම මින් අපේක්ෂා කෙරේ.

2019.05.29 දින Youth Committee on Elections (YCE) කමිටු සාමාජිකයන් සමඟ ඔවුන් මැතිවරණ කොමිෂන් සභාව සමඟ සිදු කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් පිළිබඳ සාකච්ඡාව සහ ජාත්‍යන්තර තරුණ දිනය සැමරීම සඳහා අදහස් හුවමාරු කර ගැනීම සිදු කරන ලද අතර, 2019.06.21,22 යන දෙදින තරුණ කණ්ඩායම් සඳහා IFES ආයතනය විසින් Countering online hate speech and discrimination during elections යන මැයෙන් මැතිවරණ කොමිෂන් සභා ප්‍රධාන ශ්‍රවණාගාරයේ දී වැඩමුළුවක් පවත්වන ලද අතර එයට සමස්ත දිවයිනම නියෝජනය කරමින් තරුණ පිරිස් සම්බන්ධ විය.

18.6 ආබාධිත

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වන පරිච්ඡේදයේ ඇති ඡන්ද බලය, ඡන්ද විමසීම සහ මැතිවරණය පිළිබඳ දැක්වෙන 93 වන අනුව්‍යවස්ථාවේ ඡන්දය දීම නිදහස්ව ද, සමානවද, රහසේද විය යුතු බව සඳහන් කර ඇත. 2016.02.08 දින ශ්‍රී ලංකා රජය විසින් අත්සන් තබන ලද ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියහි 29 වන වගන්තිය ප්‍රකාරව ද ආබාධ සහිත පුද්ගලයින්ට දේශපාලන අයිතීන් සහ අනෙකුත් අය හා සමාන පදනමකින් ඒවා භුක්තිවිඳීමට අවස්ථාවන් රාජ්‍ය පාර්ශ්වය විසින් සහතික කළ යුතුව ඇත. එහි ප්‍රධානතම වගකිවය යුතු ආයතනයක් ලෙස මැතිවරණ කොමිෂන් සභාව විසින් 2019 වර්ෂය තුළ සුවිශේෂී පියවරයන් කිහිපයක් ගැනිමට හැකියාවක් ලැබී ඇත.

මේ අනුව 2012 ජන හා සංඛ්‍යා ලේඛන වාර්තා අනුව ශ්‍රී ලංකාවේ සමස්ථ ජනගහනයෙන් 8.7%ක් ආබාධ සහිත තැනැත්තන් ජීවත් වන අතර ඔවුන්ගේ දේශපාලන අයිතිවාසිකම පිළිබඳ මැතිවරණ කොමිෂන් සභාවේ 2017-2020 උපාය මාර්ගික සැළසුම තුළ 2020 වර්ෂය වන විට නෛතික වශයෙන් ද, සාමාජීය වශයෙන්ද, සංස්කෘතික වශයෙන් ද සුරක්ෂිත කරන ලද පරිසරයක් තුළ ආබාධ සහිත පුද්ගලයින්, මැතිවරණ ක්‍රියාවලිය තුළ සහභාගීත්වය ඉහළ නැංවීමට අවශ්‍ය පියවරයන් ගනිමින් සිටියි. ඒ අනුව ආබාධ සහිත තැනැත්තන් මැතිවරණ ක්‍රියාවලියෙහිලා බාධාවලින් තොරව, ප්‍රමාණවත් ලෙස යෙදි සිටීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් ඡන්දය පාවිච්චි කිරීමේදි දුෂ්කරතා වලට මුහුණ දෙන ආබාධ සහිත පුද්ගලන් සංඛ්‍යාව පිළිබඳ සමීක්ෂණයක් කිරීම හා 2019 ඡන්ද හිමි නාමලේඛනය ප්‍රතිශෝධන ක්‍රියාවලියේදී එය සිදුකිරීමට හැකි විම

සුවිශේෂී පියවරයක් ලෙස හඳුන්වා දිය හැකිය. ඒ පිළිබඳ ආබාධ සහිත පුද්ගල සංවිධානවල ක්‍රියාකාරී නායකයින් 50ක් පමණ දැනුම්වත් කිරීමට කටයුතු කරන ලදි. ඡන්ද හිමියන්ගේ නාම ලේඛනය ප්‍රතිශෝධන ක්‍රියාවලියේ ඇති වැදගත් කම පිළිබඳ බ්‍රේල් මාධ්‍යයෙන් මුද්‍රණය කරන ලද අත්පත්‍රිකා දෘශ්‍යාබාධ සහිත සිසුන් ඉගෙන ගන්නා ලද පාසල් හා දෘශ්‍යබාධ සහිත පුද්ගලයින්ගේ සංවිධාන අතර බෙදා දීමට ක්‍රියාකර ඇත.

තවද ඡන්ද මධ්‍යස්ථානවල භෞතික ප්‍රවේශය සකස් කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් ගනුලැබූ තවත් වැදගත් තීරණයක් ලෙස කෑගල්ල දිස්ත්‍රික්කයේ යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ සියලුම ඡන්ද මධ්‍යස්ථානවල ප්‍රවේශ විගණනයට ලක් කිරීම පෙන්වා දිය හැකිය. එහිදී ඡන්ද මධ්‍යස්ථාන 69ක ප්‍රවේශ පහසුකම් සොයාබැලීමට හැකි වූ අතර මැතිවරණයක දී භාවිතයට ගනු ලබන සමස්ථ ඡන්ද මධ්‍යස්ථාන පිළිබඳ අවබෝධයක් ඒ තුළින් ලබාගැනීමට හැකි විය. ඒ අනුව ආබාධ සහිත තැනැත්තන් හා ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සිය ඡන්දය සළකුණු කිරීමේදී ඡන්ද මධ්‍යස්ථානය තුළ දී සිදුවන අපහසුතාවයන් හඳුනාගැනීමට හැකි වූ අතර සමස්ථයක් ලෙස දිවයිනේ අනෙකුත් ප්‍රදේශවල පවතින තත්ත්වය පිළිබඳ ගත යුතු පියවර හා විකල්ප යෝජනා කෙරෙහි අවධානය යොමු කිරීමට එය මහඟු පිටුවහලක් විය.

2019 ජනාධිපතිවරණයේදී සියලු දෙනාම ඇතුළත් වූ මැතිවරණ ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම සඳහා සුවිශේෂී පියවරයන් රැසයක් ගන්නා ලදි. ඒ අතර කථන හා ශ්‍රවණාබාධ සහිත තැනැත්තන්ගේ සංනිවේදන බාධාව ඉවත් කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද විශේෂ පණිවුඩ හා ජනාධිපති අපේක්ෂකයින්ගේ තොරතුරු සංඥා භාෂා පරිවර්ථන සහිතව විඩියෝ ඉදිරිපත් කිරීම සිදු කරන ලදි. තවද මැතිවරණ ක්‍රියාවලියේදී ආබාධ සහිත තැනැත්තන් සඳහා කොමිෂන් සභාව විසින් සපයා තිබූ පහසුකම් පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් මාලාවක් ආබාධ සහිත පුද්ගල සංවිධානවල සහයෝගය ඇතිව දියත් කරන ලදි. ඒ අනුව මඩකලපුව, බුත්තල, තංගල්ල, අකුරැස්ස සහ කොළඹ කේන්ද්‍ර කරගනිමින් මැතිවරණ සමයේදී ආබාධ සහිත ඡන්දදායකයන්ගේ දැනුම්වත්භාවය වැඩිකිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. ඒ සඳහා ආබාධ සහිත තැනැත්තන් 300කට වඩා වැඩි සංඛ්‍යාවක් සහභාගී වූ අතර ඔවුන්ගේ දැනුම්වත්භාවය ඉහළ නැංවීම සඳහා මැතිවරණ ක්‍රියාවලියට අදාල අත්පත්‍රිකා හා පොස්ටර් ද මුද්‍රණය කර බෙදා හරින ලදි.

18.7 පෞර

ප්‍රජාතන්ත්‍රවාදය, ජනතා පරමාධිපත්‍යය හා සර්වජන ඡුන්ද බලය පිළිබඳව මහජනතාව දැනුම්වත් කරමින් ශක්තිමත් සිවිල් ජන පවුරක් බිහි කරලීම් වස් පූර්වයෙහි ගන්නා ලද උත්සහයට පරිබාහිරව ''පෞර'' නමින් කෙටි චිත්‍රපට උළෙළක් ද පැවැත්වීමට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කළ අතර මෙම නවමු වැඩසටහන විචෘත හා පාසල් යන අංශ සඳහා සංවිධානය කරන ලදී. පාසල් ළමුන් ද ඉලක්කගත කණ්ඩායමක් වූ හෙයින් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහාය ද තාක්ෂණික වැඩසටහනක් හෙයින් ඒ පිළිබඳව කටයුතු කිරීමට ප්‍රමුඛ හා වඩාත් සුදුසු ම ආයතනය ලෙස හඳුනාගත් කැලණිය විශ්ව විද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ ද සහාය ලබා ගන්නා ලදී.

පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්, විශ්ව විද්‍යාල ශිෂ්‍ය ප්‍රජාව, කලා ක්ෂේත්‍රයේ ප්‍රාමාණිකයන් සහ තරුණ චිත්‍රපටකරුවන් ප්‍රජාතන්ත්‍රවාදයේ පණිවුඩය සමාජය වෙත ප්‍රවිශ්ට කරවන පාර්ශ්වකරුවන් ලෙස දායක කර ගැනීම මගින් ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධව ජනතාව දැනුම්වත් කළ හැකි කෙටි චිත්‍රපට මාලාවක් නිර්මාණය කිරීම සහ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව සමාජය තුළ කතිකාවතක් ගොඩනැගීම සඳහා නව නිර්මාණශීලී ප්‍රවේශයක් ඇති කිරීම මෙම කෙටි චිත්‍රපට උළෙළෙහි ප්‍රධාන අරමුණු විය.

මෙම උළෙලට සමගාමීව ඒ පිළිබඳ කරුණු අළලා නිකුත් කෙරෙන පුවත්පත් අතිරේකය තුළින් ලංකාව පුරා ජනතාව දැනුම්වත් වීම මහත් ප්‍රහර්ශයකි. මෙම චිත්‍රපට උළෙල යූ ටියුබ් (You Tube)

හා මුහුණු පොතට (Facebook) ඇතුළත් කිරීමට සංවිධායකයින් පියවර ගැනීම මැතිවරණ කොමිෂන් සභාව ජාත්‍යන්තරයට පියමං කිරීමක් වැන්න.

2019 පෙබරවාරි මස රජයේ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේදී හා යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පැවති ප්‍රවෘත්ති සාකච්ඡා මගින් පෞර කෙටි චිත්‍රපට උළෙළ සම්බන්ධව මාධ්‍ය දැනුවත් කරන ලද අතර පෞර පෝස්ටරය ද එලිදක්වන ලදි.

''පෞර'' කෙටි චිත්‍රපට සඳහා වන නිර්නායකය වූයේ, ප්‍රජාතන්ත්‍රවාදයයි. විවෘත අංශය හා පාසැල් අංශය යන කොටස් දෙකෙන් යුක්තවූ අතර, චිත්‍රපටයේ උපරිම කාලසීමාව විනාඩි 05ක් වූ අතර, ඩිජිටල් තාක්ෂණය යොදා ගැනීම අවැසි විය.

2019 වර්ෂයේ ජන්ද හිමියන්ගේ දිනය වෙනුවෙන් පැවැත්වූ වැඩසටහන් වලට සමගාමීව තරුණ ප්‍රජාව තුළ ප්‍රජාතන්ත්‍රවාදය සර්වජන ජන්ද බලය හා ජනතා පරමාධිපත්‍ය පිළිබඳව දැනුවත් කිරීමද පෞර කෙටි චිත්‍රපට උළෙල යටතේ දිවයිනේ සියළුම පළාත් ආවරණය වන පරිදි පාසල් තුළ කෙටි චිත්‍රපට නිර්මාණය හා ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ වැඩමුලු පවත්වන ලදි. මෙහි කෙටි චිත්‍රපට දර්ශන හා ත්‍යාග ප්‍රධානත්වයන් 2019.09.21 දින තරංගනී රංගශලවේ පවත්වන ලදි. මෙම චිත්‍රපට උළලේ පාසල් අංශයේ හොඳම චිත්‍රපටය හා තරගාවලියේ ජනප්‍රියම චිත්‍රපටිය ලෙස නාත්තන්ඩිය දම්මිස්සර විද්‍යාලය විසින් ඉදිරිපත් කරන ලද තැප්‍රෝබානා කෙටි චිත්‍රපටය විසින් දිනා ගන්නා ලදි. විවෘත අංශයේ විශේෂ සම්මාන 07 ක් ද පිරිනමන ලදි.

18.8 වාර්ෂික පර්යේෂණ සැසිය 2019

ප්‍රජාතන්ත්‍රවාදය හා සබැඳි පර්යේෂණ සංස්කෘතිය වර්ධනය කිරීමේ මූලික පරමාරථයෙන් මැතිවරණ කොමිෂන් සභාව මගින් පළමු වරට සංවිධානය කරන ලද වාර්ෂික පර්යේෂණ සැසිය 2019 සැප්තැම්බර් මස 21 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවට අනුබද්ධ ආයතනයක් වන රාජගිරිය බැංකු විදු පියස ශ්‍රවනාගාරයේ දී සාර්ථක ව පවත්වන ලදී. පර්යේෂණ සැසියෙහි ප්‍රධාන දේශනය මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති මහින්ද දේශප්‍රිය මහතා විසින් සිදු කළ අතර, මුදල් අමාත්‍යාංශයෙහි හා මහා භාණ්ඩාගාරයෙහි ලේකම්වරයා වශයෙන් කටයුතු කළ ආචාර්ය ආර්.එස්. සමරතුංග මහතා විසින් ආරාධිත දේශනය සිදු කරන ලදී.

සර්වජන ජන්දබලය සුරකින දේශයක් යන ප්‍රධාන තේමාව පදනම් කර ගනිමින් විශ්ව විද්‍යාල ආචාර්යවරුන්, විද්‍යාර්ථයන්, උපාධි අපේක්ෂකයන් මෙන් ම විවිධ ක්ෂේත්‍රයන්හි ප්‍රවීනයන් විසින් ඉදිරිපත් කරන ලද සංක්ෂිප්ත පර්යේෂණ ලිපි 145 ක් ඉදිරිපත් කර තිබුණි. පර්යේෂණ ලිපි ඇගයීම් කටයුතු කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව විශ්වවිද්‍යාල ආචාර්යවරුන් 10 දෙනෙකුගෙන් සමන්විත විද්වත් කමිටුවක් මඟින් සිදු කරන ලදී. මෙම පර්යේෂණ සැසිය සඳහා සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය ත්‍රිත්වයෙන් ම පර්යේෂණ ලිපි ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දුන් අතර එම සියලු භාෂාවන්ගෙන් ඉදිරිපත් කරන ලද ප්‍රශස්ත පර්යේෂණ ලිපි 66 ක් ඇතුළත් ග්‍රන්ථය 2019 සැප්තැම්බර් 21 වන දින පැවති පර්යේෂණ සැසියෙහි දී ප්‍රකාශයට පත්කරන ලදී.

19. අන්තර්ජාතික දින සැමරුම්

මැතිවරණ කොමිෂන් සභාවේ සිවු අවුරුදු උපාය මාර්ගික සැළැස්මට අනුව මැතිවරණ ක්‍රියාවලිය හා සබැඳි අන්තර්ජාතිකව සමරනු ලබන දින 20 කට වැඩි සංඛ්‍යාවක් තෝරා ගෙන ඒ මඟින් ප්‍රජාතන්ත්‍රවාදය, සර්වජන ජන්ද බලය හා සබැඳි කරුණු පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට තීරණය කරන ලදි.

19.1 නිර්ප්‍රචන්ඩත්වය හා සාමය පිළිබඳ පාසල් දිනය

ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමේ දී ප්‍රචණ්ඩත්වයෙන් වැළකීමේ වැදගත්කම පාසල් ප්‍රජාව වෙත අවධාරණය කිරීමේ අරමුණින් මේ සම්බන්ධයෙන් සැමරුම් වැඩසටහන් පැවැත්වේ. අවිහිංසාව, සාකච්ඡාව හා සම්මුතිය මඟින් ප්‍රජාත්නත්‍රවාදය තහවුරු කිරීමේ අගය මෙම දින සැමරුමෙන් නිරූපණය වේ. නිර්ප්‍රචණ්ඩත්වය හා සාමය පිළිබඳ පාසල් දින සැමරුම 2019 වර්ෂයේ ජනවාරි 30 වැනි දින දිස්ත්‍රික් මට්ටමෙන් පැවැත්වීමට කටයුතු යොදවන ලදි. ප්‍රධාන උත්සවය රත්නපුර දිස්ත්‍රික්කයේ පැවැත්වීමට කටයුතු කරන ලදි.

19.2 ජාත්‍යන්තර මව්භාෂා දිනය

සෑම වර්ෂයකම පෙබරවාරි මස 21 වන දින ජාත්‍යන්තර මව්භාෂා දිනය සමරනු ලැබේ. නොයෙකුත් සමාජ මට්ටම්වලට අයත් භාෂාවන්, සංස්කෘතික ලක්ෂණ, ගුණාංග වැනි විශේෂත්වයන් ආරක්ෂා කරගැනීමේ අරමුණින් යුතුව මෙම ජාත්‍යන්තර දිනය සමරනු ලැබේ. ප්‍රජාතන්ත්‍රවාදය, ප්‍රජා අයිතිය සහ සර්වජන ඡන්ද බලය වැනි කරුණු මත මැතිවරණ කොමිෂන් සභාව නිරතුරුවම කටයුතු කරන බැවින්, සෑම තනි පුද්ගලයෙකුම තම තමන්ගේ අයිතිවාසිකම් දිනා ගැනීම පිළිබඳ වැඩි අවධානය යොමු කර, මෙම වැඩසටහන ක්‍රියාත්මක කර ඇත.

19.3 ජාත්‍යන්තර කාන්තා දිනය

කාන්තාවන්ගේ අභිමානය සහ විශේෂත්වය රැක ගැනීම සඳහා ද සමාජයේ උන්නතිය උදෙසා ද කාන්තාවන්ගේ සහයෝගීතාවය සහ සහභාගීත්වය පිළිබඳ මුළු ලොවට කියා පෑම සඳහා මෙම ජාත්‍යන්තර කාන්තා දිනය සෑම වර්ෂයකම මාර්තු මස 8 වැනි දින ලොව පුරා සමරනු ලැබේ. ඒ අනුව, ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 52.6% ක් කාන්තාවන් වන අතර සමාජයේ වැදගත් ස්ථානයක් ගන්නා කාන්තාවන් තමන්ගේ අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා ද ඔවුන් මුහුණ දී සිටින අභියෝගයන් ජය ගැනීම සඳහා ද කාන්තාවන් සමාජය තුළ නායකත්වය දරමින් දේශපාලනයට පිවිසීමේ අවශ්‍යතාවය මුල් කර ගනිමින්, ‘‘කෝටාවෙන් ඔබ්බට‘‘ යන තේමාව යටතේ වැඩමුළු කිහිපයක් මැතිවරණ කොමිෂන් සභාව විසින් දිස්ත්‍රික් මට්ටමින් පවත්වන ලදි.

19.4 ජාත්‍යන්තර තරුණ දිනය

මැතිවරණ සඳහා වූ ජාත්‍යන්තර තරුණ කමිටුව (Youth Committee on Elections - Sri Lanka) සමඟ එක්වී මැතිවරණ කොමිෂන් සභාව විසින් තරුණ දිනයට සමගාමීව “Innovation for Youth Civic and Democratic Engagement” යනුවෙන් වැඩසටහන් ගාල්ල, කිලිනොච්චිය, මන්නාරම, වවුනියාව, මුලතිව් හා කුරුණෑගල දිස්ත්‍රික්කවල පවත්වන ලදි.

19.5 ආබාධ සහිත පුද්ගලයින්ගේ ජාත්‍යන්තර දින සැමරුම

2019 වර්ෂයේ තේමාව - "2030 සංවර්ධන ඉලක්කයන් ලභා කර ගැනීම සඳහා ආබාධ සහිත තැනැත්තනගේ සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන්ගේ නායකත්වය"
උක්ත තේමාව පෙරදැරු කරගෙන මැතිවරණ කොමිෂන් සභාව විසින් 2019 දෙසැම්බර් මස 03 වන දිනට යෙදුන ආබාධ සහිත තැනැත්තනගේ ජාත්‍යන්තර ජන සැමරුමක් British council Sri Lanka හා Muslim Aid Sri Lanka සංවිධානවල සහයෝගීත්වය ද සමඟ පවත්වන ලදි.
අරමුණු -

- ආන්තිකරණයට ලක් වූ කණ්ඩායමක් වන ආබාධ සහිත තැනැත්තන්ගේ දේශපාලන සහභාගීත්වය ඉහල නැංවීම සඳහා දැනුම්ත් කිරීම හා සංවේදි කිරීම
- ආබාධ සහිත තැනැත්තන් ඡන්දය සළකුණු කිරීමේදි ඇති බාධාවන් පිළිබඳ අනාබාධිත ප්‍රජාවට අත්දැකීමක් ලබාදීම

- ආබාධ සහිත තැනැත්තන්ගේ හැකියාවන් සමාජගත කරමින් ඔවුන් පිළිබඳ අනුකම්පාවෙන් නොව මානව විවිධත්වයේ කොටසක් ලෙස පිළිගැනීමට ඉලක්කගත කණ්ඩායම සංවේදි කිරීම.

ඉලක්කගත කණ්ඩායම (50ක්)

- විශ්වවිද්‍යාල සිසුන්
- ආබාධ සහිත පුද්ගල සංවිධාන ක්‍රියාකාරිකයින්
- තරුණ තරුණියන්
- සිවිල් සංවිධාන ක්‍රියාකාරිකයින්

ඊට අමතරව, ලෝක සමාජ සාධාරණත්ව දිනය, ජනවාර්ගික වශයෙන් වූ වෙනස්කම් තුරන් කිරීමේ ජාත්‍යන්තර දිනය, ලෝක මහජන සේවා දිනය සහ ජාත්‍යන්තර තරුණ දිනය සඳහා විවිධ වැඩසටහන් පවත්වන ලදි.

20. නීති කටයුතු

❖ නඩු කටයුතු

2019 වර්ෂයට පෙර අවසන් නොවූ නඩු සංඛ්‍යාව - 48

2019 වර්ෂයේ ලැබුණු නඩු - 38

2019 වර්ෂයේ දී තීන්දු ලද නඩු සංඛ්‍යාව - 20

දැනට විභාග වෙමින් පවතින නඩු සංඛ්‍යාව - 66

කටයුතු කරන ලද නඩු පිළිබඳ තොරතුරු ***සටහන් අංක XIV*** ලෙස යා කර ඇත.

20.1 නීති උපදෙස් ලබා ගැනීම හා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යවන ලද ලිපි

2019 වර්ෂයේ දී නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් උපදෙස් විමසමින් ලිපි 10 ක් යොමු කර ඇත.

එම ලිපි පහත කරුණු සම්බන්ධයෙන් උපදෙස් විමසමින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

- නිල කාලය අවසන් පළාත් සභාවල ඡන්ද විමසීම සම්බන්ධව විමසීම.
- පළාත් පාලන ආයතනවල සභිකධුර පුරප්පාඩුවලට අදාළව ගොනු කර ඇති නඩු සඳහා උපදෙස් විමසීම.
- දේශපාලන පක්ෂ ලියාපදිංචිය හා දේශපාලන පක්ෂ මුදලට විකිණීම සම්බන්ධව විමසීම.
- මැතිවරණ නීති සංශෝධනය හා මැතිවරණ ආරවුල් කළමනාකරණය කිරීම ආශ්‍රිතව පවතින නීතිමය තත්ත්වයන් පිළිබඳව විමසීම.
- මීට පෙර නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් උපදෙස් ඉල්ලා ඇති නමුත් පිළිතුරු නොලද ලිපි සම්බන්ධව කඩිනම් අවධානය යොමු කොට පිළිතුරු ලබා දෙන ලෙසට ඉල්ලීම.
- පළාත් සභා ඡන්ද විමසීම සම්බන්ධව පවතින බලාත්මක නීතිය කවරේද යන්න පිළිබඳව ගරු ජනාධිපතිතුමා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය විමසීමට අදාළව මැතිවරණ කොමිෂන් සභාවට අදාළව කරුණු දක්වමින් ලිපියක් යොමු කිරීම.
- ඇල්පිටිය ප්‍රාදේශීය සභා ඡන්ද විමසීමට අදාළව අධිකරණ ක්‍රියා මාර්ග කඩිනම් කරන ලෙසට ඉල්ලීම.

- මැතිවරණ කාල සීමාව තුල දී නීත්‍යානුකූල මැතිවරණ රාජකාරි වල යෙදිමේදී බිය වැද්දීම හා තර්ජනය කිරීම් සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ සමාජික මහාචාර්ය රත්නජීවන් එච්. හූල් මහතා විසින් ගොනු කර ඇති BR 201/2018 අංක දරන නඩුව සම්බන්ධව නීතිමය පියවර කඩිනම් කරන ලෙසට ඉල්ලීම.
- මාධ්‍ය උපමාන සහ විධාන උල්ලංඝනය කිරීම සම්බන්ධව මැතිවරණ කොමිෂන් සභාවට ගත හැකි නෛතික ක්‍රියා මාර්ග පිළිබඳව විමසීම.

21. නීති සංශෝධනවලට අදාළ කාර්යයන්

- මැතිවරණ විශේෂ විධිවිධාන පනතට අදාළව පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් කෙටුම්පත් සැකසීමට අදාළ කටයුතු සිදු කර ඇත.
  - ඇප තැබීම සම්බන්ධව
  - තැපැල් ඡන්ද අයිතිය පුළුල් කිරීම සම්බන්ධව

- ඉදිරියේ දී පැවැත්වීමට නියමිත ඡන්ද විමසීම්වලට අදාළව ඇප මුදල් සංශෝධනයට සම්බන්ධව පිළිගත් දේශපාලන පක්ෂවල යෝජනා පිලිබඳව විමසමින් ලිපියක් සියලුම පිළිගත් දේශපාලන පක්ෂ වෙත 2019.11.26 දිනැතිව යොමු කරන ලදී.

- ඉදිරියේ දී සිදු කිරීමට අපේක්ෂිත නීති සංශෝධන පිළිබඳ සාකච්ඡාවක් අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ දී 2019 අවසන් කාර්තුවේදී පැවැත්විය. ඒ සඳහා නීති අංශය නියෝජනය කරමින් අතිරේක මැතිවරණ කොමසාරිස් (නීති හා විමර්ශන) , අධ්‍යක්ෂ (නීති) සහ සහකාර මැතිවරණ කොමසාරිස් (නීති) සහභාගී විය.

- 1988 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත සංශෝධන සිදු කිරීමට අවශ්‍ය පියවර ගැනීම සහ ඒ සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම. එමෙන්ම එකී සංශෝධන ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාත්‍රයෙන් යුතු කෙටුම්පත් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම. (මේ වන විට එකී සංශෝධන පනත් කෙටුම්පත 2019.09.18 දිනැතිව ගැසට් පත්‍රයේ මුද්‍රණය කර ඇත.)

21.1 මැතිවරණ වියදම් පාලනය සඳහා වන නීති සම්පාදනය

මැතිවරණ වියදම් පාලනය සඳහා වන නීති සම්පාදනයට අදාළව මැතිවරණ කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනා ඇතුළත්ව සකස් කරන ලද මැතිවරණ වියදම් පාලනය සම්බන්ධ නීති සංශෝධන කෙටුම්පත, නීති කෙටුම්පත් සම්පාදක සහ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදී. එම කෙටුම්පත නව කැබිනට් මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කිරීම සම්බන්ධව අතිගරු ජනාධිපතිතුමාගේ කාරුණික අවධානයට යොමු කරන ලෙස දන්වමින් ජනාධිපති ලේකම් වෙත 2020.01.13 දිනැතිව ලිපියක් මේ වන විට යොමු කර ඇත.

21.2 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත

1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත සංශෝධනය කිරීම සම්බන්ධව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව, එම සංශෝධන පනත ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල බවට නීතිපතිවරයා විසින් අප වෙත දන්වා එවා ඇත. එම සංශෝධිත කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව 2019.09.18 දිනැතිව එම කෙටුම්පත ගැසට් පත්‍රයේ පල කර ඇත. ගැසට් පත්‍රයේ පල කිරීම සම්බන්ධව 2019.09.18 දිනැති ලිපිය මඟින් ජනාධිපති ලේකම්වරයා ද දැනුම්වත් කර ඇත.

ඉන් අනතුරුව ගැසට් පත්‍රයේ පල කර ඇති පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ඉල්ලමින් ජනාධිපති ලේකම් වෙත ලිපියක් 2020.01.16 දිනැතිව යොමු කර ඇත. මේ වන විට පාර්ලිමේන්තු සභානායක කාර්යාලය විසින් හා අග්‍රාමාත්‍ය ලෙක්ම් කාර්යාලය වෙතින් එකී කෙටුම්පත පාර්ලිමෙන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම සම්බන්ධව ඉල්ලීම් ජනාධිපති ලේකම් වෙත ඉදිරිපත් කර ඇති බව 2020.02.24 දිනැති ලිපිය මගින් මැතිවරණ කොමිෂන් සභාව වෙත දන්වා ඇත.

21.3 අනෙකුත් මැතිවරණ නීති සංශෝධන

කඩිනමින් සිදු කළ යුතු මැතිවරණ නීති සංශෝධන (ප්‍රතිසංස්කරණ) පිළිබඳව දන්වමින් ජනාධිපති ලේකම් වෙත ලිපියක් 2020.02.12 දිනැතිව යොමු කර ඇත. එකී ලිපිය මඟින් 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදංචි කිරීමේ පනත සංශෝධනය සම්බන්ධව, මැතිවරණ වියදම් පාලනය පිළිබඳ කෙටුම්පත් සමබන්ධව මෙන්ම නිදහස් සහ සාධාරණ මැතිවරණයක් උදෙසා පාර්ලිමේන්තු මැතිවරණ නීතියේ කළ යුතු සංශෝධන දක්වා ඇත. එකී සංශෝධන අතරට ඇප මුදල් සංශෝධනය, තැපැල් ඡන්ද හිමිකම පුළුල් කිරීම, විශේෂිත ඡන්ද මධ්‍යස්ථාන පිහිටුවීම, කාන්තා නියෝජනය ශක්තිමත් කිරීම, ආබාධිත ඡන්දහිමියන්ගේ ඡන්ද පහසුකම් සැලසීම, සමාන ප්‍රචාරක අවස්ථා ලබා දීම ආදී යෝජනා ඇතුළත් කරන ලදී. එකී යෝජනා සම්බන්ධව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට ක්‍රියා කරන ලෙසත්, මේ සම්බන්ධව පාර්ලිමේන්තු තේරීම්කාරක සභාවක් පත් කරන ලෙසත් වැඩිදුරටත් ඉල්ලා ඇත.

22. මානව හිමිකම් කොමිෂන් සභාව, අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව, පොලිස් කොමිෂන් සභාව, අධිකරණ කොමිෂන් සභාව සම්බන්ධ කටයුතු

මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2019.04.09 දිනැතිව අප වෙත එවන ලද HRC/730/2019 පැමිණිල්ල සම්බන්ධව අවශ්‍ය තොරතුරු නුවරඑළිය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙතින් ලබා ගෙන 2019.04.30 දිනැති ලිපිය මඟින් පිළිතුරු යොමු කර ඇත.

23. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සම්බන්ධ කටයුතු

- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් එවන ලද ලිපියකට අනුව 2015 වර්ෂයේ නාගරික සංවර්ධන අධිකාරියේ සිට ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවට කරනු ලැබූ අනුයුක්ත කිරීමට අදාළ විමර්ශනයක් සම්බන්ධව ලේඛන විමසා සිටි අතර, ඒ සඳහා අවශ්‍ය ලේඛන යොමු කිරීම.

- 1994 අංක 19 අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ සිදු කරන ලද විමර්ශනයකට අදාළව නියෝජ්‍ය අමාත්‍ය සුජීව සේනසිංහ මැතිතුමාගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දෙන ලෙසට ඉල්ලමින් එවන ලද 2019.09.02 දිනැති ලිපිය සඳහා, එකී වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දීම සම්බන්ධව ක්‍රියා කිරීම.

- අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මොහමඩ් සාෆි යන අයගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා ගැනීම සම්බන්ධව කටයුතු කිරීම.

24. අධිකරණ සේවා කොමිෂන් සභාව සම්බන්ධ කටයුතු

සිරදඬුවම් විඳින පුද්ගලයින් පිළිබඳව තොරතුරු වාර්තා කිරීම සම්බන්ධව ලිපි යොමු කිරීම.

වෙනත්

බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විමර්ශන කටයුත්තකට අදාළව දේශපාලන පක්ෂයක් සම්බන්ධව තොරතුරු ලබා ගැනීමට අදාළව කටයුතු කිරීම.

25. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනතට අදාළව තොරතුරු ලබා දීම්

විවිධ පාර්ශව වෙත තොරතුරු ලබා දීම

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනතට අදාළව විවිධ පාර්ශව විසින් 2019 වර්ෂයේ දී තොරතුරු ඉල්ලීම් 125 ක් ඉදිරිපත් කර ඇත. එකී තොරතුරු ඉල්ලීම් අතරින් 100 ක් සඳහා 2019.12.31 දින වන විට තොරතුරු ලබා දීම සම්පූර්ණ කර ඇත.

26. කාර්ය මණ්ඩල තොරතුරු

26.1 රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය.

- 2019 වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ කළමනාකරණ සේවා නිලධාරීන් 07 නෙකු මැතිවරණ කොමිෂන් සභාවෙන් පිටතට ස්ථාන මාරු ලබා ඉවත්ව ගිය අතර, ඔවුනගේ අනුප්‍රාප්තික නිලධරයන් 07 දෙනෙකු සේවය සඳහා වාර්තා කරන ලදි.
- අන්තර් දෙපාර්තමේන්තු ස්ථාන මාරුවීම් යටතේ මෙම කොමිෂන් සභාවට පැමිණිමට කැමැත්ත පළ කළ කළමනාකරණ සේවා නිලධරයන් 16 දෙනෙකු මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය මත ස්ථාන මාරු කර ගන්නා ලදී.
- මැතිවරණ කොමිෂන් සභාවෙන් පිටතට අනුප්‍රාප්තිකයින් රහිතව කළමනාකරණ සේවයේ නිලධරයන් 03 නෙකු ස්ථාන මාරු ලබා යන ලදී.

26.2 ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය

- ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණියේ පැවති පුරප්පාඩු පිරවීම සඳහා 2019.07.01 දින සිට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණියේ නවක නිලධරයන් 13 දෙනෙකු රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙතින් ලබා දෙන ලදි.

26.3 රියදුරු සේවය

- අන්තර් දෙපාර්තමේන්තු ස්ථාන මාරුවීම් යටතේ මෙම කොමිෂන් සභාවට පැමිණිමට කැමැත්ත පළ කළ රියදුරු සේවයේ දෙදෙනෙකු මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය මත ස්ථාන මාරු කර ගන්නා ලදී.

26.4 කාර්යාල සේවක සේවය

- මැතිවරණ කොමිෂන් සභාවෙන් පිටතට අනුප්‍රාප්තිකයින් රහිතව කා.සේ.සේවයේ දෙදෙනෙකු සඳහා ස්ථාන මාරු ලබා යන ලදී.

27. තනතුරු ඇති කිරීම

- මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/1288 Vol.1 හා 2019.09.06 දිනැති ලිපියට අනුව මැතිවරණ කොමිෂන් සභාව සඳහා දෙපාර්තමේන්තුගත (III/II) නීති නිලධාරී තනතුරු 01ක් අනුමතවී ඇත.

- මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/1288 Vol.1 හා 2019.09.30 දිනැති ලිපියට අනුව මැතිවරණ කොමිෂන් සභාව සඳහා තාවකාලික පදනමින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී තනතුරු 01ක් අනුමතවී ඇත.

28. උසස් කිරීම්

- රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/APP/7/1029/2016 හා 2019.08.16 දිනැති ලිපියෙන් 2018.05.13 දින සිට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියට පත් කරන ලද ටී. ශක්තිරාජ් මහතා 2019.09.16 දින සිට මැතිවරණ කොමිෂන් සභාවේ වවුනියාව දිස්ත්‍රික් පරිපාලන නිලධාරී වශයෙන් පත් කරන ලදී.

- රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/APP/7/1028/2016 හා 2019.08.20 දිනැති ලිපියෙන් 2018.03.25 දින සිට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියට පත් කරන ලද ඩී.එල්.එස්. දීපිකා මහත්මිය 2019.09.16 දින සිට මැතිවරණ කොමිෂන් සභාවේ ලේකම් කාර්යාලයේ පරිපාලන නිලධාරී වශයෙන් පත් කරන ලදී.

- රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/APP/7/1028/2016 හා 2019.08.11 දිනැති ලිපියෙන් 2018.05.13 දින සිට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියට පත් කරන ලද එස්.කේ. අබේරත්න මෙනවිය 2019.09.17 දින සිට මැතිවරණ කොමිෂන් සභාවේ කොළඹ දිස්ත්‍රික් පරිපාලන නිලධාරී වශයෙන් පත් කරන ලදී.

- ප්‍රධාන කාර්යාලයේ ගණකාධිකාරී (ගෙවීම්) වශයෙන් සේවය කළ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ II පන්තියේ එස්.ටී.බුලත්සිංහල මහතා 2019.10.01 දින සිට ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරෙහි වැඩ බැලීමට පත් කරන ලදී.

29. නව පත් කිරීම්

- රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ අංක MPubAd/AcSD/05/2464 හා 2018.11.27 දිනැති ලිපිය මඟින් වහාම ක්‍රියාත්මක වන පරිදි මෙම කොමිෂන් සභාවට ස්ථාන මාරු කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III පන්තියේ එස්.ටී.බුලත්සිංහල මහතා 2019.01.04 දින සිට ගණකාධිකාරී (ගෙවීම්) වශයෙන් පත් කරන ලදී.

- රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ අංක 75/10/4337 හා 2019.01.16 දිනැති ලිපිය මඟින් වහාම ක්‍රියාත්මක වන පරිදි මෙම කොමිෂන් සභාවට ස්ථාන මාරු කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ එම්.එම්.එස්.කේ.බණ්ඩාර මාපා මහතා 2019.01.29 දින සිට මැතිවරණ කොමිෂන් සභාවේ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (පාර්ලිමේන්තු මැතිවරණ) වශයෙන් පත් කරන ලදී.

- රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ අංක R/6/1/(III)/2012 හා 2019.04.08 දිනැති ලිපිය මඟින් 2019.04.09 දින සිට මෙම කොමිෂන් සභාවට අනුයුක්ත කරන ලද ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I/III පන්තියේ ජේ.ඒ.එස්.එස්.ජයසිංහ මහතා 2019.04.09 දින සිට සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) වශයෙන් පත් කරන ලදී.

- ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 1/104/622 (G) හා 2019.06.07 දිනැති ලිපිය මඟින් වහාම ක්‍රියාත්මක වන පරිදි මෙම කොමිෂන් සභාවට ස්ථාන මාරු කරන ලද භාෂා පරිවර්තන සේවයේ I

පන්තියේ එම්.ටී.සෙයිනූර් රිෆා මහතා 2019.06.10 දින සිට මැතිවරණ කොමිෂන් සභාවේ භාෂා පරිවර්තක(සිංහල/ දෙමළ) වශයෙන් පත් කරන ලදී.

- ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 1/104/812 (G) හා 2019.06.10 දිනැති ලිපිය මඟින් වහාම ක්‍රියාත්මක වන පරිදි මෙම කොමිෂන් සභාවට ස්ථාන මාරු කරන ලද භාෂා පරිවර්තන සේවයේ I පන්තියේ ඒ.එස්.එම්.ජිෆ්රි මහතා 2019.06.12 දින සිට මැතිවරණ කොමිෂන් සභාවේ භාෂා පරිවර්තක(සිංහල/ දෙමළ) වශයෙන් පත් කිරීමට ක්‍රියාකර ඇත.

- රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ අංක 76/1/15/විශේෂ X වෙළුම හා 2019.08.15 දිනැති ලිපියෙන් මෙම කොමිෂන් සභාවට අනුයුක්ත කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ එම්.වර්ණකුලසූරිය මහතා 2019.09.01 දින සිට අතිරේක මැතිවරණ කොමසාරිස් (පළාත් පාලන මැතිවරණ) වශයෙන් පත් කරන ලදී.

- රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ අංක 76/1/15/විශේෂ X වෙළුම හා 2019.07.24 දිනැති ලිපියෙන් මෙම කොමිෂන් සභාවට අනුයුක්ත කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ බී.එම්.පී.ජී.පී.වී. බණ්ඩාර මහතා 2019.09.01 දින සිට අතිරේක මැතිවරණ කොමසාරිස් (පාලන) වශයෙන් පත් කරන ලදී.

- රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ අංක 76/1/15/විශේෂ X වෙළුම හා 2019.07.24 දිනැති ලිපියෙන් මෙම කොමිෂන් සභාවට අනුයුක්ත කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ බී.පී.සී. කුලරත්න මහතා 2019.09.01 දින සිට අතිරේක මැතිවරණ කොමසාරිස් (නීති හා විමර්ශන) වශයෙන් පත් කරන ලදී.

- රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ අංක MPubAd/AcSD/05/2498 හා 2019.06.25 දිනැති ලිපිය මඟින් වහාම ක්‍රියාත්මක වන පරිදි මෙම කොමිෂන් සභාවට අනුයුක්ත කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III පන්තියේ පී.ආර්.බී.සුමංගලී මෙනවිය 2019.10.01 දින සිට ගණකාධිකාරී (ගෙවීම්) වශයෙන් පත් කරන ලදී.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ඇති කළ ව්‍යවස්ථාපිත තනතුරක් වන මැතිවරණ කොමිෂන් සභාවේ කොමසාරිස් ජනරාල් ධුරයට පත් කිරීමේ පූර්වාදර්ශය වූයේ මැතිවරණ දෙපාර්තමේන්තුවේ / මැතිවරණ කොමිෂන් සභාවේ දීර්ඝතම කාලයක් සේවය කළ ජ්‍යෙෂ්ඨතම මාණ්ඩලික නිලධරයා එම තනතුරට පත්කිරීමයි. මීට පෙර අවස්ථාවන් තුනකදී, එනම් පිළිවෙලින් 2017.11.25 දින ආර්.එම්.ඒ.එල්.කේ. රත්නායක මහතාද, 2019.09.14 දින එම්.ඒ.පී.සී පෙරේරා මහතාද, 2019.01.11 දින එම්.එම්. මොහමඩ් මහතාද මැතිවරණ කොමසාරිස් ජනරාල් ධුරයට පත් කරන ලදී. ඊට වෙනස් මගක් අනුගමනය කරමින් මැතිවරණ කොමසාරිස් ජනරාල් ධුරයට පත්කිරීම සම්බන්ධයෙන් 2019.09.03 දින මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පළ කරන ලද දැන්වීමක් මඟින් අයදුම්පත් කැඳවීමක් සිදුකරන ලදී. ඊට අයදුම්පත් ඉදිරිපත් කරන ලද නිලධාරීන් තිදෙනෙකු, පස් දෙනෙකුගෙන් සැදුම්ලත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සම්මුඛ පරීක්ෂණයට ලක්කිරීමෙන් අනතුරුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කරන ලදී. එකී නිර්දේශය අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ඒකමතික අනුමැතිය මත, එම්.කේ.එස්.එස්. රත්නායක මහතා 2019.11.16 දින සිට මැතිවරණ කොමසාරිස් ජනරාල් ධුරයට පත්කරන ලදී.

30. රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු ලැබීම මත නිදහස් කිරීම්.

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණියේ, ඒ.වී.ඕ.වී.කරුණාරත්න මහතා (මැතිවරණ මහ ලේකම් කාර්යාලය), ශ්‍රී ලංකා තොරතුරු හා සංනිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියේ තනතුරක් සඳහාද, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණියයට බඳවා ගැනීමේ විභාගය සමත් වී යාපනය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ එස්.ජේ. ස්ටාලින් මහතා (ක.සේ.නි. III), මැතිවරණ මහලේකම් කාර්යාලයේ එම්.ඒ.යූ.කේ.පෙරේරා

මහතා (ක.සේ.නි. III), කිලිනොච්චි දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ජී.ටී.යූ.කල්‍යාණරත්න මෙනවිය (ලේඛන සහකාර III) යන නිලධරයන් ඔවුන් එවකට දරමින් සිටි තනතුරු වලින් ඉවත් වී, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණියේ රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි 2018.06.28 දින සේවයෙන් පසු නිදහස් කිරීමට කටයුතු කරන ලදී. එම නිලධරයන් නැවත පත්වීම් ලබා මැතිවරණ කොමිෂන් සභාවේ සේවයට පැමිණෙන ලදි.

කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධි පන්තියේ සීමිත තරඟ විභාගය සමත්වීම නිසා කොළඹ නාගරික මැතිවරණ කාර්යාලයේ එස්.කේ.අබේරත්න මෙනවිය (ක.සේ.නි. II), මඩකලපුව දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ටී.ශක්තිරාජ් මහතා (ක.සේ.නි. II), ඩී.එල්.එස්.දිපිකා මහත්මිය (ක.සේ.නි. II), ඔවුන් එවකට දරමින් සිටි තනතුරු වලින් ඉවත් වී කළමනාකරණ සේවා නිලධාරි අධිපන්තියේ රාජකාරි භාර ගැනීමට කටයුතු කරන ලදී. එස්.කේ.අබේරත්න මෙනවිය කොළඹ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේද, ටී.ශක්තිරාජ් මහතා වවුනියා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේද, ඩී.එල්.එස්.දිපිකා මහත්මිය මැතිවරණ මහ ලේකම් කාර්යාලයේද පරිපාලන නිලධාරීන් වශයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ සේවය භාරගන්නා ලදි.

කොළඹ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයට අනුයුක්තව සේවය කළ කා.සේ.සේ. III ඩී.ජී.කේ.ඩී.තාරින්දි මහත්මිය බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියේ තනතුරකට පත්වීමක් ලැබීම නිසා කාර්යාල සේවක සේවයේ තනතුරින් සම්පූර්ණයෙන්ම ඉවත්වී එම තනතුරේ රාජකාරි භාර ගැනීමට හැකිවන පරිදි 2019.08.30 දින සේවයෙන් පසු නිදහස් කර යවන ලදී.

31. සේවය අවසන් කිරීම.

ව්‍යාජ අධ්‍යාපන සහතික ඉදිරිපත් කිරීමේ හේතුව මත මැතිවරණ මහලේකම් කාර්යාලයට අනුයුක්තව සේවය කල කා.සේ.සේ. III ඊ.ජී.එස්.පී.එපිටවත්ත මහතාගේ සේවය 2019.04.04 දින සිට අවසන් කරන ලදි.

32. කාර්යක්ෂමතා කඩඉම් පැවැත්වීම.

මැතිවරණ කොමිෂන් සභාවේ සේවයේ නියුතු ලේඛන සහකාර III ශ්‍රේණියේ විභාගයට පෙනී නොසිටි නිලධරයන් දෙදෙනා සහ විභාගය අසමත් නිලධරයන් දෙදෙනා සඳහා ඉදිරියේදී නැවත කාර්යක්ෂතා කඩඉම් විභාගයක් පැවැත්වීමට කටයුතු සුදානම් කරන ලදි.

33. නව බඳවා ගැනීම්.

මැතිවරණ කොමිෂන් සභාවේ කාර්යාල සේවක සේවයේ පැවැති පුරප්පාඩු පිරවීම සඳහා වෙබ් අඩවියේ දැන්වීමක් පළ කර අයදුම්පත් කැඳවීමට කටයුතු කල අතර, ඒ සම්බන්ධයෙන් වූ සම්මුඛ පරීක්ෂණ 2018 නොවැම්බර් මස 12,13,15,16 හා 19 යන දින වලදී මැතිවරණ මහලේකම් කාර්යාලයේදී පවත්වන ලදි.එම සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත කාර්යාල සේවක සේවයේ පැවැති පුරප්පාඩු 39 සඳහා 2019.02.05 දින සිට පත්වීම් ලබාදීමට කටයුතු කරන ලදි.

34. පුරප්පාඩු තනතුරු වල රාජකාරි කටයුතු ආවරණය කිරීම.

මැතිවරණ කොමිෂන් සභාවේ පැවති පුරප්පාඩුවල රාජකාරි කටයුතු ඉටු කර ගෙන යාම, ඡන්දහිමි නාම ලේඛන ප්‍රතිශෝධන කටයුතු සඳහා සහ 2019.11.16 දින පැවැති ජනාධිපතිවරණ ඡන්ද විමසීමට අදාල මූලික කටයුතු හා පශ්චාත් කටයුතු සඳහා සහායටද කඩින් කඩ අනියම් සේවක / සේවිකාවන්ගේ සේවය ලබා ගැනීමට කටයුතු කරන ලදි.

35. ස්ථාන මාරු

35.1 අභ්‍යන්තර ස්ථාන මාරු

- කොළඹ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් සේවය කරන ලද ශ්‍රී ලං.ප.සේ. III ශ්‍රේණියේ සුරංග රණසිංහ මහතා විදේශ අධ්‍යයන නිවාඩු අවසන් කර සේවයට වාර්තා කිරීමෙන් අනතුරුව 2019.01.08 දින සිට ප්‍රධාන කාර්යාලයේ සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන) වශයෙන් පත්කරන ලදී.

- මැතිවරණ කොමිෂන් සභාවේ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයෙකු වශයෙන් සේවය කරන ලද ශ්‍රී ලං.ප.සේ. I ශ්‍රේණියේ එම්.ජී.ලලිත් ආනන්ද මහතා විදේශ නිවාඩු අවසන් කර සේවයට වාර්තා කිරීමෙන් අනතුරුව 2019.07.15 දින සිට උතුරු පළාත් නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් වශයෙන් පත් කරන ලදී.

- මැතිවරණ කොමිෂන් සභාවේ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයෙකු වශයෙන් සේවය කරන ලද ශ්‍රී ලං.ප.සේ. I ශ්‍රේණියේ ඩබ්ලිව්.එච්.ආර්.විජයකුමාර මහතා විදේශ නිවාඩු අවසන් කර සේවයට වාර්තා කිරීමෙන් අනතුරුව 2019.09.23 දින සිට මැතිවරණ කොමිෂන් සභාවේ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් වශයෙන් පත් කරන ලද අතර, මාතර, හම්බන්තොට දිස්ත්‍රික්කවල ජනාධිපතිවරණයට අදාල කාර්යයන් සම්බන්ධීකරණය සඳහා මාතර මැතිවරණ කාර්යාලයට අනුයුක්ත කරන ලදි.

35.2දෙපාර්තමේන්තුවෙන් පිටතට ලබා දෙන ලද ස්ථාන මාරු

- මැතිවරණ කොමිෂන් සභාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී වශයෙන් සේවය කරන ලද ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2/II පන්තියේ ජේ.ජී.බී.සී.එස්.ජයවීර මහත්මිය ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක CS/ICTS/02/0596 හා 2019.02.23 දිනැති ලිපියට අනුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ රාජකාරී භාර ගැනීම සඳහා 2019.02.28 දින සිට මැතිවරණ කොමිෂන් සභාවේ සේවයෙන් නිදහස් කරන ලදී. ඒ මහත්මිය මෙම කොමිෂන් සභාව වෙනුවෙන් ඉටු කරන ලද සේවය අගය කරමු.

- මැතිවරණ කොමිෂන් සභාවේ යාපනය දිස්ත්‍රික් නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් වශයෙන් සේවය කළ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ ටී.අකීලන් මහතා රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ අංක 75/10/4749 හා 2019.02.23 දිනැති ලිපියට අනුව ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් ලෙස වැඩ භාර ගැනීම සඳහා 2019.03.13 දින සිට මැතිවරණ කොමිෂන් සභාවේ සේවයෙන් නිදහස් කරන ලදී. ඒ මහතා මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙන් ඉටු කරන ලද සේවය අගය කරමු.

- මැතිවරණ කොමිෂන් සභාවේ භාෂා පරිවර්තක (සිංහල/ දෙමළ) වශයෙන් සේවය කරන ලද ඒ.එම්.මුහාජීරීන් මහතා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 1/104/884 (G) හා 2019.12.02 දිනැති ලිපියට අනුව දේශීය ආදාම් දෙපාර්තමේන්තුවේ රාජකාරී භාර ගැනීම සඳහා 2019.12.03 දින සිට මැතිවරණ කොමිෂන් සභාවේ සේවයෙන් නිදහස් කරන ලදී. අවශ්‍ය සෑම අවස්ථාවකදීම, භාෂා පරිවර්තන කාර්යයේදී ඒ මහතා මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙන් ඉටු කරන ලද සේවය අගය කරමු.

36. විශ්‍රාම ගැනීම්

- මැතිවරණ කොමසාරිස් ජනරාල් එම්.එම්.මොහමඩ් මහතා, වයස අවුරුදු 60 සම්පූර්ණවීම මත රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/05-03/08/2018 හා 2018.09.13 දිනැති ලිපියෙන්

2019.03.10 දින සිට රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී. ශ්‍රී ලංකා පරිපාලන සේවයට එක් වීමට පෙර ගුරුවරයෙකු ලෙස රාජ්‍ය සේවයේ නිරතව ඇති එම්.එම්. මොහමඩ් මහතා, 1991 දී ශ්‍රී ලංකා පරිපාලන සේවයට ඇතුළත්ව, මැතිවරණ දෙපාර්තමේන්තුවේ සහකාර මැතිවරණ කොමසාරිස්වරයෙකු ලෙස පත්වීම් ලබා මොණරාගල, බදුල්ල, ගම්පහ මැතිවරණ කාර්යාලවල සහකාර මැතිවරණ කොමසාරිස්වරයෙකු ලෙස සේවය කර තිබේ. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියට උසස්වීම් ලැබීමෙන් අනතුරුව, ගම්පහ දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයෙකු ලෙසද සේවය කල ඔහු, 2010 වර්ෂයේ සිට මැතිවරණ මහ ලේකම් කාර්යාලයේ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (පාලන) තනතුර දැරීය. ඉන් අනතුරුව, එම සේවයේ උසස්වීම් ලැබීමෙන් අනතුරුව මැතිවරණ දෙපාර්තමේන්තුවේ අතිරේක මැතිවරණ කොමසාරිස් (නීති හා විමර්ශන) තනතුර හෙබවූ ඔහු, මැතිවරණ කොමසාරිස් ජනරාල් තනතුර දැරූ එම්.ඒ.පී.සී. පෙරේරා මහතා විශ්‍රාම ගැනීමෙන් පසු මැතිවරණ කොමසාරිස් ජනරාල් ධූරයට පත්විය. දෙමළ භාෂා මාධ්‍යයෙන් සේවයට බැඳුනු, සිංහල භාෂාව හැසිරවීමේ ඉහල මට්ටමේ හැකියාවක් තිබූ, මැතිවරණ දෙපාර්තමේන්තුවට රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය මැනවින් ක්‍රියාවේ යෙදවීමට ඔහුගේ මේ හැකියාව බෙහෙවින් ප්‍රයෝජනවත් විය. එසේම, ඉංග්‍රීසී භාෂාව මැනවින් හැසිරවූ ඔහුගේ පරිපාලන නීතිය හා මැතිවරණ නීති / ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ දැනුම, දෙපාර්තමේන්තුවට හා මැතිවරණ කොමිෂන් සභාවට එරෙහි අධිකරණ කටයුතුවලදී මෙන්ම, දෙපාර්තමේන්තුවේ / කොමිෂන් සභවේ සෙසු ව්‍යවස්ථාපිත කටයුතුවලදීද අතිශයෙන්ම ප්‍රයෝජනවත් විය. වර්ෂ 33ක සේවා කාලයකට පසු රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලැබූ පසු තවදුරටත් මැතිවරණ කොමිෂන් සභාවේ කටයුතුවලට සහාය වන බව මෙහි ඉතා සතුටින් සඳහන් කරන අතර, ඔහුට නීරෝගී හා සතුට පිරි විශ්‍රාම දිවියක් පතමු.

- ඊට පරිබාහිරව, රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ / කළමනාකරණ සේවා නිලධාරීන් 10 දෙනෙකු හා කාර්යාල සේවක සේවයේ සේවක මහතුන් 01 කෙනෙකුද 2019 වර්ෂය තුල විශ්‍රාම ගන්නා ලදී. මෙලෙස විශ්‍රාම ලබා ගත් 12 දෙනාගේ විශ්‍රාම ලිපි ගොනුවල කටයුතු කලට වේලාවට සිදු කර අවසන් කරන ලදී. විශ්‍රාම ගත් සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන් පිළිබඳ විස්තරාත්මක වාර්තාව ***සටහන් අංක XV*** ලෙස යා කර ඇති අතර, ඒ සියලුදෙනාටම නිදුක් නිරෝගී, සතුටින් පිරි විශ්‍රාම දිවියක් පතමු.

37. මියයාම්

2019.11.16 දින පැවැති ජනාධිපතිවරණයේ රාජකාරී සඳහා මැතිවරණ කොමිෂන් සභාවට අනුයුක්තව සේවය කරමින් සිටියදී හදිසි හෘදයාබාධයකට ලක්ව 2019.10.07 දින මියගිය, නිපුණතා සංවර්ධන, රැකිරක්ෂා සහ කම්කරු සබඳතා අමාත්‍යාංශයේ සේවය කළ රියදුරු අයි.පී.උපුල් ශාන්ත මහතාගේ යැපෙන්නන්ට අදාල ප්‍රතිලාභ ලබා දීමට අදාල කටයුතු ආරම්භ කර ඇති අතර, ඔහුගේ සේවය බෙහෙවින් අගය කරමු.

38. පොදු පහසුකම් සැපයීම

පවිත්‍රතා කටයුතු

මැතිවරණ මහලේකම් කාර්යාලයේ හා කොළඹ දිස්ත්‍රික් / නාගරික මැතිවරණ කාර්යාල පරිශ්‍රයේ පවිත්‍රතා කටයුතු ඉටු කර ගනු ලැබූ ස්මාර්ට් ජැනිටර්ස් (පුද්) සමාගම සමඟ අත්සන් කර තිබූ ගිවිසුමේ නිල කාලය 2019.02.28 දිනෙන් අවසන්වූ අතර,ඉදිරි වසරක කාලයක් සඳහා ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් මඟින් ජාතික තරඟකාරී ලංසු කැඳවීම යටතේ මිල ගණන් කැඳවීමට කටයුතු කරන ලදි.ඒ අනුව අවම මිළ ඉදිරිපත් කර තිබුනේ සුපර් ශයින් සර්විස් ආයතනයයි. ඒ අනුව 2019.03.01 දින සිට 2020.02.29 දින දක්වා වූ කාලය සඳහා සුපර් ශයින් සර්විස් ආයතනය සමඟ පවිත්‍රතා කටයුතු ඉටු කර ගැනීම වෙනුවෙන් ගිවිසුමක් අත්සන් කරන ලදී.

39. ආරක්ෂක කටයුතු

කොමර්ෂල් ෆීල්ඩ් සිකියුරිටි සර්විස් (පුද්) සමාගම සමඟ අත්සන් කර තිබූ ගිවිසුමේ නිල කාලය 2019.02.28 දිනෙන් අවසන්වූ අතර,ඉදිරි වසරක කාලයක් සඳහා ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් මඟින් ජාතික තරඟකාරී ලංසු කැඳවීම යටතේ මිල ගණන් කැඳවීමට කටයුතු කරන ලදි.ඒ අනුව අවම මිළ ඉදිරිපත් කර තිබුනේ යුනයිටඩ් ෆීල්ඩ් සිකියුරිටි සර්විස් (පුද්) සමාගම වන අතර, 2019.03.01 දින සිට 2020.02.29 දින දක්වා වූ කාලය සඳහා යුනයිටඩ් ෆීල්ඩ් සිකියුරිටි සර්විස් (පුද්) සමාගම සමඟ ආරක්ෂක කටයුතු ඉටු කර ගැනීම වෙනුවෙන් ගිවිසුමක් අත්සන් කරන ලදී. මැතිවරණ මහලේකම් කාර්යාලය හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල සඳහා ආරක්ෂක සේවාව ලබා ගැනීම සඳහා ඒ සියලුදෙනාගේ සේවය බෙහෙවින් අගය කරමු.

40. පුහුණුවීම්

40.1 දේශීය පුහුණුවීම්

- රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, විගණන කළමනාකරණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ජාතික භාෂා අධ්‍යාපන ආයතනය, මිලෝදා ආයතනය, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, මොරටුව විශ්ව විද්‍යාලය, කැලණිය විශ්ව විද්‍යාලය යන ආයතන විසින් සේවා කාර්යක්ෂමතාව හා ඵලදායිතාව ඉහළ නැංවීම අරමුණු කොට පවත්වනු ලබන පුහුණු පාඨමාලා සඳහා කොමිෂන් සභා නිලධාරින් යොමු කිරීමට ක්‍රියාකර ඇත.

- ඉදිරි ඡන්ද විමසීම්වලට අදාළ ප්‍රමුඛ කාර්යයන් හා මූලික සංවිධාන කටයුතු පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාවට මෑත කාලයේ දී බඳවාගන්නා ලද/ ස්ථාන මාරුවීම් ලද මාණ්ඩලික නිලධාරීන් සඳහා ධාරිතා පුහුණු වැඩමුළුවක් 2019.06.30, 2019.07.01 සහ 02 දිනවල දී හෙක්ටර් කොඩ්බෑකඩුව ගොවි කටයුතු හා පර්යේෂණ මධ්‍යස්ථානයේ දී පවත්වන ලදී.

- නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්/ සහකාර මැතිවරණ කොමසාරිස්/ ප්‍රධාන රාජ්‍ය කළමනාකරණ සහකාර/ ගිණුම් විෂය භාර නිලධාරී (1,2 සහ 3)/ උපාය මාර්ගික සැලැස්ම සම්බන්ධ විෂය භාර නිලධාරී/ ගබඩා භාර නිලධාරීන් සඳහා ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ හැඳින්වීම, කාර්යයන්, වගකීම, මු.රෙ.135 ප්‍රකාරව බලතල පැවරීම, ප්‍රසම්පාදන බලතල පැවරීම, ලංසු ලියවිලි පිළියෙල කිරීම, ලංසු විවෘත කිරීම, ලංසු ලේඛනවල වලංගුභාවය පිළිබඳ විස්තර, ප්‍රසම්පාදන කටයුතුවල කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ අධ්‍යයනය සහ ගබඩා කටයුතු පිළිබඳ පුහුණු වැඩසටහන් 05ක් සියළු දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල ආවරණය වන පරිදි කොළඹ, ගාල්ල, මහනුවර, අනුරාධපුර සහ කිළිනොච්චි දිස්ත්‍රික්කවල දී සිංහල භාෂා මාධ්‍යයෙන් හා දෙමළ භාෂා මාධ්‍යයෙන් පැවැත්වීමට කටයුතු කරන ලදී.

- මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් පරිදි, හිමිකම් විරෝධතා පරීක්ෂණ පැවැත්වීම පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් 05ක් සියළු දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සහකාර ලියාපදිංචි කිරීමේ නිලධරයන් සහ ඡන්ද ප්‍රදේශභාර නිලධරයන් සඳහා කොළඹ, ගාල්ල, මහනුවර, අනුරාධපුර සහ වවුනියාව දිස්ත්‍රික්කවලදී සිංහල භාෂා මාධ්‍යයෙන් හා දෙමළ භාෂා මාධ්‍යයෙන් පැවැත්වීමට කටයුතු කරන ලදී.

- මැතිවරණ කොමිෂන් සභාවට බඳවා ගන්නා ලද තොරතුරු තාක්ෂණ නිලධාරී හා තොරතුරු තාක්ෂණ සහකාරකවරුන් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහනක් 2019.07.04 දින මැතිවරණ කොමිෂන් සභාවේ දී පවත්වන ලදී.

- මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි, රියැදුරු සේවයේ සියලුදෙනා සඳහා 2019.05.23, 24, 25 සහ 2019.06.06, 07, 08 දිනයන්හි පුහුණු වැඩසටහන් දෙකක් කළුතර ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයීය රිය පාසලේ දී පැවැත්වීමට කටයුතු කරන ලදී.

- මැතිවරණ කොමිෂන් සභාවට බඳවා ගන්නා ලද කාර්යාල සේවක සේවයේ නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහනක් 2019.02.05, 06 සහ 07 දිනවල දී බණ්ඩාරගම සර්වෝදය සංවර්ධන අධ්‍යාපන ආයතනයේ දී පවත්වන ලදී.

- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය හා මැතිවරණ කොමිෂන් සභාවේ එකඟතාව අනුව, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හා ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නවක නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන් 07ක් මැතිවරණ කොමිෂන් සභාවේ දී හා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ දී පැවැත්වීමට කටයුතු කර ඇත.

40.2 විදෙස් පුහුණු හා නිල චාරිකා

40.2.1 නිල චාරිකා

- 2019.01.24 හා 2019.01.25 යන දෙදින ඉන්දියාවේ නවදිල්ලි නුවර පැවති දකුණු ආසියාතික මැතිවරණ බලධාරීන්/ නියෝජිතයන් ද සහභාගී වූ ඡන්ද හිමියන්ගේ දින සැමරුම් උත්සවයට සහ ‘‘සියලුදෙනා ඇතුළත් මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳ’’ වැඩමුළුව සඳහා මැතිවරණ කොමිෂන් සභාව නියෝජනය කරමින් මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති මහින්ද දේශප්‍රිය මහතා සහ සභාපති සම්බන්ධීකරණ ලේකම් රිසාන් එම්.ඒ.හමීඩ් මහතා සහභාගී විය.

- 2019.03.26 හා 27 යන දෙදින ජෝර්ජියාවේ බටුමි නුවර පැවති Electoral Integrity; Cyber Security and the reliability of information in the digital era 9th Annual Meeting of Election Management bodies සමුළුව සඳහා මැතිවරණ අධ්‍යක්ෂ ජනරාල් සමන් ශ්‍රී රත්නායක මහතා සහ ව්‍යාපෘති සම්බන්ධීකාරක/ තාක්ෂණ නිලධාරි, බන්දුල පුෂ්පකුමාර රණතුංග මහතා සහභාගී වූ අතර, ලබාගත් අත්දැකීම් මැතිවරණ කොමිෂන් සභාවේ අනෙකුත් නිලධරයන් සමඟ හුවමාරුව ඉතා වැදගත් විය.

- 2019.04.15 දින සිට 2019.04.18 දින දක්වා ඉන්දුනීසියාවේ පැවති Election Visit Program ; Indonesian Concurrent Election 2019 වැඩසටහන සඳහා මැතිවරණ කොමිෂන් සභාව නියෝජනය කරමින් මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති මහින්ද දේශප්‍රිය මහතා සහ සභාපති සම්බන්ධීකරණ ලේකම් රිසාන් එම්.ඒ.හමීඩ් මහතා සහභාගී විය.

- 2019.05.10 දින සිට 2019.05.13 දින දක්වා ඉන්දියාවේ නවදිල්ලි නුවර පැවති International Election Visitor Programme in India වැඩසටහන සඳහා මැතිවරණ කොමිෂන් සභාව නියෝජනය කරමින් මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජික එන්. ජේ. අබේසේකර මහතා සහ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (කොළඹ-නාගරික) පී. ඒ. එස්. සේනාරත්න මහතා සහභාගී වූ අතර ඒ පිළිබඳව වාර්තාව ද ඉදිරිපත් කිරීමට ක්‍රියා කර ඇත.

- 2019.05.11 දින සිට 2019.05.15 දින දක්වා පිලිපීනයේ මැනිලා නුවර පැවති 2019 National and Local Election Foreign Observation Program සඳහා මැතිවරණ කොමිෂන් සභාව නියෝජනය කරමින් මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජික මහාචාර්ය එස්. එච්. ආර්. හූල් සහභාගී විය.

- 2019.05.16 දින සිට 2019.05.19 දින දක්වා ඕස්ට්‍රේලියාවේ කැන්බරා නුවර පැවති Australian Federal Election Visitor Program 2019 සඳහා මැතිවරණ කොමිෂන් සභාව නියෝජනය කරමින් මැතිවරණ අධ්‍යක්ෂ ජනරාල් සමන් ශ්‍රී රත්නායක මහතා සහභාගී වූ අතර අදාළ වාර්තාව ඉදිපත් කර ඇත.

- 2019.07.25 දින සිට 2019.07.26 දින දක්වා එක්සත් රාජධානියේ පැවති Eighteenth Cambridge Conference on Electoral Democracy සඳහා සෘජුවම ලද ඇරයුමකට අනුව මැතිවරණ කොමිෂන් සභාව නියෝජනය කරමින් මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති මහින්ද දේශප්‍රිය මහතා සහ

සභාපති සම්බන්ධීකරණ ලේකම් රිසාන් එම්.ඒ.හමීඩ් මහතා සහභාගී වූ අතර, එහිදී ලබාගත් අත්දැකීම්, මැතිවරණ කොමිෂන් සභාවේ අනෙකුත් නිලධාරීන් සමඟ බෙදාගැනීම නැවුම් අත්දැකීමක් විය.

- 2019.07.30 දින සිට 2019.07.31 දින දක්වා එක්සත් රාජධානියේ පැවති Expert Review Meeting of Commonwealth Guide to Elections Cyber security සම්මන්ත්‍රණය සඳහා මැතිවරණ කොමිෂන් සභාව නියෝජනය කරමින් මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජික මහාචාර්ය එස්.ආර්.එච්. හූල් සහභාගී විය.

- 2019.08.29 දින මියන්මාරයේ නෙපිටව් නුවර පැවති Experience Sharing: "EMB Engagement with Electoral Stakeholders in the Electoral Process" වැඩසටහන සඳහා එම වැඩසටහන සංවිධායකයින් වෙතින් ලද ඇරයුමකට අනුව, සම්පත් දායකයෙකු ලෙස නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (පාලන) ජේ. ඒ. එස්. පී. ජයසිංහ මහතා සහභාගී වූ අතර, එය මියන්මාර මැතිවරණ කොමිෂන් සභාවේ ඇඟයීමට ලක්විය.

- 2019.09.03 දින සිට 2019.09.04 දින දක්වා ඉන්දියාවේ බැංග්ලෝර් නුවර පැවති The 4th General Assembly of A-WEB and 2019 International Conference සඳහා වැඩසටහන සඳහා මැතිවරණ කොමිෂන් සභාව නියෝජනය කරමින් මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජික එන්. ජේ. අබේසේකර මහතා සහ අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) එස්. ඒකනායක මහතා සහභාගී වූ අතර, අදාල වාර්තාව ඉදිරිපත් කර ඇත.

40.2.2 පුහුණු

- 2019.01.07 දින සිට 2019.01.11 දින දක්වා ඉන්දියාවේ පිහිටි ප්‍රජාතන්ත්‍රවාදය සහ මැතිවරණ කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර ආයතනය (IIIDEM) මඟින් පවත්වනු ලැබූ මැතිවරණ කළමනාකරණය පිළිබඳ ධාරිතා සංවර්ධන වැඩසටහන සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ සේවයේ නියුතු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර අසිරු වේදිත කරුණාරත්න මහතා මඩකලපුව දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ සේවයේ නියුතු කළමණාකරණ සේවා නිලධාරි බාලේන්ද්‍රරාජා සත්‍යබවන් මහතා සහභාගී වූ අතර, ඒ පිළිබඳව ඔවුන් විසින්, වාර්තාවක් ඉදිරිපත් කරන ලදී.

- මැතිවරණ කොමිෂන් සභාවේ සේවයේ නියුතු සහකාර මැතිවරණ කොමසාරිස් පී. ආර්. නාලක හේමන්ත රත්නායක මහතා ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් විශ්ව විද්‍යාලය මඟින් ප්‍රදානය කරන ලද සංවර්ධන අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාවට සහභාගී වීම සඳහා 2019.01.07 දින සිට 2021.02.06 දින දක්වා වූ කාලය තුළ, වැටුප් සහිත අධ්‍යයන නිවාඩු මත, අදාළ පාඨමාලාව හැදෑරීමට අපේක්ෂිතය.

- මැතිවරණ කොමිෂන් සභාවේ සේවයේ නියුතු නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් ඩබ්. එම්. චමිලා කුමුදුනී විජේකුරුප්පු මහත්මිය ඕස්ට්‍රේලියාවේ එඩිත් කොවන් විශ්ව විද්‍යාලය (Edith Cowan University) මඟින් ප්‍රදානය කරන ලද ආචාර්ය උපාධි පාඨමාලාවට සහභාගී වීම සඳහා 2019.01.13 දින සිට 2022.02.10 දින දක්වා වූ කාලය වැටුප් රහිත නිවාඩු මත විදේශගතව එම පාඨමාලාව හදාරාන බව දන්වා ඇත.

- Development Administration Modernization and Transformation පශ්චාත් උපාධි පාඨමාලාවේ විදෙස් රටවල අත්දැකීම් ලබා ගැනීමේ වැඩසටහන (2nd Country visit) යටතේ, 2019.06.23 දින සිට 2019.06.29 දින දක්වා මැලේසියාවේ Majlis Amanah Rakyat විශ්ව විද්‍යාලයේ පැවති අධ්‍යයන වැඩමුළුවක් සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (ව්‍යාපෘති/ පළාත් පාලන) එස්. අච්චුදන් මහතා සහභාගී වී ඇත.

- 2019.07.01 දින සිට 2019.07.07 දින දක්වා මැලේසියාවේ Majlis Amanah Rakyat විශ්ව විද්‍යාලයේ පැවති ගණකාධිකාරී සේවයේ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන පුහුණුවට අදාළ විදෙස් චාරිකාව (2nd Country study visit) සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ සේවයේ නියුතු ප්‍රධාන මූල්‍ය නිලධාරි ඊ. ඒ. වීරසේන මහතා සහභාගී විය.

- 2019.08.21 දින සිට 2021.07.31 දින දක්වා ජපානයේ මානව සම්පත් සංවර්ධන ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය මඟින් ප්‍රදානය කරන ලද ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාවට සහභාගී වීම සඳහා වැටුප් සහිත අධ්‍යයන නිවාඩු මත, ප්‍රධාන අභ්‍යන්තර විගණක ජී. කේ. එස්. සී. කේ. යසරත්න මෙනවිය 2019.08.21 දින දිවයිනෙන් බැහැර විය.

- ඉන්දියාවේ පිහිටි ප්‍රජාතන්ත්‍රවාදය සහ මැතිවරණ කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර ආයතනය (IIIDEM) මඟින් 2019.09.22 දින සිට 2019.09.27 දින දක්වා පවත්වනු ලැබූ Capacity Development on Voter Registration වැඩසටහන සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ සේවයේ නියුතු සහකාර ලේකම් ඒ. අයන්තා ආනන්දි මහත්මිය සහ සහකාර මැතිවරණ කොමසාරිස් පී. ඒ. කුමරිනි දසන්ති මෙනවිය සහභාගි වීය.

- 2019.11.25 දින සිට 2019.11.29 දින දක්වා මැලේසියාවේ පවත්වනු ලැබූ Commonwealth Election Professionals (CEP) Asia Region Training Event සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ, අතිරේක මැතිවරණ කොමසාරිස් (පාර්ලිමේන්තු මැතිවරණ) රසික පීරිස් මහතා සහ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (නැගෙනහිර පළාත) එස්. සුදාකරන් මහතා සහභාගී වූ අතර, එය තවත් එවැනි වැඩසටහන් සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය ලබාදීමට අවස්ථාවක් විය.

- 2019.12.11 දින සිට 2019.12.12 දින දක්වා ඉන්දුනීසියාවේ බාලි හි පවත්වනු ලැබූ The 2nd Electoral Studies Program (ESP) Building Collaboration to Enhance Electoral Justice අධ්‍යයන වැඩසටහන සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (ව්‍යාපෘති/ පළාත් පාලන) එස්. අච්චුදන් මහතා සහභාගී විය.

41. ඉදිකිරීම් හා වත්කම්

41.1 ඉදිකිරීම් හා අළුත්වැඩියා

41.1.1 වැය විෂය - 2001

2019.12.31 දිනට සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම (Procurement Plan) අනුව, 2019 වර්ෂයේ ඉදිකිරීම් / අළුත්වැඩියාවන්ට අදාළ 2001 වැය විෂය යටතේ, අයිතම 62 ක් අතුරින්, අයිතම 59 ක කටයුතු 2019.12.31 දින වනවිට අවසන්ව ඇත.

41.1.2 වැය විෂය - 2104

මඩකලපුව සහකාර මැතිවරණ කොමසාරිස් නිල නිවස ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. යාපනය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය ඉදිකිරීම් කටයුතුවලින් මෙම වර්ෂයට අදාල කොටස අවසන් කර ඇත.

41.1.3 වැය විෂය - 2105

මැතිවරණ කොමිෂන් සභා පරිශ්‍රයේ භූමි අලංකරණ කටයුතු සහ මැතිවරණ කොමිෂන් සභා පරිශ්‍රය අසල පිහිටි කුණු ඇළට යාබදව දැල් ආවරණයක් සහිත බැම්මක් ඉදිකර පස් පිරවීමට කටයුතු සිදුකරන ලදි.

42. වාහන හා පාලනය

2019.12 31 දිනට මැතිවරණ කොමිෂන් සභාව සතුව පැවැති වාහන පිළිබඳ විස්තර පහත පරිදි වේ.

අනු අංකය	වාහන වර්ගය	සංඛ්‍යාව	කාර්යාලය			
			ප්‍රධාන කාර්යාලය		දිස්ත්‍රික් කාර්යාල	
			සංචිත	වෙන්කල	සංචිත	වෙන්කල
1	කැබ්	*34	7	-	27	-
2	කාර්	**14	5	6	-	3
3	වෑන්	02	2	-	-	-
4	ජීප්	02	-	2	-	-
5	ලොරි	01	2	-	-	-
6	කෘ කැබ්	01	1	-	-	-
7	මෝටර් සයිකල්	***02	2	-	-	-

පහත වාහන අපහරණය කිරීමට යෝජිත බැවින් ධාවනයෙන් ඉවත් කර ඇත.

* GB - 3294 කැබ් රථය

** KF - 4106 මෝටර් රථය

*** UI - 9835 මෝටර් සයිකලය

2019 වසර මුල් භාගයේදී මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රවාහන සංචිතයේ ඇති අඩුපාඩුකම් සලකා බලා එවකට අග්‍රාමාත්‍යතුමාගේ උපදෙස් පරිදි මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල ආවරණය වන පරිදි නව වාහන මිලදී ගැනීම සඳහා වන අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් සකස් කල PMO/CM/30/2019 අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සඳහා අංක 19/2021/102/039 හා 2019.08.22 දිනැති කැබිනට් තීරණය මඟින් අනුමැතිය හිමි විය. මෙම වාහන මිලට ගැනීම වෙනුවෙන් පත්කල වාහන අවශ්‍යතා හඳුනා ගැනීමේ කමිටුවේ නිරීක්ෂණ අනුව ඒ වන විට ධාවන තත්වයේ පැවති වාහන 54 න් වසර 10 ට වඩා පැරණි වාහන 26 ක් පමණ තිබූ අතර, එම වාහන නඩත්තු කටයුතු කිරීම සඳහා පමණක් එක් කිලෝමීටරයක් සඳහා සාමාන්‍ය වශයෙන් රු.20.00 ක පමණ අමතර පිරිවැයක් වැයවන බවත් හඳුනා ගෙන තිබිණි. එසේ හෙයින්, නඩත්තු පිරිවැය අධික වාහන 19 අපහරණය සඳහා සුදුසු බව හඳුනාගත් අතර, කොමිෂන් සභාවේ අලුතින් හටගත් අනෙකුත් අවශ්‍යතා ද සලකා බලා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ BD/GPS/20/1/8/1 හා 2019.08.22 දිනැති ලිපියෙන් ඩබල් කැබ් රථ 16, වෑන් රථ 1 ක් හා කාර් රථ 04 ක් මිලට ගැනීම සඳහා අනුමැතිය හිමිවිය.එම උපදෙස් හා අනුමැතිය යටතේ වාහන මිලට ගැනීමේ ක්‍රියාවලිය 2019.08.28 දින ආරම්භ කල අතර, 2019.12.14 දිනට අවසන් වීමට නියමිතව තිබූ ලංසු කැඳවීමේ ක්‍රියාවලිය භාණ්ඩාගාරය විසින් නිකුත් කල 7/2019 හා 2019.12.04 දිනැති චක්‍රලේඛය අනුව තාවකාලිකව අත්හිටුවීමට කටයුතු කරන ලදී.

43. යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම / අළුත්වැඩියා කිරීම / නඩත්තු කිරීම

- ප්‍රධාන කාර්යාල සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල අවශ්‍යතාවය සඳහා පරිගණක 80ක්, පරිගණක මුද්‍රණ යන්ත්‍ර 65ක් ඡායාපිටපත් යන්ත්‍ර 10ක්, සීසීපී යන්ත්‍ර 12ක්, රූපවාහිනී යන්ත්‍ර 07ක් සහ ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 12ක් ඇතුළු යන්ත්‍ර උපකරණ මිලදී ගෙන නිකුත් කර ඇති අතර මේ සඳහා රු. මිලියන 35 ක් වියදම් කරන ලදී.
- ප්‍රධාන කාර්යාල සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වායුසමීකරණය කිරීම සඳහා වායුසමීකරණ යන්ත්‍ර 19ක් මිලදී ගෙන සවිකරන ලද අතර ඒ සඳහා රු. මිලියන 4.6 ක් වැයකිරීමට සිදුවිය.
- ප්‍රධාන කාර්යාල සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල ඇති වගකීම් කාලය සම්පූර්ණ වූ පරිගණක, පරිගණක මුද්‍රණ යන්ත්‍ර, ඡායාපිටපත් යන්ත්‍ර සහ වායුසමීකරණ යන්ත්‍ර සඳහා අවශ්‍ය අළුත්වැඩියා කටයුතු සිදුකරන ලදී. ඒ සඳහා රු. මිලියන 0.6 ක පමණ මුදල වැයකිරීමට සිදුවිය.
- කාර්යාලවල භාවිතා කරන පරිගණක මුද්‍රණ යන්ත්‍ර සහ ඡායාපිටපත් යන්ත්‍ර සඳහා අවශ්‍ය ටෝනර් හා ඩ්‍රම් යූනිට් මිලදී ගැනීමට රු. මිලියන 44.3ක මුදලක් වැය කර ඇත. මෙම වියදම ජනාධිපතිවරණ කටයුතු හේතුවෙන් තවදුරටත් වැඩි වී ඇත.
- ප්‍රධාන කාර්යාලය සහ සියළුම දිස්ත්‍රික් කාර්යාල දුරකථන,අන්තර්ජාල පහසුකම් සමඟ ජාලගත කිරීමට අවශ්‍ය භාණ්ඩ, උපකරණ සහ මෘදුකාංග මිලදී ගෙන සැපයීමට කටයුතු කරන ලදී. ඒ සඳහා රු. මිලියන 1.5ක මුදලක් වැය කර ඇත.
- ප්‍රධාන කාර්යාලය සහ සියළුම දිස්ත්‍රික් කාර්යාලවල ඇති පරිගණක මුද්‍රණ යන්ත්‍ර, ඡායාපිටපත් යන්ත්‍ර සහ වායුසමීකරණ යන්ත්‍ර සඳහා සේවා ගිවිසුම් ගතවීමට රු. මිලයන 2ක් වැය කරන ලදී.
- ඡන්දවිමසීමේදී අවශ්‍යතාව මත පරිගණක මුද්‍රණ යන්ත්‍ර, ලැප්ටොප් පරිගණක යන්ත්‍ර, රූපවාහින් යන්ත්‍ර සහ ඡායාපිටපත් යන්ත්‍ර වැනි යන්ත්‍ර උපකරණ කුලි පදනම මත දිස්ත්‍රික් කාර්යාලවලට මෙන්ම ප්‍රධාන කාර්යාලයට ද ලබාදීමට සිදුවිය. එම යන්ත්‍රවලට කුලි වශයෙන් රු. මිලියන 2.6 ක් පමණ ගෙවීමට සිදුවූ අතර, ඉදිරියේදී වාර්ෂිකව සිදුකිරීමට අපේක්ෂිත මිලදී ගැනීම තුළින්, ගැටළු අවම වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

44. කාර්යාල භාණ්ඩ මිලදී ගැනීම

ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් සහ කාර්ය මණ්ඩල සඳහා අවශ්‍ය විධායක මේස, පුටු, කැබිනට්, අල්මාරි, රාක්ක, පරිගණක මේස වැනි විවිධ කාර්යාල භාණ්ඩ මිලදී ගෙන ලබාදීමට කටයුතු කරන ලදී. ඒ සඳහා රු. මිලයන 7.6ක් වියදම් කිරීමට සිදුවිය. මැතිවරණ කාලයේදී දිස්ත්‍රික් කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන්ගේ අවශ්‍යතාව හා නිර්දේශ පරිදි ප්‍රාදේශිය මට්ටමින් කාර්යාල භාණ්ඩ මිලදී ගැනීමටද අනුමැතිය ලබාදීමට කටයුතු කරන ලදී.

45. පොදු

- ජනාධිපතිවරණය, ඡන්දහිමි නාමලේඛන මුද්‍රණය, ඡන්දදායකයින් ලියාපදිංචි කිරීමේ කටයුතු සහ කාර්යාලයේ අනෙකුත් ලිපිද්‍රව්‍ය අවශ්‍යතාවය සපුරාගැනීම සඳහා විශාල ප්‍රමාණයේ ලිපිද්‍රව්‍ය මිලදී ගැනීමටද සිදුවිය. ඒ සඳහා රු. මිලියන 159ක පමණ වියදම් දරන ලදි.
- දිස්ත්‍රික් කාර්යාලවල ඇති කැඩුණු ඡන්ද පෙට්ටි ගෙන්වා ගෙන රජයේ කර්මාන්ත ශාලාවට භාරදී අළුත්වැඩියා කර නැවත එම කාර්යාලවලට ලබාදීම සිදුකළ අතර ඒ සඳහා රු. මිලයන 3.2ක් පමණ වියදම් දරා ඇත.
- ප්‍රධාන කාර්යාලයේ පානීය ජල අවශ්‍යතා ඇතුළු සුභ සාධන කටයුතු සඳහා රු. ලක්ෂ 5.6 ක් වියදම් කරන ලදී.
- අභ්‍යන්තර දුරකථන සම්බන්ධතාවය, ඡන්ද විමසීම් කටයුතුවල යෙදුණු නිලධාරීන්ගේ ජංගම දුරකථනවලට ලබාදුන් පහසුකම් හා එහි අවශ්‍ය උපාංග හා අළුත්වැඩියා කටයුතු සඳහා රු. මිලියන 9.3 ක් වියදම් කිරීමට සිදුව ඇත.

- දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට අදාළ ටයර් මිලදී ගැනීමේ කටයුතු ප්‍රාදේශිය මට්ටමින් සිදුකිරීමට අනුමැතිය ලබාදීමේ පදනම මත කටයුතු කරන ලද අතර මැතිවරණ මහලේකම් කාර්යාලයේ වාහන සඳහා අවශ්‍යතාව මත ටයර් මිලදී ගෙන සැපයීමද සාර්ථකව ඉටු කරන ලදී. ඒ සඳහා ප්‍රසම්පාදන ක්‍රම අනුගමනය කරමින් රු. මිලියන 1.36 ක් පමණ වියදම් කරන ලදී.
- කාර්යාල අන්තර්ජාල පහසුකම් සඳහා රු. මිලියන 18ක් හා දුරකථන බිල්පත සඳහා රු.ලක්ෂ 10 කුත්, ජල බිල්පත් ගෙවීම සඳහා රු. ලක්ෂ 04කුත් වැය වී ඇත.
- ප්‍රධාන කාර්යාලය සහ දිස්ත්‍රික් කාර්යාලවල පාවිච්චි කළ ඡන්ද පත්‍රිකා හා භාවිතයෙන් ඉවත්කළ කඩදාසි විකිණීමට කටයුතු කරන ලදී. ඒ වෙනුවෙන් රු.ලක්ෂ 49 ක පමණ මුදලක් රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර ඇත.
- ඡන්දවිමසීමට අදාළ ඡන්ද පත්‍රිකා ඇතුළු ලියවිලි මුද්‍රණය සහ අනෙකුත් ලිපිලේඛන මුද්‍රණ කටයුතු සඳහා 2019 වර්ෂයේදී රජයේ මුද්‍රණාලයට රු. මිලියන 278 ක් පමණ ගෙවීම් කර ඇත.

46. තොරතුරු තාක්ෂණික කටයුතුවල ප්‍රගතිය

තොරතුරු තාක්ෂණ අංශය විසින් සංවර්ධනය කරන "ElectionS" පරිගණක වැඩසටහනෙහි 2019 වර්ෂයේ ප්‍රතිශෝධන කටයුතු වලට අදාළව මෙන්ම පළාත් පාලන ආයතන ඡන්ද විමසීම (ඇල්පිටිය ප්‍රාදේශීය සභාව) හා ජනාධිපතිවරණයට අදාළව පහත සඳහන් උප පද්ධති 2019 වර්ෂය තුලදී වැඩි දියුණු කිරීම සිදු කරන ලදී.

46.1 2019 වර්ෂයේ ප්‍රතිශෝධනයට අදාළ කටයුතු:

- පාසල් සඳහා ප්‍රවර්තන වර්ෂයේ හා පැරණි වර්ෂ වල නාමලේඛන පරීක්ෂාවට ඊ-සේවාව ලබාදීම හා එම සේවාව දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වල නිලධාරීන් වෙත ද ලබා දීම.
- ප්‍රථම වරට බහුලියාපදිංචියට අදාළ සාක්ෂි (බී.සී. ආකෘති පත්, හැඳුනුම්පත්, උප්පැන්න සහතික ආදියේ පිටපත්) Scan කර ඡන්ද හිමි නාමලේඛන දත්ත පද්ධතියට ඇතුලත් කිරීමට අවශ්‍ය පහසුකම් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙතට සකස් කර දීමට කටයුතු කල අතර බහු ලියාපදිංචි ලැයිස්තු සැකසීම හා ඒවා ලබා ගැනීමට අවශ්‍ය පරිගණක වැඩසටහන සකස් කිරීම.
- හැඳුනුම්පත් අංක නොමැතිව සහ දෝෂ සහිත හැඳුනුම්පත් මගින් ලියාපදිංචි වී ඇති ඡන්දහිමියන්ගේ නම් ලැයිස්තුවක් සකස් කිරීම හා එවා නිවැරදි කිරීමට අවශ්‍ය දත්ත පද්ධතියක් සැකසීම, ජාතික හැඳුනුම්පත් රහිතව ඡන්දහිමි නාමලේඛනය සකස් කල හැකි පරිදි වැඩසටහන දියුණු කිරීම.
- ඉදිරි කාලයේදී මාර්ගගත ක්‍රමයට ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ ක්‍රමය භාවිතා කිරීමට අපේක්ෂිත අතර මේ වසර තුල එහි වැඩිදියුණු කිරීම් කටයුතු සිදුකෙරෙමින් පවතී.
- 2019 ඡන්දහිමි නාමලේඛනය සකස් කිරීමේ දී හිමිකම් විරෝධතා හා බහුලියාපදිංචි කටයුතු පරිගණක ගත කිරීම, අවශ්‍ය වාර්තා ලබා ගැනීම, අවශ්‍ය සංශෝධනයන් සිදුකිරීම සඳහා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වලට සහය වීම.
- මෙතෙක් පැවති ඡන්දහිමි නාමලේඛනයේ උදෘත නිකුත් කිරීමේ ක්‍රමය වෙනුවට ලංකාවේ ඕනෑම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයකින් උදෘත නිකුත් කළ හැකි වන පරිදි නිර්මාණය කොට අළුතින් ක්‍රියාත්මක කිරීමට නියමිත පරිගණක වැඩසටහනේ කටයුතු සම්පූර්ණ කරන ලද අතර එය යාවත්කාලීන කිරීම.
- 2018.11.07 වන දින කුරුණෑගල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දී සාකච්ඡා කෙරුණු "ElectionS" පරිගණක වැඩසටහනෙහි සිදුවිය යුතු නිවැරදි කිරීම් හා වැඩිදියුණු කිරීම් සිදුකිරීම හා පැරණි ඡන්දහිමි නාමලේඛන වල ඇතිවී තිබූ දෝෂ සකස් කර නිවැරදි කිරීම.

46.2 මැතිවරණ වලට අදාළ කටයුතු :

- මැතිවරණයේදී තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන් පරිගණක ගත කිරීමේ වැඩසටහනක් නිර්මාණය කිරීම

- මැතිවරණයේදී කෙටි පණිවුඩ සේවාව හරහා ජන්ද මධ්‍යස්ථාන නිරීක්ෂණයට අදාළ පරිගණක වැඩසටහන වැඩිදියුණු කිරීම.
- මැතිවරණ ප්‍රතිඵල වගුගත කිරීමේ වැඩසටහන වැඩිදියුණු කිරීම.

මහජනතාවට ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි තොරතුරු ලබාගත හැකි KIOSK යන්ත්‍ර සියළු දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වල ස්ථාපිත කිරීම නියමිත අතර 2019 වර්ෂය තුල ප්‍රධාන කාර්යාලයේ හා කොළඹ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ එම යන්ත්‍ර ස්ථාපිත කිරීම හා එහි නඩත්තු කටයුතු සිදුකිරීම.

දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වල CIGAS වැඩසටහන පරිගණක මඟින් පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය තාක්ෂණික සහය මහ භාණ්ඩාගාරයෙන් නොලැබෙන නිසා ගිණුම් සාරාංශ ඇතුලත් කිරීම සඳහා පරිගණක වැඩසටහනක් (Expenditure Management System) සකස් කිරීම සහ එය අවසන් කර ගිණුම් අංශය වෙත ලබා දීම.

ලංකා මෘදුකාංග පදනම (LSF) සමඟ සිදු කරන ‘‘මැතිවරණ කොමිෂන් සභාව සඳහා ඩිජිටල් විසඳුමක් හඳුන්වා දීමේ ව්‍යාපෘතිය’’ මගින් මැතිවරණ නාමයෝජනා ක්‍රියාවලිය, මැතිවරණ ආරවුල් නිරාකරණ ක්‍රියාවලිය (EDR), මැතිවරණ ප්‍රතිඵල වගුගත කිරීමේ ක්‍රියාවලිය, ප්‍රතිඵල මාධ්‍ය වෙත නිකුත් කිරීම යන ක්‍රියාවලීන්හි නිර්මාණ කටයුතු සඳහා අවශ්‍ය තාක්ෂණික සහය LSF නිලධාරීන් වෙත ලබාදීම.

මැතිවරණ වලදී භාවිතා කිරීම සඳහා නිලධාරී සංගණනයට අදාළ දත්ත පත්‍රවල තොරතුරු පරිගණක ගත කිරීම සඳහා සකසන ලද වැඩසටහන වැඩිදියුණු කිරීම.

මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ සහ සියළුම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වල භාවිතා කරන පරිගණක හා පරිගණක උපාංග වල තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් නිර්මාණය කරන ලද අතර එය යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම.

ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන්ගේ වාර්ෂික නිවාඩු ඇතුලත් කිරීම,අනුමත කිරීම යනාදිය ඉටුකිරීම සඳහා තොරතුරු පද්ධතියක් නිර්මාණය කිරීම හා 2020 වර්ෂය ආරම්භයේ සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු සලසාදීම.

මැතිවරණ සඳහා සංචිතගත කරන සියළුම වාහන ඇතුලත් පරිගණක වැඩසටහනක් සකස් කර ප්‍රවාහන අංශයේ භාවිතය සඳහා ලබා දීම.

- මැතිවරණ කොමිෂන් සභාවේ නිලවෙබ් අඩවිය , නිල ෆේස් බුක් පිටුව ඇතුළු සමාජ ජාලා පද්ධති යාවත්කාලීන කිරීම වර්ෂය පුරා සිදුකරන ලදී. මීට අමතරව මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවිය සුරක්ෂිත කිරීම සඳහා SSL සහතිකයක් ලබාගැනීම හා ස්ථාපිත කිරීම.
- ප්‍රධාන කාර්යලයේ පිහිටුවා ඇති දත්ත මධ්‍යස්ථානයේ සහ හම්බන්තොට මැතිවරණ කාර්යාලයේ පිහිටුවා ඇති දත්ත ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නඩත්තු කටයුතු අදාළ ආයතන මඟින් ඉටු කරවා ගැනීම.
- තැපැල් ඡන්ද අයඳුම්පත් පිරවීමට තොරතුරු ලබා දීම සඳහා ඊ- සේවා පහසුකම් ලබා දීම.
- තැපැල් ජන්ද නාමලේඛනය, මියගිය හා විදේශගත ජන්දහිමි නාමලේඛනය පිළියෙළ කිරීම.
- නිලධාරී සංගණනයට අදාළ දත්ත පත්‍රවල තොරතුරු පරිගණක ගත කිරීම සඳහා සකසන ලද වැඩසටහන වැඩිදියුණු කිරීම හා භාවිතය සඳහා සහය ලබාදීම.
- දේශපාලන පක්ෂ සඳහා අවශ්‍ය ජන්දහිමි නාමලේඛනයේ ලිපිනයන් සහිත වාර්තා ලබා ගැනීමට අදාළ වැඩසටහන සකස් කිරීම හා එම සංයුක්ත තැටි ලබා දීම.
- මැතිවරණ ප්‍රතිඵල වගුගත කිරීමට අවශ්‍ය පරිගණක පද්ධතිය සහ දිස්ත්‍රික්ක වලට එය භාවිතයට අවශ්‍ය පුහුණුව ලබාදීම.

- නිල ප්‍රතිඵල එසැනින් විකාශන අයිතිය මැතිවරණ කොමිෂන් සභාවෙන් ලබාගත් මාධ්‍ය ආයතන හා විද්‍යුත් මාධ්‍ය වෙත ලබාදීම.

- හදිසි බිඳවැටීමකදී අඛණ්ඩව ප්‍රතිඵල මාධ්‍ය වෙත ලබාදීමට අවශ්‍ය අමතර පරිගණක වැඩසටහනක් සකස් කර පරීක්ෂා කර සූදානම් කර තැබීම.

- දිස්ත්‍රික් ප්‍රතිඵල සැකසුම් මධ්‍යස්ථාන වල හා ප්‍රධාන කාර්යාලයේ ප්‍රතිඵල වගුගත කිරීමේ අංශයේ කටයුතු සඳහා යොදවා ගත් තොරතුරු තාක්ෂණ සහකාර අධ්‍යක්ෂවරුන් හා තොරතුරු තාක්ෂණ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

- කෙටි පණිවුඩ සේවාව හරහා ජන්ද මධ්‍යස්ථාන නිරීක්ෂණ කටයුතු සිදු කිරීම.

47. විගණනය සහ මූල්‍ය තොරතුරු

47.1 මූල්‍ය තොරතුරු

- 2019.10.11 දින පවත්වන ලද ඇල්පිටිය ප්‍රාදේශීය සභා ජන්ද විමසීම සඳහා රුපියල් මිලියන 18 ක් වැය වී ඇත.

- 2019.11.16 දින පැවති ජනාධිපතිවරණය සඳහා 2019.12.31 දිනට රුපියල් මිලියන 3217 ක් වැය වී ඇත. එම ජන්ද විමසීමේ නොපියවූ බිල්පත්/වවුචර්වල වටිනාකම රුපියල් මිලියන 1200 ක් පමණ තවදුරටත් බැරකම් වශයෙන් ගෙවීමට ඇති අතර ඒ අනුව ජනාධිපතිවරණය සඳහා වැය වෙතැයි අපේක්ෂිත දළ වියදම රුපියල් මිලියන 4500 ක් පමණ වනු ඇත.

- 2019 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනය පිළියෙල කිරීම සඳහා රුපියල් මිලියන 146.3 ක් පමණ වැය වී ඇති අතර 2018 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනය පිළියෙල කිරීමේ වියදම වූ රුපියල් මිලියන 133.5 ක වියදම සමග සසඳා බලනවිට මෙම වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනය පිළියෙල කිරීමේ වියදම රුපියල් මිලියන 12.8කින් පමණ වැඩිවීමක් පෙන්නුම් කෙරේ.

- 2019 වර්ෂයේ පුනරාවර්තන වියදම රුපියල් මිලියන 3989.4 ක් වූ අතර 2018 වර්ෂයේදී එම වියදම රුපියල් මිලියන 4052.7ක් විය. සමස්ථයක් වශයෙන් පසුගිය වර්ෂය සමග සසඳා බලනවිට පුනරාවර්තන වියදමේ අඩුවීමක් පෙන්නුම් කෙරේ. අක්මුදල් තොමැති වීම නිසා තවදුරටත් ජනාධිපතිවරණයට අදාළව ගෙවිය යුතු රුපියල් මිලියන 1200 එකතු කළ විට පසුගිය වසරට වඩා පුනරාවර්තන වියදමේ වැඩිවීමත් පෙන්නුම් කෙරේ.

- සෑම වර්ෂයකම ජුනි 01 දින යෙදී ඇති ඡන්ද භූමියන්ගේ දිනය ආශ්‍රිත ක්‍රියාකාරම් ඇතුළු දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා රුපියල් මිලියන17.6 ක් වැය කර ඇත.

- 2019 වර්ෂයේ මූලධන වියදම රුපියල් මිලියන 124.3ක් වූ අතර 2018 වර්ෂය හා සසඳා බලන විට එම වියදම රුපියල් මිලියන 71.7 ක වැඩිවීමක් පෙන්නුම් කෙරේ. ජනාධිපතිවරණයට අවශ්‍ය යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදි ගැනීම හා ගොඩනැගිලි වැඩිදියුණු කිරීමට වැඩි වියදමක් දැරීම මෙලෙස මූලධන වියදම් වැඩිවීමට බලපා ඇත.

- මෙම වර්ෂයේදී ආපදා ණය අත්තිකාරම් ඉල්ලුම් කළ නිලධාරීන්/ සේවකයින් 226 දෙනෙකුගෙන් නිලධාරීන්/ සේවකයින් 215 දෙනෙකු වෙනුවෙන් රුපියල් මිලියන 27.25 ක ණය අත්තිකාරම් ලබාදී ඇත. පසුගිය වර්ෂය හා සසඳා බලන විට මෙම වර්ෂයේ ලබාදී ඇති ණය මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 8.4 ක අඩු වීමක් පෙන්නුම් කෙරේ.

- 2019 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන උපුටන නිකුත් කිරීමෙන් ලද ආදායම රුපියල් මිලියන 5.9 කි. 2018 වර්ෂයේ මෙම අදායම රුපියල් මිලියන 5.9 ක් වූ අතර එම වර්ෂය සමඟ සසඳා බලනවිට උපුටන නිකුත් කිරීමෙන් ලද ආදායමේ වෙනසක් සිදුවිය නොමැත.

- ඡන්දහිමි නාමලේඛනය පොත් වශයෙන් සකස් කිරීම සීමා කර සංයුක්ත තැටි වශයෙන් පිළියෙල කරනු ලබන අතර ඒවා අලෙවි කිරීමෙන් මෙම වර්ෂයේ උපයාගත් ආදායම රුපියල් මිලියන 3.2 කි.

මෙම වර්ෂයේ ජනාධිපතිවරණය පැවැත්වීමට අවශ්‍ය කටයුතු ආරම්භ කර තිබූ බැවින් දේශපාලන පක්ෂවලට සංයුක්ත තැටි අලෙවි කිරීම නිසා මෙම ආදායම පසුගිය වර්ෂය හා සසඳා බලන විට රුපියල් මිලියන 1.3 ක වැඩි වීමක් පෙන්නුම් කෙරේ.

- කොමිෂන් සභාවේ කාර්යසාධනය වැඩි දියුණු කිරීම සඳහා නිලධාරීන්/ සේවයකයින් පුහුණු කිරීමේ කටයුතු වෙනුවෙන් දේශීය හා විදේශීය පුහුණු පාඨමාලා සඳහා රුපියල් මිලියන 2.8 ක් වැයකොට ඇත. 2018 වර්ෂය හා සසඳා බලන විට රුපියල් මිලියන2.3 කට ආසන්න ප්‍රමාණයකින් මෙම වියදම අඩු වී ඇත. ජනාධිපතිවරණය පැවැත්වීම නිසා කාර්ය මණ්ඩලය කාර්ය බහුල වීම හේතුවෙන් මැතිවරණ කාල සීමාව තුළ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම අවම වීම මෙම වියදම අඩුවීම වීමට බලපා ඇත.
- 2019 වර්ෂය තුළ දී අභ්‍යන්තර විගණන අංශය විසින් විගණන කාර්යයන් 31 ක් සිදු කරන ලද අතර විගණන වාර්තා 11ක් ඉදිරිපත් කර ඇත. එසේම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03ක් පවත්වා ඇත.
- 2019 වර්ෂය වෙනුවෙන් විවිධ විෂයයන් යටතේ 2019.12.31 දින දක්වා විගණන විමසුම් 10 ක් ඉදිරිපත් කර ඇත. ඉන් විමසුම් 07 ක් 2018 ගිණුම් වර්ෂයට අදාළ වන අතර විමසුම් 03 ක් 2019 ගිණුම් වර්ෂයට අදාළ වේ. එම විගණන විමසුම් සඳහා නියමිත කාල සීමා තුළ පිළිතුරු සැපයීමට කටයුතු කරන ලදී.

47.2 විගණන තොරතුරු

මැතිවරණ කොමිෂන් සභාවේ කටයුතු සම්බන්ධයෙන් දැනට පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමයට සම්බන්ධ වී එම කටයුතුවල අඩුපාඩු හා දුර්වලතා අනාවරණය කර ගැනීමට භාවිතා කරනු ලබන අභ්‍යන්තර සෝදිසියෙහි විධිමත්බව හා ප්‍රමාණවත් බව පිළිබඳ ස්වාධීන ඇගයීමක් සිදු කිරීම සඳහා 2019 වර්ෂය තුළදී විගණන කාර්යයන්/ විමර්ශන 31 ක් සිදු කර ඇති අතර විගණන වාර්තා/ විමර්ශන වාර්තා 15 ක් නිකුත් කර තිබේ.

2019 වර්ෂය තුළදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03 ක් පවත්වා ඇත. 2019 වර්ෂයේ සිව්වන කාර්තුව සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2020.01.16 දින පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල විගණනයේදී නිරීක්ෂණය කරන ලද පොදු කරුණු සම්බන්ධයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදී සාකච්ඡා කරන ලද අතර මැතිවරණ කොමිෂන් සභාව දැනුවත් කර විගණන නිරීක්ෂණවලින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා උපදෙස් ලබා දීමට ක්‍රියා කර ඇත.

48. සමස්ථ මූල්‍ය කාර්ය සාධනය සහ අනුකූලතා වාර්තාව

48.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය 2019		සටහන	තත්‍ය 2019	2018	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	**1**	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	**ඒසීඒ-1**
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		2,988,720,000	3,335,500,000	**ඒසීඒ-3**
-	තැන්පතු		7,371,282	7,808,446	**ඒසීඒ-4**
-	අත්තිකාරම් ගිණුම්		28,454,712	26,607,468	**ඒසීඒ-5**
-	වෙනත් ලැබීම්		95,536,927	31,974,110	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**3,120,082,921**	**3,401,890,024**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**3,120,082,921**	**3,401,890,024**	
	අඩුකළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
409,280,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	446,026,291	386,975,746	
4,307,300,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	3,533,797,651	3,661,589,059	**ඒසීඒ-2(ii)**
	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	-		
5,000,000	පොළී ගෙවීම්	**8**	4,225,560	4,125,409	
-	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	-	-	
4,721,580,000	**මුළු පුනරාවර්තන වියදම් (ඈ)**		**3,984,049,502**	**4,052,690,214**	
	මූලධන වියදම්				

30,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	28,185,581	21,824,325	
82,300,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	93,285,901	25,626,711	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	-	-	**ඒසිඒ-2(ii)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
5,000,000	හැකියා වර්ධනය	**14**	2,735,788	5,118,773	
5,050,000	වෙනත් මූලධන වියදම්	**15**	-	-	
122,350,000	**මුළු මූලධන වියදම් (ඉ)**		**124,207,269**	**52,569,809**	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		**102,166,231**	104,343,041	
	තැන්පතු ගෙවීම්		63,057,238	62,468,940	**ඒසිඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		39,108,993	41,874,101	**ඒසිඒ-5**
	මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)		4,210,423,001	4,209,603,064	
-	**දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)**		**(1,090,340,080)**	**(807,713,040)**	

48.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2019.12.31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

		තත්‍ය	
	සටහන	2019	2018
	- -	රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	1,970,538,536	1,902,369,135
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	106,506,939	95,852,658
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3		
මුළු වත්කම්		**2,077,045,475**	**1,998,221,793**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		97,946,505	31,606,269
දේපළ පිරියත හා උපකරණ සංචිතය		1,970,538,536	1,902,369,135
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	8,560,434	64,246,389
අග්‍රිම ශේෂය	ඒසීඒ-3		-
මුළු වගකීම්		**2,077,045,475**	**1,966,615,524**

48.3. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2019	**2018**
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		-
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	3,015,884,554	3,367,474,110
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**3,015,884,554**	**3,367,474,110**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	2,886,669,220	3,242,588,581
සහනාධාර සහ මාරුකිරීම්	4,225,560	4,125,409
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	1,093,154,721	805,976,224
	-	-
මූල්‍ය පිරිවැය - භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	3,984,049,501	4,052,690,214
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**3,984,049,501**	**4,052,690,214**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**(968,164,947)**	**(685,216,104)**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	28,454,712	26,607,468
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**28,454,712**	**26,607,468**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	124,207,271	52,569,809
අත්තිකාරම් ගෙවීම්	39,108,993	41,874,101
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	163,316,264	94,443,910
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(134,861,552)	(67,836,442)

මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**(1,103,026,499)**	**(753,052,546)**
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්		-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	7,371,282	7,808,446
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (උෑ)	**7,371,282**	**7,808,446**
	-	
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්		-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පත් ගිණුම් හා අනෙකුත් වගකීම්වල වෙනස්වීම්	63,057,238	62,468,940
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**63,057,238**	**62,468,940**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(උෑ)-(එ)	**(55,685,956)**	**(54,660,494)**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)		**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**(1,158,712,455)**	**(807,713,040)**

48.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

48.4.1. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව රු.	අවසන් ඇස්තමේන්තුව රු.	ප්‍රමාණය (රු)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ ලෙස %
20.02.02.99	පොලිය - අනෙකුත්	මිලියන 3	මිලියන 5	මිලියන 4.3	86
20.03.02.99	විකුණුම් හා ගාස්තු පරිපාලනාත්මක - ගාස්තු හා ගෙවීම්	මිලියන 0.05	මිලියන 0.05	මිලියන 0.04	80
20.03.99.00	විකුණුම් හා ගාස්තු අනෙකුත් - ලැබීම්	මිලියන 11	මිලියන73*	මිලියන 73	100
20.02.01.01	නිල නිවාස කුලී	මිලියන 1.5	මිලියන 1.5	මිලියන 1.1	73
20.04.01.00	වැන්දඹු අනත්දරු	මිලියන 16.3	මිලියන 16.3	මිලියන 16.3	100
20.06.02.02	ප්‍රාග්ධන විකුණුම් (අනෙකුත්)	මිලියන 3	මිලියන 0.8	මිලියන 0.8	100

*මේ තුළ ඇප තැන්පත් රජයේ ආදායමට ගැනීම රුපියල් මිලියන 55ක් ඇතුළත්ය.

48.5. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගරනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම රු.	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන රු.	අවසාන ප්‍රතිපාදනය රු.		
පුනරාවර්තන	4,721,580	4,725,960	3,984,050	84
ප්‍රාග්ධන	122,350	134,470	124,207	92

48.6. මු.රේ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරගනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01	මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය	උපාධිධාරී අභ්‍යාසලාභීන්ට දීමනා ගෙවීම	4,640	4,640	4,640	100
02	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	ණය අත්තිකාරම් මුදල් නිලව් කර ගැනීම	695	695	695	100

48.7. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2019 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2019 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	251,340	248,370	2,970	95
9152	යන්ත්‍රෝපකරණ	571,058	537,865	33,193	90
9153	ඉඩම්	1,091,916	1,090,873	1,043	95
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	33,208	33,208	-	100
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

48.8. විගණකාධිපතිවරයාගේ වාර්තාව

මැතිවරණ කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව ***සටහන් අංක XV***I ලෙස යා කර ඇත.

48.9. කාර්ය සාධන දර්ශකය

ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස තත්‍ය නිමැවුම (%)		
	100%-90%	**75%-89%**	**50%-74%**
		75%	

48.10. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

48.10.1. හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

අදාළ නොවේ.

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ			

48.10.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

අදාළ නොවේ.

48.11. මානව සම්පත් පැතිකඩ

48.11.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	55	50	05
තෘතීයික	16	05	11
ද්විතියික	483	455	28
ප්‍රාථමික	221	177	44

48.11.2 මානව සම්පත් සංවර්ධනය

2019 වර්ෂය අනුව

- 2019.01.01 දින සිට 2019.03.31 දින දක්වා

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs. 000)		වැඩසටහනේ ස්වභාවය	නිමැවුම / ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
මාණ්ඩලික නිලධාරී පුහුණු වැඩසටහන්						
දෙමළ භාෂා පුහුණුව (මූලික)	2	2019.01.28 දින සිට සය මාසික	රු . 15,000.00			
රාජ්‍ය වත්කම් කළමනාකරණය පිළිබඳ වැඩමුළුව	1	,2019.03.27 29 සහ 28	රු18,000.00.			
Certificate in Conversational Tamil	1	2019.020.8 - 2019.05.10	රු . 26,500.00			
රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරී හා අනෙකුත් නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන්						
Essential IT Skills	2	20190.1.23/24	රු . 26,000.00			
MS Project Management	1	2019.01.29-31	රු.18,000.00			
රාජ්‍ය මූල්‍ය රෙගුලාසි පිළිබඳ	1	-2019.03.25 27	රු.18,000.00			
කණ්ඩායම් පුහුණු වැඩසටහන්						
කාර්යාල සේවක සේවයේ නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන	40	2019.02.05, 06 සහ 07	නේවාසික / /ආහාරපාන වෙනත් (.රු) 261,199.50		රාජ්‍ය සේවය පිළිබඳ හැදින්වීම, කාර්යාල සේවක සේවා ව්‍යවස්ථාව පිළිබඳව, මැතිවරණ කොමිෂන් සභාව පිළිබඳව හා ආයතන සංග්‍රහය සහ කාර්යය පටිපාටික රීති ඇසුරෙන් කණිෂ්ඨ සේවකයන්ට අදාල වන මූලික කරුණු පිළිබඳව දැනුම්වත් කිරීම.	

සංවර්ධන නිලධාරීන් / රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන්/ ලේඛන සහකාර නිලධාරීන් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන (IFES ආයතනයේ සහාය ඇතිව)	24	2019.02.26-28	IFES ආයතනය විසින් පහසුකම් සපයන ලදී.		මැතිවරණ කොමිෂන් සභාවේ උපාය මාර්ගික සැලැස්මේ දක්වා ඇති පරිදි පාර්ශවකරුවන් දැනුම්වත් කිරීම සඳහා වැඩමුළු , දේශන හා පුහුණු සැසි පැවැත්වීමට අවශ්‍ය නායකත්වයට පුහුණු කිරීම	
ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නවක නිලධාරීන්ගේ පළමු කණ්ඩායම සඳහා සේවාරම්භක පුහුණුව	40	2019.03.11	41,100.00		ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳ දැනුම්වත් කිරීම.	
නි.මැ.කොා. / ස.මැ.කොා./ රා.ක.ස. / සං.නි./ ලේ.ස. සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩසටහන, කොළඹ	52	2019.03.13, 14 හා 15	269,360.00		ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ හැදින්වීම, කාර්යයන්, වගකීම. මු.රෙ. 135 ප්‍රකාරව බලතල පැවරීම/ ප්‍රසම්පාදන බලතල පැවරීම, ලංසු ලියවිලි පිළියෙල කිරීම, ලංසු විවෘත කිරීම, ලංසු ලේඛනවල වලංගුභාවය පිළිබඳ විස්තර, ලංසු බැඳුම්කර / තැන්පතු ප්‍රසම්පාදන කටයුතුවල කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ අධ්‍යයනය, ගබඩා සමීක්ෂණ කටයුතු පිළිබඳ අධ්‍යයනය	

නි.මැ.කොා. / ස.මැ.කොා./ රා.ක.ස. / සං.නි./ ලේ.ස. සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩසටහන, අනුරාධපුර	38	2019.03.25, 26 සහ 27	206,915.50		- එම-	
ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නවක නිලධාරීන්ගේ දෙවන කණ්ඩායම සඳහා සේවාරම්භක පුහුණුව	40	2019.03.26 සහ 27	41,106.00		ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳ දැනුම්වත් කිරීම.	
නි.මැ.කොා. / ස.මැ.කොා./ රා.ක.ස. / සං.නි./ ලේ.ස. සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩසටහන, මහනුවර	38	2019.03.28, 29 සහ 30	208,191.50		ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ හැදින්වීම, කාර්යයන්, වගකීම. මු.රෙ. 135 ප්‍රකාරව බලතල පැවරීම/ ප්‍රසම්පාදන බලතල පැවරීම, ලංසු ලියවිලි පිළියෙල කිරීම, ලංසු විවෘත කිරීම, ලංසු ලේඛනවල වලංගුභාවය පිළිබඳ විස්තර, ලංසු බැඳුම්කර / තැන්පතු ප්‍රසම්පාදන කටයුතුවල කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ අධ්‍යයනය, ගබඩා සමීක්ෂණ කටයුතු පිළිබඳ අධ්‍යයනය	

- 2019.04.01 දින සිට 2019.06.30 දින දක්වා

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs. 000)		වැඩසටහනේ ස්වභාවය	නිමැවුම / ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
මාණ්ඩලික නිලධාරී පුහුණු වැඩසටහන්						
Leading for the next Generation	1	2019.06.11 සහ 12	රු13,000.00 .			
Project Proposal Writing Skills	1	2019.06 27. සහ 28	රු13,000.00 .			
රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරී හා අනෙකුත් නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන්						
Government Payroll system	1	20190.4.01-03	රු 18,000.00			
කණ්ඩායම් පුහුණු වැඩසටහන්						
සංවර්ධන නිලධාරීන් / රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන්/ ලේඛන සහකාර නිලධාරීන් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන (IFES ආයතනයේ සහාය ඇතිව)	20	2019.04.04-05	IFES ආයතනය විසින් පහසුකම් සපයන ලදී.		මැතිවරණ කොමිෂන් සභාවේ උපාය මාර්ගික සැලැස්මේ දක්වා ඇති පරිදි පාර්ශවකරුවන් දැනුම්වත් කිරීම සඳහා වැඩමුළු , දේශන හා පුහුණු සැසි පැවැත්වීමට අවශ්‍ය නායකත්වයට පුහුණු කිරීම	
උපාය මාර්ග සැලැස්මට සම්බන්ධ විෂය භාර නිලධාරීන් සඳහා සිවු අවුරුදු උපායමාර්ගික සැලැස්මට අදාළ පරිගණකගත මෙහෙයුම් හා ඇගයුම් පුහුණු වැඩමුළුව	50	2019.04.08	රු.54,810.00		මැතිවරණ කොමිෂන් සභාවේ උපාය මාර්ගික සැලැස්මේ දක්වා ඇති වැඩසටහන්වල ප්‍රගති සමාලෝචන කාර්යයන් , තොරතුරු තාක්ෂණ ක්‍රමවේද අනුව ක්‍රියාත්මක කිරීම සම්බන්ධව දැනුම්වත් කිරීම.	

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නවක නිලධාරීන්ගේ තෙවන කණ්ඩායම සඳහා සේවාරම්භක පුහුණුව	40	2019.05 02. සහ 03	රු .41,27700			
රියදුරු පුහුණු වැඩසටහන	21	2019.05.23, 24 සහ 25	රු.123,520.00		මෝටර් කාර්මික දැනුම දියුණු කරගැනීම , අනතුරු අවම කරගැනීම සඳහා මාර්ග නීති භාවිතය හා නිවැරදි රිය ධාවනය පිළිබඳ අවබෝධය ලබාදීම	
නි.මැ.කො. / ස.මැ.කො./ රා.ක.ස. / සං.නි./ ලේ.ස. සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩසටහන, කිලිනෝච්චිය	39	.2019.0525 , 26 සහ 27	රු . 201,980.00			
නි.මැ.කො. / ස.මැ.කො./ රා.ක.ස. / සං.නි./ ලේ.ස. සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩසටහන, ගාල්ල	45	2019.05.29, 30 සහ 31	රු . 165,314.44			
හිමිකම් විරෝධතා පරීක්ෂණ පැවැත්වීම පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන , කොළඹ	32	2019.06.03	රු.15,365.00		ලියාපදිංචි කිරීමේ වැදගත්කම, ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය හා ප්‍රතිශෝධන දින වකවානු පැහැදිලි කිරීම	

					හා ප්‍රසිද්ධ පරීක්ෂණ පැවැත්වීමේ ක්‍රියාවලිය පිළිබඳ දැනුම්වත් කිරීම. සිද්ධි අධ්‍යනය හා කණ්ඩායම් ක්‍රියාකාරකම්	
හිමිකම් විරෝධතා පරීක්ෂණ පැවැත්වීම පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන , ගාල්ල	28	2019.06.06	රු.83,900.00		- එම-	
රියදුරු පුහුණු වැඩසටහන	21	2019.06.06 , 07 සහ 08	රු.123,520.00		මෝටර් කාර්මික දැනුම දියුණු කරගැනීම , අනතුරු අවම කරගැනීම සඳහා මාර්ග නීති භාවිතය හා නිවැරදි රිය ධාවනය පිළිබඳ අවබෝධය ලබාදීම	
හිමිකම් විරෝධතා පරීක්ෂණ පැවැත්වීම පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන , මහනුවර	30	2019.06.07	රු.54,692.00			
හිමිකම් විරෝධතා පරීක්ෂණ පැවැත්වීම පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන , අනුරාධපුර	20	2019.06.14	රු.30,850.00			

හිමිකම් විරෝධතා පරීක්ෂණ පැවැත්වීම පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන , වවුනියාව	28	2019.06.15	රු.39,825.00			

- 2019.07.01 දින සිට 2019.09.30 දින දක්වා

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs. 000)		වැඩසටහනේ ස්වභාවය	නිමැවුම / ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
මාණ්ඩලික නිලධාරී පුහුණු වැඩසටහන්						
පරිපාලනමය නීතිය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	1	2019-2020	රු . 60,000.00			
ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව	1	2018-2019	රු . 90,000.00			
කණ්ඩායම් පුහුණු වැඩසටහන්						
මාණ්ඩලික නිලධාරීන් සඳහා ඉදිරි ඡන්ද විමසීම්වලට අදාළ ධාරිතා පුහුණු වැඩමුළුව	36	2019.06.30 , 2019.07.01 සහ 02	IFES ආයතනය විසින් පහසුකම් සපයන ලදී.			
තොරතුරු තාක්ෂණ නිලධාරී හා තොරතුරු තාක්ෂණ සහකාරකව රුන්ගේ සේවාර්ථිභක පුහුණුව	20	2019.07.04	8,500.00			
විද්‍යුත් හා මුද්‍රිත ප්‍රාදේශීය මාධ්‍යවේදීන් දැනුම්වත් කිරීමේ වැඩමුළුව	55	2019.07.17	46,375.00			

- 2019.10.01 දින සිට 2019.12.31 දින දක්වා

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs. 000)		වැඩසටහනේ ස්වභාවය	නිමැවුම / ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
මාණ්ඩලික නිලධාරී පුහුණු වැඩසටහන්						
විගණන සැලැස්ම පිළිබඳ පුහුණු වැඩසටහන	1	2019.12.13				
MBA in Information Technology/ MBA in E.Gov. පශ්චාත් උපාධි පාඨමාලාව	1	2020	පළමු වාරිකය රු . 175,000.00			
භාෂා පරිවර්තනය හා භාෂණ පරිවර්තන ඩිප්ලෝමා පාඨමාලාව	1	2020	රු . 60,000.00			
රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරී හා අනෙකුත් නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන්						
අභ්‍යන්තර විගණනය පිළිබඳ පුහුණු වැඩමුළුව	4	2019.12.05				
කණ්ඩායම් පුහුණු වැඩසටහන්						
ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවාගත් ආධුනික නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණුව මැතිවරණ) (කොමිෂන් සභාව	44	2019.09.25 , 26 සහ 27	රු . 45,320.00			
ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවාගත් ආධුනික නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණුව (ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය)	131	2019.10.14 , 15 සහ 16 2019.10.28 , 29 සහ 30 2019.11.04 , 05 සහ 06	-			
රියදුරු සේවය/ කාර්යාල සේවක සේවයේ නිලධාරීන් සඳහා දෙමළ භාෂාව පිළිබඳ දින 06 පුහුණු වැඩසටහන (ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව)	15	2019.10.16 – 23	-			

48.12. අනුකූලතා වාර්තාව

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ ගිණුම් / නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ	-	-
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	-	-
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ	-	-
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ	-	-
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ	-	-
1.6	වෙනත්	අදාළ නොවේ	-	-
2	**පොත්පත් ලේඛන නඩත්තු කිරීම (445.රෙ.මු)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකට නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-

2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (135.රෙ.මු)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුල බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ	-	-
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවවත් හරහා අනුමක වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ	-	-
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
වලිකාමම් නිරිත ප්‍රාදේශීය සභාව		අම්පිකෛයාපාහන් කේතුසන්	සභික	ද.ජ.වි.පෙ.	ඉල්ලා අස්වීම	2019.05.13	තම්බිප්පිල්ලෙයි තයාබරන්	2123/30 2019.05.14
පේදුරුතුඩුව නගර සභාව		එංකරතාස් ඉලවරසි	සභික	අ.ඉ.ත.කො.	ඉල්ලා අස්වීම	2019.05.15	වසන්ති සිවකඩාඩ්සම්	2123/79 2019.05.17
වාවකච්චේරි ප්‍රාදේශීය සභාව		සිවකුණසෝදි වල්ලිපුරම්	සභික	අ.ඉ.ත.කො.	ඉල්ලා අස්වීම	2019.05.31	කන්දයියා තුර්ක්කා	2126/3 2019.06.03
වාවකච්චේරි ප්‍රාදේශීය සභාව		නවරත්නිනම් බාලචන්දිරන්	සභික	අ.ඉ.ත.කො.	ඉල්ලා අස්වීම	2019.05.31	ජෙයක්කුමාර් නිදර්සන්	2126/3 2019.06.03
වාවකච්චේරි ප්‍රාදේශීය සභාව		සෙල්ලෛයා ජයබාලන්	සභික	අ.ඉ.ත.කො.	ඉල්ලා අස්වීම	2019.05.31	රාමනාදන් යෝගේශ්වරන්	2126/3 2019.06.03
වාවකච්චේරි ප්‍රාදේශීය සභාව		ආල්වාප්පිල්ලෙයි සාන්දකුමාර්	සභික	අ.ඉ.ත.කො.	ඉල්ලා අස්වීම	2019.05.31	සිවකුමාරන් ගජේන්	2126/3 2019.06.03
යාපනය මහ නගර සභාව		අජන්තා තනබාලසිංගම්	සභික	අ.ඉ.ත.කො.	ඉල්ලා අස්වීම	2019.06.04	ඩේයිසි ෆිලිප් ජෙයරංජන්	2126/37 2019.06.06
යාපනය මහ නගර සභාව		සුගන්දිනි සිරිහරන්	සභික	අ.ඉ.ත.කො.	ඉල්ලා අස්වීම	2019.06.04	ලවකිසන් දර්ෂිපා	2126/37 2019.06.06
වැල්වැටිතුරයි නගර සභාව		කන්දෛයා පේරානන්දන්	සභික	අ.ඉ.ත.කො.	ඉල්ලා අස්වීම	2019.06.25	තුරෛසිරාසා ශ්‍රීතරන්	2129/63 2019.06.26
වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය සභාව		යෝතිස්වරසාමි නාගරාජා	සභික	ශ්‍රී.ලං.නි.ප.	ඉල්ලා අස්වීම	2019.07.23	මහේන්දිරන් පිරේමන්	2133/34 2019.07.24
වේලනෛයි ප්‍රාදේශීය සභාව		පුලේන්තිරන් කජන්	සභික	අ.ඉ.ත.කො.	ඉල්ලා අස්වීම	2019.08.15	අරුමුගම් කෝබාලක්‍රිෂ්ණන්	2136/22 2019.08.15
වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාව		සෙල්වරාසා ක්‍රිෂ්ණරාසා	සභික	ස්වා.	ඉල්ලා අස්වීම	2019.08.27	කුනබාලක්‍රිෂ්ණන් කිරුබාකරන්	2138/22 2019.08.28

පළාත් පාලන ආයතනය	කොට්ඨාස අංකය හා නම	පුරප්පාඩුව ඇති වූ සභිකයාගේ නම	තනතුර	පක්ෂය/ ස්වාධීන කණ්ඩායම	පුරප්පාඩු වීමට හේතුව	තෝරා එවූ දිනය	තේරී පත්වූ සභිකයාගේ නම	ගැසට් පත්‍රයෙහි අංකය හා දිනය
කිලිනොච්චි දිස්ත්‍රික්කය								
කරච්චි ප්‍රාදේශීය සභාව		කුමාරසාමි දරුමරාසා	සභික	ශ්‍රී.ලං.නි.ප.	ඉල්ලා අස්වීම	2019.04.11	විශ්වනාදන් චිත්තියානන්දන්	2118/75 2019.04.12
කරච්චි ප්‍රාදේශීය සභාව		අයියම්පිල්ලෙ අසෝක්කුමාර්	සභික	ශ්‍රී.ලං.නි.ප.	ඉල්ලා අස්වීම	2019.04.30	වේලායුදම් ගජන්	2121/48 2019.05.02
කරච්චි ප්‍රාදේශීය සභාව		තංගවේල් ජෙගදීශ්වරන්	සභික	අ.ඉ.ත.කො.	ඉල්ලා අස්වීම	2019.06.10	ජෝසෆ් ජෙන්සන්	2127/9 2019.06.11
කරච්චි ප්‍රාදේශීය සභාව		කුබේන්ද්‍රසෙල්වම් පුවීදන්	සභික	ද්‍ර.එ.වි.පෙ.	ඉල්ලා අස්වීම	2019.05.23	කන්දෙයියා ධර්මලිංගම්	2124/37 2019.05.24
පූනාකරි ප්‍රාදේශීය සභාව		සෙල්වරාසා නිරෝෂන්	සභික	එ.ජා.ප.	ඉල්ලා අස්වීම	2019.07.31	ක්‍රිෂ්ණසාමි දිවාකරන්	2134/49 2019.08.01
කරච්චි ප්‍රාදේශීය සභාව	08-වට්ටකච්චි	සතාසිවම් පොන්නුත්තුරෙයි	සභික	ඉ.ත.අ.ක.	ඉල්ලා අස්වීම	2019.12.10	අන්තෝනිපිල්ලයි සිවකුමරන්	2153/14 2019.12.12
කරච්චි ප්‍රාදේශීය සභාව		පිරබාමනි කනේසමූර්ති	සභික	ඉ.ත.අ.ක.	ඉල්ලා අස්වීම	2019.12.10	ලලිතකුමාරි සත්තියමූර් ති	2153/14 2019.12.12
වවුනියාව දිස්ත්‍රික්කය								
වවුනියාව දකුණ (දෙමළ) ප්‍රාදේශීය සභාව		සිවකුලන්දෙයි නඩරාජ්	සභික	ස්වා.	ඉල්ලා අස්වීම	2019.04.09	මණියම් නාගේන්දිරරාසා	2118/52 2019.04.10
වවුනියාව දකුණ (දෙමළ) ප්‍රාදේශීය සභාව	06-සලම්බයිකුලම්	නානුර්පිච්චයි ජවාහිර්	සභික	එ.ජා.ප.	ඉල්ලා අස්වීම	2019.08.07	සුබ්‍රමනියම් ගනේසන්	2135/52 2019.08.07
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව		තිරුණාවුක්කරසු විජිකරන්	සභික	අ.ඉ.ත.කො.	ඉල්ලා අස්වීම	2019.09.09	කනගර් කනපතිපිල්ලයි	2110/32 2019.09.10
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව		සිවරංගිනි රගුනේසන්	සභික	අ.ඉ.ත.කො.	ඉල්ලා අස්වීම	2019.09.23	තවරානි මුත්තයියා	2142/11 2019.09.24
වවුනියාව දකුණ (දෙමළ) ප්‍රාදේශීය සභාව		සෙල්වරාසා රේගන්	සභික	ඊ.ජ.ප්‍ර.ප.	ඉල්ලා අස්වීම	2019.12.02	තර් මකුලසිංගම් සුජීවන්	2152/9 2019.12.03
වවුනියාව දකුණ (දෙමළ) ප්‍රාදේශීය සභාව		නාකේන්දිරන් කිෂ්ශන්තන්	සභික	ඊ.ජ.ප්‍ර.ප.	ඉල්ලා අස්වීම	2019.12.02	රාසයියා දුෂයන්තන්	2152/9 2019.12.03
වවුනියාව නගර සභාව		බාලසිංගම් ප්‍රසන්න	සභික	ඊ.ජ.ප්‍ර.ප.	ඉල්ලා අස්වීම	2019.12.02	විජයකුමාර් ජෝඑල් නිරෝෂන්	2152/8 2019.12.03

පළාත් පාලන ආයතනය	කොට්ඨාස අංකය හා නම	පුරප්පාඩුව ඇති වූ සභිකයාගේ නම	තනතුර	පක්ෂය/ ස්වාධීන කණ්ඩායම	පුරප්පාඩු වීමට හේතුව	තෝරා එවූ දිනය	තේරී පත්වූ සභිකයාගේ නම	ගැසට් පත්‍රයෙහි අංකය හා දිනය
මූලතිව් දිස්ත්‍රික්කය								
පුතුකුඩිඉරුප්පු ප්‍රාදේශීය සභාව		ඇන්ටන් රත්නරාජා ලාවන්ජා	සභික	ස්වා.	ඉල්ලා අස්වීම	2019.07.29	සෙල්වරානි අරුලානන්තම්	2134/31 2019.07.30
පුතුකුඩිඉරුප්පු ප්‍රාදේශීය සභාව	03-උදයාර්කට්ටු	සබාරෙත්තිනම් තිරුච්චෙල්වම්	සභික	ඉ.ත.අ.ක.	ඉල්ලා අස්වීම	2019.09.24	චලර්මනි සුබාකරන්	2142/44 2019.09.24
මඩකලපුව දිස්ත්‍රික්කය								
කාත්තන්කුඩි නගර සභාව		මුහම්මදු බුහාරි මුහම්මදු ෆිර්දවුස්	සභික	ය.සඳහා වූ ජා.පෙ.	ඉල්ලා අස්වීම	2019.02.11	අබ්දුල්ලතීෆ් මොහම්මදු සබීල්	2110/11 2019.02.12
එරාවුර් නගර සභාව		මීරාසාහිබ් රස්මියා	සභික	එ.ජා.ප.	මියයාම	2019.01.30	ෂබ්නා උම්මා	2108/64 2019.02.01
පෝරතිව්පත්තු ප්‍රාදේශීය සභාව		වී.ආයුෂ්මන්	සභික	ස්වා.	ඉල්ලා අස්වීම	2019.03.06	එන්.ඉන්ද්‍රනාදන්	2113/41 2019.03.06
මඩකලපුව මහ නගර සභාව		සිවලිංගම් සෝමසුන්දරම්	සභික	ද්‍ර.එ.වි.පෙ.	පක්ෂ සාමාජිකත්වය අහිමිවීම	2019.05.24	වඩිවේල් කුබේරන්	2125/5 2019.05.27
කාත්තන්කුඩි නගර සභාව		අහමඩ් මොහිඩීන් මොහමඩ් මාහිර්	සභික	අ.ඉ.ම.කො.	ඉල්ලා අස්වීම	2019.04.30	තම්බි ලෙබ්බේ තිනුල් ජවුෆර්	2121/47 2019.05.02
කෝරලේපත්තු බටහිර ප්‍රාදේශීය සභාව		සේනුලෙබ්බෙයි ෆායිෂා	සභික	එ.ජා.ප.	ඉල්ලා අස්වීම	2019.06.03	මුහයිඩීන් පාවා ජෙමීලා	2126/17 2019.06.04
කෝරලේපත්තු ප්‍රාදේශීය සභාව		නාහලිංගම් තිරවියම්	සභික	ත.ම.වි.පු.	ඉල්ලා අස්වීම	2019.06.07	පොන්නයියා පුස්පේන්ද්‍රන්	2127/4 2019.06.10
පෝරතිව්පත්තු ප්‍රාදේශීය සභාව		ක්‍රිෂ්ණපිල්ලයි සිවනේසන්	සභික	ත.ම.වි.පු.	ඉල්ලා අස්වීම	2019.08.29	ගෝපාලපිල්ලයි රාසු	2138/43 2019.08.30
කාත්තන්කුඩි නගර සභාව		හනීෆා රකීෆා	සභික	ය.සඳහා වූ.ජා.පෙ.	ඉල්ලා අස්වීම	2019.08.30	අබ්දුල් හමීදු ජම්මූන් නිසා	2138/47 2019.08.31
කාත්තන්කුඩි නගර සභාව		අහමඩ් ලෙබ්බේ මුහම්මදු ඉල්මි	සභික	ය.සඳහා වූ.ජා.පෙ.	ඉල්ලා අස්වීම	2019.08.30	පකීර් මොහයිදීන් මුහම්මදු ඉර්සාත්	2138/47 2019.08.31
මඩකලපුව මහ නගර සභාව		වේලුපිල්ලයි ඥානේස්වරි	සභික	ද්‍ර.එ.වි.පෙ.	පක්ෂ සාමාජිකත්වය අහිමි වීම	2019.09.24	වර්නේස්වරි රවිචන්ද්‍රන්	2142/43 2019.09.24
කාත්තන්කුඩි නගර සභාව		උමරුලෙව්වයි මුහම්මදු නූරුල් මුබීන්	සභික	මු.ජා.ස.	ඉල්ලා අස්වීම	2019.09.24	අහමදුලෙබ්බයි මුහම්මදු මර්සූක්	2142/46 2019.09.24
කාත්තන්කුඩි නගර සභාව		මුහම්මතු ෆාරූක් මුහම්මතු සිබ්ලි	සභික	මු.ජා.ස.	ඉල්ලා අස්වීම	2019.10.04	අහමදුලෙබ්බේ අලි අක්බාර්	2144/9 2019.10.07

පළාත් පාලන ආයතනය	කොට්ඨාස අංකය හා නම	පුරප්පාඩුව ඇති වූ සභිකයාගේ නම	තනතුර	පක්ෂය/ ස්වාධීන කණ්ඩායම	පුරප්පාඩු වීමට හේතුව	තෝරා එවූ දිනය	තේරී පත්වූ සභිකයාගේ නම	ගැසට් පත්‍රයෙහි අංකය හා දිනය
අම්පාර දිස්ත්‍රික්කය								
අක්කරෙයිපත්තු මහ නගර සභාව		අබ්දුල් අමීර් ඉල්මුනිසා	සභික	ජා.කොං.	ඉල්ලා අස්වීම	2019.04.29	සලීම් පාත්තිමා රුස්තා	2921/22 2019.04.30
අක්කරෙයිපත්තු මහ නගර සභාව		නූරුදීන් මොහොම්මඩ් සිරාජ්	සභික	ය.සඳහා වූ ජා.පෙ.	ඉල්ලා අස්වීම	2019.04.29	මුහම්මදු මුහයියදීන් මුහම්මද් තයියාර්	2121/26 2019.04.30
අඩ්ඩාලච්චේනයි ප්‍රාදේශීය සභාව		මීරාසායිවු මුහම්මදු ජවුෆර්	සභික	ජා.කොං.	ඉල්ලා අස්වීම	2015.05.23	මීරාසායිවු මුහම්මදු නියාල්	2124/38 2019.05.24
කල්මුණේ මහ නගර සභාව		යාක්කුප් නලීලුර් රහ්මාන්	සභික	අ.ඉ.ම.කොං.	ඉල්ලා අස්වීම	2019.06.03	අලියාර් නෙයිනා මුහම්මදු	2126/18 2019.06.04
නින්දවුර් ප්‍රාදේශීය සභාව		අලියාර් බසීරා උම්මා	සභික	අ.ඉ.ම.කොං.	ඉල්ලා අස්වීම	2019.06.03	ආදම්වාවා රිෆානා	2126/19 2019.06.04
කල්මුණේ මහ නගර සභාව		අබ්දුල් ගෆූර් මොහමඩ් නදීර්	සභික	ය.සඳහා වූ ජා.පෙ.	ඉල්ලා අස්වීම	2019.06.13	තාජුදීන් මුහම්මදු මුෆාරිස්	2127/30 2019.06.14
කල්මුණේ මහ නගර සභාව		අබ්දුල් ලතීප් මුහම්මදු රිෆාස්	සභික	ජා.කොං.	ඉල්ලා අස්වීම	2019.06.08	මුහමඩ් මන්සූර් සෆ්රාස්	2130/8 2019.07.01
අක්කරෙයිපත්තු මහ නගර සභාව		අබ්දුල් ගෆූර් අස්මි	සභික	ජා.කොං.	ඉල්ලා අස්වීම	2019.07.04	මුහම්මඩ් කාසීම් මුහම්මඩ් යාසීර්	2130/55 2019.07.05
උහන ප්‍රාදේශීය සභාව		හේනකරාලලාගේ සෙනරත් බණ්ඩාර	සභික	එ.ජා.ප.	ඉල්ලා අස්වීම	2019.09.24	හොරතල් පේඩිගේ ප්‍රියන්ත සිසිර කුමාර	2142/45 2019.09.24
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය								
කන්තලේ ප්‍රාදේශීය සභාව		දෙහිවල ගුරුන්නාන්සේලාගේ ජෝර්ජ් කැමිලස් කොස්තා	සභික	ස්වා.	ඉල්ලා අස්වීම	2019.06.10	හිටිහාමු මුදියාන්සේලාගේ මුතුබන්ඩා	2127/11 2019.06.11
මුත්තූර් ප්‍රාදේශීය සභාව		ජෙනුදීන් මුහමඩ් සුක්රි	සභික	ජා.කොං.	ඉල්ලා අස්වීම	2019.06.28	සේහුතම්බි සගුපර්	2129/101 2019.06.29
කුච්චවේලි ප්‍රාදේශීය සභාව		සුබ්‍රමණියම් පරමේස්වරන්	සභික	අ.ඉ.ත.කොං.	ඉල්ලා අස්වීම	2019.08.27	සූසයිපිල්ලයි මෝහනදාස්	2138/23 2019.08.28
කින්නියා නගර සභාව		අබ්දුල් මජීදු අනීස්	සභික	ය.සඳහා වූ ජා.පෙ.	ඉල්ලා අස්වීම	2019.08.27	උමර් අලි රනීස්	2138/24 2019.08.28
කින්නියා නගර සභාව		මුහම්මදු ඉස්මයිල් අන්වරුල් සාජහාන්	සභික	ය.සඳහා වූ ජා.පෙ.	ඉල්ලා අස්වීම	2019.08.20	මුහම්මදු සුල්තාන් නිජාම්ඩීන්	2137/49 2019.08.21

පළාත් පාලන ආයතනය	කොට්ඨාස අංකය හා නම	පුරප්පාඩුව ඇති වූ සභිකයාගේ නම	තනතුර	පක්ෂය/ ස්වාධීන කණ්ඩායම	පුරප්පාඩු වීමට හේතුව	තෝරා එවූ දිනය	තේරී පත්වූ සභිකයාගේ නම	ගැසට් පත්‍රයෙහි අංකය හා දිනය
කුරුණෑගල දිස්ත්‍රික්කය								
ගිරිබාව ප්‍රාදේශීය සභාව	02-පැරකුම්පුර	විෂ්ණක මොහොට්ටි මුදියන්සේලාගේ නයනානන්ද විෂ්නක	සභික	ශ්‍රී.ලං.පො.පෙ.	මියයාම	2019.02.28	අධිකාරි මුදියන්සේලාගේ ආරියරත්න	2113/39 2019.03.06
කුරුණෑගල ප්‍රාදේශීය සභාව		ජේරි තික්රුල්ලා	සභික	ශ්‍රී.ලං.මු.කො.	ඉල්ලා අස්වීම	2019.04.02	මොහමඩ් මුනාස් මොහොමඩ් මුසීන්	2117/15 2019.04.03
වාරියපොල ප්‍රාදේශීය සභාව	23-දෙමටඑව	සුබෝධ ගුත්තික වීසිංහ බණ්ඩාර	සභික	ශ්‍රී.ලං.පො.පෙ.	මියයාම	2019.05.24	තෙන්නකෝන් මුදියන්සේලාගේ සෝමාවතී	2125/25 2019.05.28
කුරුණෑගල මහ නගර සභාව		ක්‍රිෂ්ණපාලන් ත්‍යාගරාජා	සභික	එ.ජ.නි.ස.	සභික ධුරය අහිමිවීම	2019.04.01	බ්‍රාහ්මණ ආරච්චිගේ සුසාන්ත	2118/39 2019.04.09
පන්නල ප්‍රාදේශීය සභාව	20-පන්නල	අධිකාරි මුදියන්සේලාගේ නලිනි ගුණසේන	සභික	ස්වා.	ඉල්ලා අස්වීම	2019.05.10	ලියන පතිරන්නෑහැලාගේ චන්ද්‍රපාල	2125/2 2019.05.27
උඩුබද්දාව ප්‍රාදේශීය සභාව		ඇල්පෙනේරිස්ගේ හසිනි සඳතාකා	සභික	එ.ජා.ප.	අවසර ලබා නොගෙන මාසතුනක කාලසීමාවක් සභාවේ අනුගාමී රැස්වීම්වලට සහභාගී නොවීම	2019.07.16	තම්ම හෙට්ටි මුදලිගේ ඇග්නස් ජසින්තා පීරිස්	2133/35 2019.07.24
පඬුවස්නුවර ප්‍රාදේශීය සබාව		යාපා මුදියන්සේලාගේ සෝමරත්න	සභික	එ.ජා.ප.	මියයාම	2019.09.18	පනම්බර මුදියන්සේලාගේ කුමාරසේන ජයලත්	2141/74 2019.09.19
කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව		ඒ.ඉන්දික රුවන් කුමාර	සභික	ජ.වි.පෙ.	ඉල්ලා අස්වීම	2019.09.27	පී.ඒම්.වික්‍රමරත්න	2143/6 2019.09.30
පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව		නිශ්ශංක ධනුෂ්ක රත්නජීව පුෂ්ප කුමාර	සභික	එ.ජ.නි.ස.	පක්ෂ සාමාජිකත්වය අහිමි වීම	2019.12.23	බාලසූරිය මුදියන්සේලාගේ අනුර කුමාර බාලසූරිය	2155/35 2019.12.28

පළාත් පාලන ආයතනය	කොට්ඨාස අංකය හා නම	පුරප්පාඩුව ඇති වූ සභිකයාගේ නම	තනතුර	පක්ෂය/ ස්වාධීන කණ්ඩායම	පුරප්පාඩු වීමට හේතුව	තෝරා එවූ දිනය	තේරී පත්වූ සභිකයාගේ නම	ගැසට් පත්‍රයෙහි අංකය හා දිනය
පුත්තලම දිස්ත්‍රික්කය								
නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව		වර්ණකුල ආදිත්ත අර්ශනිල ඉත්ත තිමාෂා සුහෝදනී ලෝව්	සභික	එ.ජා.ප.	අවසර ලබා නොගෙන මාසතුනක කාලසීමාවක් සභාවේ අනුගාමී රැස්වීම්වලට සහභාගී නොවීම	2019.07.22	පෝරුතොටගේ එලන්රෝස් ප්‍රනාන්දු	2133/55 2019.07.26
පුත්තලම නගර සභාව		මොහමඩ් තාහා නුරුල් අමීන්	සභික	ය.සඳහා වූ ජා.පෙ.	ඉල්ලා අස්වීම	2019.08.08	අහමඩ් කබීර් සිත්ති සලීමා	2137/4 2019.08.19
වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව		කටුවල කන්දේ ගම්ලද්දලාගේ ප්‍රදීප් අරුණ කාන්ත	සභික	ස්වා.1	ඉල්ලා අස්වීම	2019.09.20	කලීෆා මරික්කාර් අබ්දුල් අසීස්	2141/89 2019.09.21
වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව		පතිරන්නැහැලාගේ රෝහිනී මල්ලිකා	සභික		ඉල්ලා අස්වීම	2019.10.31	කෝමලා තැඹිලියා ගොඩගේ රුවනි නිසංසලා	2147/88 2019.11.03
අනුරාධපුර දිස්ත්‍රික්කය								
අනුරාධපුර මහ නගර සභාව	11-සමන්පුර	ආනන්ද සහනායක	සභික	ශ්‍රී.ලං.පො.පෙ.	මියයාම	2019.07.15	හෙන්දා විතාරනගේ ඉන්දික උපුල් කුමාර	2132/9 2019.07.17
මධ්‍යම නුවරගම්පළාත ප්‍රාදේශීය සභාව		රත්නමලල බණ්ඩාර වන්නිනායකගේ චන්ද්‍රගුප්ත වන්නිනායක	සභික	ජ.වි.පෙ.	ඉල්ලා අස්වීම	2019.07.12	වැලිවත්ත ගම්ලත්ලාගේ සුමිත් කුලතුංග	2132/10 2019.07.17
පොළොන්නරුව දිස්ත්‍රික්කය								
මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව		කුඩාගමගේ අසෝක කරුණාසේන	සභික	ජ.වි.පෙ.	ඉල්ලා අස්වීම	2019.10.02	දිසානායක මුදියන්සේලාගේ අමල් දිසානායක	2143/50 2019.10.03
දිඹුලාගල ප්‍රාදේශීය සභාව		කීර් ති සිංහ මුදියන්සේලාගේ උදාර සඳරුවන් බංඩාර	සභික	ජ.වි.පෙ.	ඉල්ලා අස්වීම	2019.10.02	කළුගම රාළලාගේ ගයාන් චතුරංග බංඩාර	2143/49 2019.10.03
ලංකාපුර ප්‍රාදේශීය සභාව		ගරුමුනි ගාමිණී ද සොයිසා	සභික	ජ.වි.පෙ.	ඉල්ලා අස්වීම	2019.10.16	තෙවරප්පෙරුම ආරච්චිගේ ඉන්දික ප්‍රියදර්ශන	2145/54 2019.10.19
පොළොන්නරුව මහ නගර සභා		මොහමදු ඉබ්‍රහිම් මොහොමදු අර්ෆා	සභික	එ.ජා.ප.	මියයාම	2019.10.26	ජයසුන්දර කෝරාලේ මුදියන්සේ රාළහාමිලාගේ සුජීව නිශාන්ත ගුණතිලක	2147/27 2019.10.28
පොළොන්නරුව ප්‍රාදේශීය සභාව		ඩී.ලනිරු අෂේන්	සභික	ජ.වි.පෙ.	ඉල්ලා අස්වීම	2019.11.27	එම්.එම්.සුනිල් කුලතිලක	2151/57 2019.11.29

පළාත් පාලන ආයතනය	කොට්ඨාස අංකය හා නම	පුරප්පාඩුව ඇති වූ සභිකයාගේ නම	තනතුර	පක්ෂය/ ස්වාධීන කණ්ඩායම	පුරප්පාඩු වීමට හේතුව	තෝරා එවූ දිනය	තේරී පත්වූ සභිකයාගේ නම	ගැසට් පත්‍රයෙහි අංකය හා දිනය
බදුල්ල දිස්ත්‍රික්කය								
බණ්ඩාරවෙල මහ නගර සභාව	05-බණ්ඩාරවෙල බටහිර	නලීන් ප්‍රියන්ත සූරියගේ	සභික	ස්වා.1	මියයාම	2019.01.04	හීන්කෙන්ද මුදියන්සේලාගේ මිත්‍රපාල හීන්කෙන්ද	2105/35 2019.01.10
බණ්ඩාරවෙල මහ නගර සභාව		නලීන් ප්‍රියන්ත සූරියගේ	නගරාධිපති	ස්වා.1	මියයාම	2019.01.04	ජනක නිශාන්ත රත්නායක	2105/36 2019.01.10
බණ්ඩාරවෙල මහ නගර සභාව		ජනක නිශාන්ත රත්නායක	නියෝජ්‍ය නගරාධිපති	ස්වා.1	නියෝජ්‍ය නගරාධිපති නගරාධිපති ලෙස පත්වීම	2019.01.04	හීන්කෙන්ද මුදියන්සේලාගේ මිත්‍රපාල හීන්කෙන්ද	2105/35 2019.01.10
මහියංගනය ප්‍රාදේශීය සභාව	06-දඹාන	දිසානායක මුදියන්සේලාගේ ශ්‍යාමලී කුමාරි දිසානායක	සභික	ස්වා.	ඉල්ලා අස්වීම	2019.05.16	අකුරුගොඩ කළු ආරච්චිලාගේ මානෙල් අසෝකමාලා කළුආරච්චි	2123/78 2019.05.17
මහියංගනය ප්‍රාදේශීය සභාව	12-දම්බරාව	වන්නිනායක මුදියන්සේලාගේ සමන් පුෂ්ප කුමාර වන්නිනායක	සභික	ස්වා.	ඉල්ලා අස්වීම	2019.06.10	අත්තනායක මුදියන්සේලාගේ සුමනරත්න	2127/10 2019.06.11
මොණරාගල දිස්ත්‍රික්කය								
සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව	01-බුද්දම	දිසානායක මුදියන්සේලාගේ ලොකුබණ්ඩා	සභික	ශ්‍රී.ලං.පො.පෙ.	මියයාම	2019.03.02	අදිකාරි මුදියන්සේලාගේ අප්පුහාමි	2113/44 2019.03.07
බුත්තල ප්‍රාදේශීය සභාව	01-පැල්වත්ත	හේරත් මුදියන්සේලාගේ චින්තක සම්පත් බණ්ඩාර	සභික	ශ්‍රී.ලං.පො.පෙ.	රැස්වීම් සඳහා සහභාගී නොවීම	2019.12.20	ඉන්ද්‍රසේන ලියන ආරච්චි	2155/10 2019.12.24
රත්නපුර දිස්ත්‍රික්කය								
කහවත්ත ප්‍රාදේශීය සභාව		ගස්පෙරාලලාගේ සුසිල් සිසිර කුමාර	සභික	ජ.වි.පෙ.	ඉල්ලා අස්වීම	2019.04.03	මනතුංග ආරච්චිගේ ජගත් ශාන්ත	2118/2 2019.04.08
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව	08-වලල්ගොඩ	මීගස්දෙණිය කංකානම්ගේ අමිල්	සභික	ශ්‍රී.ලං.පො.පෙ.	සභික ධුරය අහිමිවීම	2019.06.20	සේමගේ චන්ද්‍රරත්න කුරුකුල	2129/3 2019.06.24
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව		මීගස්දෙණිය කංකානම්ගේ අමිල්	සභාපති	ශ්‍රී.ලං.පො.පෙ.	සභික ධුරය අහිමිවීම	2019.06.20	වීරසිංහගේ සුරන්ත ජයලත්	2129/3 2019.06.24
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව		වීරසිංහගේ සුරන්ත ජයලත්	උප සභාපති	ශ්‍රී.ලං.පො.පෙ.	උප සභාපති සභාපති ලෙස පත්වීම	2019.06.20	මාතර ආරච්චිගේ ජයවීර	2129/3 2019.06.24
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව	05-ගඟේයාය	කැකනදුර විදාන ආරච්චිගේ චන්ද්‍රසිරි	සභික	ශ්‍රී.ලං.පො.පෙ.	මියයාම	2019.06.20	පත්තිනි වික්‍රමආරච්චිගේ නිමල් කුමාරසිංහ	2129/3 2019.06.24
ගොඩකවෙල ප්‍රාදේශීය සභාව		රාජමාණික්කම් අසෝක් කුමාර්	සභික	එ.ප්‍ර.ස. (ප්‍ර.ජ.පෙ.)	පක්ෂ සාමාජිකත්වය අහිමි වීම	2019.08.21	අත්නාමලේ බෝදිමාදවන්	2139/38 2019.09.04

පළාත් පාලන ආයතනය	කොට්ඨාස අංකය හා නම	පුරප්පාඩුව ඇති වූ සභිකයාගේ නම	තනතුර	පක්ෂය/ ස්වාධීන කණ්ඩායම	පුරප්පාඩු වීමට හේතුව	තෝරා එවූ දිනය	තේරී පත්වූ සභිකයාගේ නම	ගැසට් පත්‍රයෙහි අංකය හා දිනය
කෑගල්ල දිස්ත්‍රික්කය								
ගලිගමුව ප්‍රාදේශීය සභාව		සේනාදිනැන්නැහැලාගේ චම්පා කුමාරි සේනාධීර	සභික	එ.ජා.ප.	අවසර ලබා නොගෙන මාසතුනක කාලසීමාවක් සභාවේ අනුගාමී රැස්වීම්වලට සහභාගී නොවීම	2019.06.10	දනන්සුරිය ආරච්චිල්ලාගේ මල්ලිකා දනන්සුරිය	2127/18 2019.06.12
අරණායක ප්‍රාදේශීය සභාව	07-දෙබත්ගම	අමරසිංහ ආරච්චිලාගේ ඉෂාරා මධුෂානි අමරසිංහ	සභික	ශ්‍රී.ලං.පො.පෙ.	පක්ෂ සාමාජිකත්වය අහිමිවීම	2019.06.21	අතුගල් පේඩිගේ විමලාවතී	2129/64 2019.06.26
වරකාපොල ප්‍රාදේශීය සභාව		කොටුවේගොඩ පල්ලියගුරුගේ දනුෂ නවෝදන කුමාර කොටුවේගොඩ	සභික	ස්වා.	ඉල්ලා අස්වීම	2019.05.24	ගම්ලත් ආරච්චිලාගේ වසන්ත සිසිර කුමාර සමරතුංග	2125/22 2019.05.28

ඡන්දභිමි නාමලේඛන ප්‍රතිශෝධනය - 2019

ඡන්දභිමියන් ගණන් ගැනීමට අදාළ නව බීසී ආකෘතිය හඳුන්වාදීමේ නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පිළිබඳ විස්තර

මැතිවරණ කොට්ඨාසය	නව බීසී ක්‍රියාත්මක කරන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව	ඡන්ද ප්‍රදේශය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
කොළඹ	3	බොරැල්ල නැගෙනහිර	තිඹිරිගස්යාය
		බටහිර කොළඹ	
		අවිස්සාවේල්ල	පාදුක්ක
		කොළොන්නාව	කොළොන්නාව
ගම්පහ	3	මීගමුව	මීගමුව
		කැළණිය	කැළණිය
		අත්තනගල්ල	අත්තනගල්ල
කළුතර	2	මතුගම	දොඩන්ගොඩ
		බණ්ඩාරගම	බණ්ඩාරගම
මහනුවර	2	උඩදුම්බර	මිණිපේ
		නාවලපිටිය	ගඟ ඉහළ කෝරලය
මාතලේ	1	රත්තොට	රත්තොට
නුවරඑළිය	1	වලපනේ	වලපනේ
ගාල්ල	2	අක්මීමණ	බෝපෙ-පෝද්දල
		බද්දේගම	නාගොඩ
මාතර	1	අකුරැස්ස	අකුරැස්ස
හම්බන්තොට	1	තිස්සමහාරාම	ලුණුගම්වෙහෙර
යාපනය	1	යාපනය	යාපනය
කිළිනොච්චිය	1	කරච්චි	කරච්චි
මන්නාරම	1	මන්නාරම	මන්නාරම
වවුනියාව	1	වවුනියාව	වවුනියාව
මුලතිව්	1	මුලතිව්	මුහුදුබඩපත්තු
මඩකලපුව	1	කල්කුඩා	වාකරේ
දිගාමඩුල්ල	1	පොතුවිල්	නින්දවූර්
ත්‍රිකුණාමලය	1	මූතූර්	මූතූර්
කුරුණෑගල	2	ගල්ගමුව	ගිරිබාව
		පොල්ගහවෙල	පොල්ගහවෙල
පුත්තලම	1	පුත්තලම	වනාතවිල්ලුව
		ආණමඩුව	
අනුරාධපුරය	1	බටහිර අනුරාධපුර	නොච්චියාගම
පොළොන්නරුව	1	මින්නේරිය	ඇලහැර
බදුල්ල	1	බදුල්ල	බදුල්ල
මොණරාගල	1	වැල්ලවාය	තණමල්විල
රත්නපුර	2	රක්වාන	වැලිගේපොල
		බලංගොඩ	ඉඹුල්පෙ
කෑගල්ල	1	දැරණියගල	දැරණියගල
එකතුව	34		

ඡන්ද හිමි නාම ලේඛන ප්‍රතිශෝධනය - 2019
උතුරු සහ නැගෙනහිර පළාත්වල පිහිටි ගෙයින් ගෙට ගොස් ඡන්ද හිමියන් ගණන් ගැනීම සිදු නොකළ එක් එක් ග්‍රාම නිලධාරි වසම් පිළිබඳ විස්තර

ඡන්ද ප්‍රදේශය	ග්‍රාම නිලධාරි වසම අයත් ඡන්ද කොට්ඨාසයේ අංකය	ගෙයින් ගෙට ගොස් ඡන්ද හිමියන් ගණන් නොගත් ග්‍රාම නිලධාරි වසමේ අංකය සහ නම
ඇ - කන්කසන්තුරෙයි	36	J/ 235 කන්කසන්තුරෙයි දකුණ
	27	J/ 226 නගුලේස්වරම්
	51	J/ 250 තයිසිටි දකුණ
	44	J/ 243 කුරුම්බසිටි නැගෙනහිර
	39	J/ 238 කට්ටුවන්
	42	J/ 241 වරුත්තලෙයි විලාන්
	41	J/ 240 තෙන්මයිලෙයි
	46	J/ 246 මයිලිටි උතුර
	47	J/ 246 මයිලිටි උතුර
	45	J/ 245 වසාවිලාන් බටහිර
	55	J/ 254 පලාලි උතුර
	53	J/ 252 පලාලි දකුණ
	54	J/ 253 පලාලි නැගෙනහිර
	35	J/ 234 කන්කසන්තුරෙයි මධ්‍යම
	34	J/ 233 කන්කසන්තුරෙයි බටහිර
	50	J/ 249 තයිසිටි උතුර
	49	J/ 248 මයිලිටිතුරෙයි දකුණ
	52	J/ 251 මයිලිටිතුරෙයි උතුර
	43	J/ 242 කුරුම්බසිටි
	56	J/ 255 පලාලි වයඹ
	57	J/ 256 පලාලි බටහිර
ඉ - කෝපායි	5	J/ 245 වසාවිලාන් බටහිර
	4	J/ 244 වසාවිලාන් නැගෙනහිර
ක - කිළිනොච්චිය	49	KN/46 ආනෙයිරවු
	104	KN/92 ඉත්තාවිල්
	105	KN/93 මුහමාලෙයි
	106	KN/94 වෙම්බෝඩුකේනි
අ - මන්නාරම	55	MN/153 මුල්ලිකුලම
එකතුව		

ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය - 2019

ප්‍රවර්තන නාමලේඛනයේ (2019) සියලුම මැතිවරණ කොට්ඨාසවලට අදාළව ඉවත්වන නම්("අ"නම්) සංඛ්‍යාව සහ අලුතෙන් ඇතුලත්වන නම් ("ආ"නම්) සංඛ්‍යාව

මැතිවරණ කොට්ඨාසය	"අ"නම් සංඛ්‍යාව	"ආ"නම් සංඛ්‍යාව
01 - කොළඹ	134,458	161,430
02 - ගම්පහ	99,610	136,961
03 - කළුතර	54,797	71,578
04 - මහනුවර	55,858	72,695
05 - මාතලේ	19,725	25,495
06 - නුවරඑළිය	26,602	37,697
07 - ගාල්ල	42,345	49,364
08 - මාතර	28,439	34,929
09 - හම්බන්තොට	21,113	26,935
10 - යාපනය	41,003	50,344
11 - වන්නි	21,978	25,007
12 - මඩකලපුව	22,709	34,265
13 - දිගාමඩුල්ල	26,590	38,167
14 - ත්‍රිකුණාමලය	19,860	28,821
15 - කුරුණෑගල	60,996	77,832
16 - පුත්තලම	30,620	45,246
17 - අනුරාධපුර	30,714	43,463
18 - පොළොන්නරුව	16,042	20,511
19 - බදුල්ල	27,508	37,489
20 - මොණරාගල	21,904	27,856
21 - රත්නපුරය	40,244	52,887
22 - කෑගල්ල	31,497	38,078
එකතුව	874,612	1,137,050

ඡන්දභිමි නාමලේඛන ප්‍රතිශෝධනය - 2019

නියෝජිතයින් පත්කරනු ලැබූ දේශපාලන පක්ෂ , පත්කරනු ලැබූ ප්‍රමාණයන් හා ඡන්ද හිමියන් ගණන් ගැනීමේ කාර්යය සඳහා සහභාගී වූ නියෝජිතයන් පිළිබඳ විස්තර

මැතිවරණ කොට්ඨාසය	ඡන්ද කොට්ඨාස සංඛ්‍යාව	පිළිගත් දේශපාලන පක්ෂ විසින් පත්කරන ලද නියෝජිතයින් සංඛ්‍යාව																	
		එක්සත් ජනතා නිදහස් සන්ධානය		එක්සත් ජාතික පක්ෂය		ජනතා විමුක්ති පෙරමුණ		ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ		ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ		ශ්‍රී ලංකා නිදහස් පක්ෂය		පොදුජන එක්සත් පෙරමුණ		එක්සත් සාම සන්ධානය		ලිබරල් පක්ෂය	
		පත් කළ නියෝජිත සංඛ්‍යාව	සහභාගී වූ නියෝජිත සංඛ්‍යාව	පත් කළ නියෝජිත සංඛ්‍යාව	සහභාගී වූ නියෝජිත සංඛ්‍යාව	පත් කළ නියෝජිත සංඛ්‍යාව	සහභාගී වූ නියෝජිත සංඛ්‍යාව	පත් කළ නියෝජිත සංඛ්‍යාව	සහභාගී වූ නියෝජිත සංඛ්‍යාව	පත් කළ නියෝජිත සංඛ්‍යාව	සහභාගී වූ නියෝජිත සංඛ්‍යාව	පත් කළ නියෝජිත සංඛ්‍යාව	සහභාගී වූ නියෝජිත සංඛ්‍යාව	පත් කළ නියෝජිත සංඛ්‍යාව	සහභාගී වූ නියෝජිත සංඛ්‍යාව	පත් කළ නියෝජිත සංඛ්‍යාව	සහභාගී වූ නියෝජිත සංඛ්‍යාව	පත් කළ නියෝජිත සංඛ්‍යාව	සහභාගී වූ නියෝජිත සංඛ්‍යාව
කොළඹ	1,166	-	-	477	194	826	310	6	-	812	277	-	-	-	-	6	-	-	-
ගම්පහ	1,171	-	-	1,088	112	273	56	8	8	1,100	89	194	12	-	-	-	-	-	-
කළුතර	540	-	-	682	66	348	10	-	-	633	77	164	7	-	-	-	-	-	-
මහනුවර	827	-	-	973	370	374	56		-	-	-	-	-	-	-	-	-	-	-
මාතලේ	324	-	-	271	36	-	-	-	-	391	35	-	-	-	1	-	1	-	-
නුවරඑළිය	485	-	-	445	61	-	-	-	-	402	6	-	-	-	-	-	-	-	-
ගාල්ල	712	-	-	586	126	505	42	5	-	552	100	-	-	-	-	-	-	-	-
මාතර	446	-	-	242	40	556	49	-	-	638	35	-	-	-	-	-	-	-	-
හම්බන්තොට	413	-	-	129	13	156	9	-	-	475	30	-	-	-	-	-	-	-	-
යාපනය	631		-	2	-	-	-	2	-	-	-	-	-	-	-	-	-	2	-
වන්නි	351	-	-	1	-	2	-	4	-	64	-	-	-	-	-	-	-	-	-
මඩකලපුව	416	-	-	10	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	10	-
දිගාමඩුල්ල	525	-	-	93	16	-	-	-	-	188	18	-	-	-	-	68	17	-	-
ත්‍රිකුණාමලය	307		-	3	-	-	-	-	-	-	-	-	-	-	-	3	-	3	-
කුරුණෑගල	950	-	-	487	142	653	48	5	-	1,594	201	103	13	-	-	-	-	14	-
පුත්තලම	387			79	11	142	17	-	-	408	41	-	-	-	-	-	-	-	-
අනුරාධපුරය	634	-	-	537	180	-	-	-	-	620	168	-	-	-	-	-	-	-	-
පොළොන්නරුව	287	-	-	-	-	87	10	-	-	287	34	-	-	-	-	-	-	-	-
බදුල්ල	523			349	81	115	16	-	-	334	33	-	-	-	-	-	-	-	-
මොණරාගල	384	115	2	-	6	156	10			323	26	-	-	-	-	-	-	-	-
රත්නපුරය	627	-	-	668	95	242	11	10		567	86	-	-	-	-	-	-	-	-
කෑගල්ල	573	34	21	434	75	190	22	4	-	519	75	-	-	-	-	-	-	9	-
එකතුව	**12,679**	**149**	**23**	**7,556**	**1,624**	**4,625**	**666**	**44**	**8**	**9,907**	**1,331**	**461**	**32**	**-**	**1**	**77**	**18**	**38**	**-**

ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය - 2019

1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 14 වන වගන්තිය යටතේ හිමිකම් ඉල්ලීම් හා විරෝධතා ඉදිරිපත් කිරීම්

මැතිවරණ කොට්ඨාසය	හිමිකම්	විරෝධතා
	ලැබුණු හිමිකම් සංඛ්‍යාව	ලැබුණු විරෝධතා සංඛ්‍යාව
01 - කොළඹ	31,754	115
02 - ගම්පහ	6,099	57
03 - කළුතර	11,157	46
04 - මහනුවර	5,404	21
05 - මාතලේ	2,320	44
06 - නුවරඑළිය	1,617	16
07 - ගාල්ල	5,450	82
08 - මාතර	3,150	22
09 - හම්බන්තොට	3,815	18
10 - යාපනය	4,270	21
11 - වන්නි	3,832	3
12 - මඩකලපුව	2,609	37
13 - දිගාමඩුල්ල	1,276	22
14 - ත්‍රිකුණාමලය	1,832	7
15 - කුරුණෑගල	5,324	14
16 - පුත්තලම	3,065	7
17 - අනුරාධපුර	1,849	27
18 - පොළොන්නරුව	1,825	25
19 - බදුල්ල	3,445	13
20 - මොණරාගල	1,656	21
21 - රත්නපුරය	4,210	72
22 - කෑගල්ල	4,197	20
එකතුව	**110,156**	**710**

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ සාකච්ඡා පැවති දින වකවානු

අනු අංකය	අතරමැදි ඇගයුම සිදුකරන ලද දිස්ත්‍රික් මැනිවරණ කාර්යාලය/ කාර්යාල	දින/ දිනය
01.	මන්නාරම	2019.08.21
02	මුලතිවු, කිළිනොච්චි	2019.08.22
03.	යාපනය	2019.08.23
04.	ගම්පහ	2019.08.26
05.	මහනුවර, කෑගල්ල, වවුනියාව	2019.08.28
06.	කළුතර, මාතලේ,රත්නපුර, අනුරාධපුර	2019.08.29
07.	හම්බන්තොට, මාතර, පොළොන්නරුව	2019.08.30
08.	කොළඹ දිස්ත්‍රික්/ කොළඹ නාගරික	2019.09.03
09.	කුරුණෑගල	2019.09.09
10.	අම්පාර, මඩකලපුව	2019.09.16
11.	ත්‍රිකුණාමලය	2019.09.17
12.	පුත්තලම	2019.09.27
13.	බදුල්ල	2019.09.30
14.	මොණරාගල	2019.10.01
15.	නුවරඑළිය	2019.10.02
16.	ගාල්ල	2019.10.17
17.	ප්‍රධාන කාර්යාලය	2019.10.24

2019 වර්ෂයේදී කටයුතු කරන ලද නඩු

නඩු සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත පෙරකලාසි ඉදිරිපත් කිරීම

ශ්‍රේෂ්ඨාධිකරණ	අභියාචනාධිකරණ	මහාධිකරණ	දිසා අධිකරණ
SC(SPL)Exp/01/2019	CA/Exp/01/2019	WP/HCCA/COL/LA/54/2019	MIS/167/2018
SC/Exp/02/2019	CA/Writ/23/2019	WP/HCCA/COL/118/2019/LA	MIS/168/2018
SC/FR/354/2019	CA/Writ/110/2019		
SC/FR/320/2019	CA/Writ/143/2019		
SC/Writ/04/2019	CA/Exp/02/2019		
SC/FR/387/2019	CA/Writ/295/2019		
SC/Writ/08/2019	CA/Writ/256/2019		
SC/Writ/10/2019	CA/Writ/186/2019		
SC/FR/417/2019	CA/Writ/418/2019		
SC/FR/419/2019	CA/Writ/388/2019		
SC/FR/430/2019	CA/Writ/458/2019		
SC/FR/431/2019	CA/Writ/69/2019		
SC/FR/432/2019	CA/Writ/68/2019		
SC/FR/433/2019			
SC/FR/434/2019			
SC/Writ/03/2019			
SC/Writ/02/2019			
SC/Writ/01/2019			
SC/FR/435/2019			

නඩු කටයුතු වලට අදාළ නිරීක්ෂණ, දිවුරුම් ප්‍රකාශ, වෙනත් ලේඛන නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

ශ්‍රේෂ්ඨාධිකරණ නඩු	අභියාචනාධිකරණ නඩු	මහාධිකරණ නඩු	දිසා අධිකරණ නඩු
SC/FR/354/2019	CA/Writ/23/2019	WP/HCCA/LA/54/2019	3797/M
SC/Writ/08/2019	CA/Writ/143/2019		
SC/FR/440/2019	CA/Writ/217/2018		
SC/Writ/01/2019	CA/writ/256/2019		
SC/Writ/02/2019	CA/Writ/295/2019		
SC/Writ/03/2019	CA/Writ/110/2019		
	CA/Writ/186/2019		
	CA/Writ/68/2019		
	CA/Writ/69/2019		

සටහන XIV

නඩු සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ සාකච්ඡා පැවැත්වීම

නඩුවාර සහ සාකච්ඡා	නඩු අංක
නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ සාකච්ඡා පැවැත්වීම	CA/Writ/110/2019 CA/Writ/23/2019 CA/Writ/256/2019 CA/Writ/295/2019 CA/Writ/186/2019 SC/FR/354/2019 SC/Writ/08/2019 CA/Writ/217/2018
නඩුවාර සඳහා සහභාගී වීම	SC/Writ/01/2019 SC/Writ/02/2019 SC/Writ/03/2019 CA/Writ/68/2019 CA/Writ/69/2019

2019 වර්ෂයේ සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරීන් නාමලේඛනය **සටහන XV**

අංකය	නිලධාරියාගේ නම	තනතුර	මැතිවරණ දෙපාර්තමේන්තුවේ සේවයට පැමිණි දිනය	විශ්‍රාම ගන්නා අවස්ථාවේ සේවය කළ කාර්යාලය	විශ්‍රාම ගිය දිනය	සේවා කාලය		මුල්පත්වීම් දිනය	උපන් දිනය	විශ්‍රාම/ මියගිය
						සම්පූර්ණ රාජ්‍ය සේවා කාලය අවු/මාස/දින	මැතිවරණ දෙපාර්තමේන්තුවේ සේවා කාලය අවු/මාස/දින			
1	එච්.ඒ. සුමනාවතී මහත්මිය	රා.ක.ස. I	2007 - 08 - 20	කුරුණෑගල	2019 - 01 - 05	*38 / 11 / 15*	*11 / 4 / 16*	1980 - 01 - 21	1959 - 01 - 05	විශ්‍රාම
2	ඒ.එල්.ඒ. ජයන්ත මහතා	රා.ක.ස. I	1983 - 03 - 07	ගාල්ල	2019 - 01 - 15	*35 / 10 / 8*	*35 / 10 / 8*	1983 - 03 - 07	1959 - 01 - 15	විශ්‍රාම
3	ආර්.ඒ.එල්. රණසිංහ මහතා	රා.ක.ස. III	1995 - 11 - 03	කෑගල්ල	2019 - 03 - 04	*23 / 4 / 1*	*23 / 4 / 1*	1995 - 11 - 03	1959 - 03 - 04	විශ්‍රාම
4	එම්.එම්. මොහමඩ් මහතා	මැතිවරණ කොමසාරිස් ජනරාල්/ අධ්‍යක්ෂ ජනරාල්	1991 - 05 - 02	ප්‍රධාන කාර්යාලය	2019 - 03 - 10	*27 / 10 / 19*	*27 / 10 / 8*	1991 - 04 - 19	1959 - 03 - 10	විශ්‍රාම
5	කේ.ආර්. ගුණතිලක බණ්ඩා මහතා	රා.ක.ස. I	2015 - 04 - 01	ගම්පහ	2019 - 07 - 10	*33 / 6 / 9*	*4 / 3 / 9*	1985 - 12 - 31	1959 - 07 - 10	විශ්‍රාම
6	වී. සාන්තමලර් මහත්මිය	රා.ක.ස. I	1988 - 09 - 01	මාතලේ	2019 - 09 - 01	*31 / 0 / 0*	*31 / 0 / 0*	1988 - 09 - 01	1960 - 05 - 21	විශ්‍රාම
7	කේ.පී.පී.සී. කරුණාරත්න මහත්මිය	රා.ක.ස. I	1987 - 01 - 12	කුරුණෑගල	2019 - 09 - 08	*33 / 4 / 18*	*32 / 7 / 27*	1986 - 04 - 21	1959 - 08 - 09	විශ්‍රාම
8	එස්.එම්. හාලික් මහතා	රා.ක.ස. I	1996 - 07 - 17	පොළොන්නරුව	2019 - 10 - 05	*25 / 8 / 10*	*23 / 2 / 18*	1994 - 01 - 25	1959 - 10 - 05	විශ්‍රාම
9	යූ.එල්. ඉස්මා ලෙබ්බේ මහතා	රා.ක.ස. I	1993 - 02 - 03	අම්පාර	2019 - 10 - 13	*26 / 8 / 10*	*26 / 8 / 10*	1993 - 02 - 03	1959 - 10 - 13	විශ්‍රාම
10	කේ.ජී.ආර්. අබේවික්‍රම මහතා	රා.ක.ස. III	1995 - 08 - 01	කෑගල්ල	2019 - 10 - 13	*24 / 2 / 12*	*24 / 2 / 12*	1995 - 08 - 01	1959 - 10 - 13	විශ්‍රාම
11	ඩබ්ලිව්.එල්.එල්. චන්ද්‍රසේකර මහතා	රා.ක.ස. I	2000 - 07 - 25	මාතර	2019 - 10 - 17	*38 / 10 / 19*	*19 / 2 / 22*	1980 - 11 - 28	1959 - 10 - 17	විශ්‍රාම
12	ඩබ්ලිව්. කුලරත්න මහතා	කා.කා.ස. (විශේෂ)	1992 - 03 - 25	ගාල්ල	2019 - 11 - 21	*27 / 7 / 27*	*27 / 7 / 27*	1992 - 03 - 25	1959 - 11 - 21	විශ්‍රාම

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඒජීඒ/ඊ/ඊසී/2019/35 | මගේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2020 ජූනි 22 දින.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී,
මැතිවරණ කොමිෂන් සභාව

මැතිවරණ කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මැතිවරණ කොමිෂන් සභාවේ 2019දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මැතිවරණ කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍යකාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් වක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මහහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඡේද යොමුව	විගණන නිරීක්ෂණය	නිර්දේශය
1.4.4.(ඇ)	සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් කාර්යාල විසින් අපහරනය කරන ලද කාර්යාලීය උපකරණ හා යන්ත්‍රෝපකරණවල පිරිවැය රු.4,369,874 ක් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ අපහරණ යටතේ දක්වා නොතිබුණි.	සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් කාර්යාල විසින් අපහරනය කරන ලද කාර්යාලීය උපකරණ හා යන්ත්‍රෝපකරණවල පිරිවැය ද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ අපහරණ යටතේ දැක්විය යුතුය.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ආදායම් නොවන ලැබීම්

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.1 ඡේදයට අනුව කොමිෂන් සභාවට අදාළ භාණ්ඩාගාර පොත්වල සඳහන් වෙනත් ලැබීම්වල එකතුව රු. 95,536,927 ක් ලෙස දැක්විය යුතු වුවත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ රු. 68,372,373ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.6.2 අක්මුදල් ගැලැපුම් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අක්මුදල් ගැලපුම් ගිණුමෙහි වෙනත් දෙපාර්තමේන්තු වෙනුවෙන් දරන ලද වියදම රු. 695,338 ක් අඩුවෙන් ගැලපුම් කර තිබුණි.

(ආ) කොමිෂන් සභාවේ අක්මුදල් ගිණුමෙහි රු. 67,676,134 ක ශේෂයක් පැවතුණි.

1.6.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ කාර්යාලීය උපකරණ සහ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වටිනාකම තුල දිස්ත්‍රික් කාර්යාල විසින් අපහරණය කරන ලද භාණ්ඩවල පිරිවැය ඇතුළත් කර නොතිබුණි.

(ආ) කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශනය අනුව 2019 දෙසැම්බර් 31 දිනට වාහනවල වටිනාකම රු. 143,032,850 ක් වූ අතර එදිනට ආයතනය සතු වාහන පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය අනුව වාහනවල වටිනාකම රු. 281,846,500 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල 20-1-1-2105 වැය විෂයය යටතේ රු. 985,613 ක වියදමක් ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම වෙනුවෙන් වැය කර තිබුණු අතර එම වටිනාකම සමාලෝචිත වර්ෂය තුල ප්‍රාග්ධනිත කර මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙහි අන්තර්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුල ඉදිකිරීම් කටයුතු අවසන් නොකළ යාපනය දිස්ත්‍රික් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු වෙනුවෙන් වැය කරන ලද රු. 33,208,354 ක වටිනාකම වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ නොනිමි වැඩ (61131), කාර්යාලීය ගොඩනැගිලි (6113109) යටතේ ප්‍රාග්ධනිත කළ යුතු වුවත් එය ස්ථාවර වත්කම්,ගොඩනැගිලි සහ ඉදිකිරීම් යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි.

1.6.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

1.6.4.1මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු.68,372,373 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනත් වැය විෂයන් වෙනුවෙන් දරන ලද වියදම රු.1,087,819,383 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.1,156,190,853 ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.6.4.2 ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශ ආදර්ශ ආකෘතිය (ඒසීඒ - සී) අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීම නිවැරදි නොවුණි.

(ඇ) ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේ දී අත්තිකාරම් ගෙවීම් යටතේ හරස් සටහන්වල අගයන්ද එකතු කර දක්වා තිබුණි.

1.6.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

හානි පිළිබඳ ලේඛනය පවත්වා ඇතත් එය මු.රෙ.110 ප්‍රකාරව යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ 20-1-1-1-2509 වැය විෂය යටතේ මැතිවරණ කළමනාකරණ වැඩසටහන් වැඩිදියුණු කිරීම වෙනුවෙන් වෙන්කර තිබූ රු. 5,050,000 ක් වූ මුළු මුදලම ඉතිරිවී තිබුණි.

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ප්‍රකාරව කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා නිසි පුහුණු සැලැස්මක් සකස් නොකිරීම හේතුවෙන් 20-1-1-1-2401 වැය විෂයය යටතේ කාර්ය මණ්ඩල පුහුණුව සඳහා වෙන් කර තිබූ මුදලින් රු. 2,264,212 ක් ඉතිරිවී තිබුණි.

(ඇ) 20-1-1-1003 හා 20-1-1-1101 වැය විෂයයන් යටතේ මුදල් පොතට අනුව වියදම හා මු.රෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු යටතේ මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණු වියදම් අතර වෙනසක් පැවතුණි.

2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 264	ගෙවීම් වවුචර්වලට කුවිතාන්සි අමුණා නොතිබුණු අවස්ථා විය.
(ii)මුදල් රෙගුලාසි 751	සමාලෝචිත වර්ෂයේ මිල දී ගත් රූපවාහිනී යන්ත්‍ර බඩු ලේඛන පොතෙහි මුදල් රෙගුලාසි 454 ප්‍රකාරව සටහන් කර නොතිබුණි.
(iii) මුදල් රෙගුලාසි 751(5)	මාතලේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ඡන්ද පෙට්ටි ගබඩාවේ භාණ්ඩ හා බදුල්ල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ගබඩාවලට ප්‍රමාණවත් ආරක්ෂාවක් නොතිබුණි.
(iv) මුදල් රෙගුලාසි 1647	වාහන හා උපකරණ පිළිබඳ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි.
(ආ) 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	ධාවන තත්වයේ නොපවතින වාහන 03ක් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන ආයතන පරිශ්‍රයේ නවතා ඇති අතර 2017 වර්ෂයේ අපහරණය කිරීමට හඳුනාගෙන තිබූ මෝටර් බයිසිකලයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.
(ඇ) 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය	
3.1 ඡේදය	2019 මූල්‍ය ප්‍රකාශන තුල අවසන් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන ඇමුණුම් ලෙස අන්තර්ගත කර නොතිබුණි.
(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය	
(i) 1. 4 වගන්තිය	2019 ජනාධිපතිවරණයට අදාලව මොණරාගල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය විසින් මූලික කටයුතු වෙනුවෙන් ආහාරපාන හා තේ පානය සැපයීම වෙනුවෙන් සිදු කරන ලද ප්‍රසම්පාදනයේදී

	සම්බන්ධතා පිළිබඳ අනුකූලතාවයක් දැක්වීමේ ප්‍රසම්පාදන ආචාර ධර්මයට බැහැරව කටයුතු කර තිබුණි.
(ii) 2.6.1.(අ) ii වගන්තිය	2019 සැප්තැම්බර් මාසයේදී මිලදී ගත් රූපවාහිනී යන්ත්‍රවලට අදාළව වෙළඳපොල සම්මත ප්‍රමාණයන් ගෙන් යුතු පිරිවිතර සකස් නොකිරීමෙන් අවස්ථා දෙකකදී මිල දී ගෙන තිබූ රූපවාහිනී යන්ත්‍රවල පිරිවිතරයන් අනුමත පිරිවිතරයන් සමඟ නොසැසඳුනි.
(iii) 4.3.1.(ආ)	ප්‍රසම්පාදනයට සූදානම්වීමේ වියදම් වෙන් වශයෙන් පිරිවැය ඇස්තමේන්තුව තුල දැක්විය යුතු වුවත් මධකලපු දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් නිල නිවස ඉදිකිරීම සඳහා සකස් කරන ලද පිරිවැය ඇස්තමේන්තුව තුල දැන්වීම් පළ කිරීම වෙනුවෙන් දරන ලද රු.124,000 ක වියදම් දක්වා නොතිබුණි.
(iv) 4.3.1.සහ 4.3.2 (ප්‍රසම්පාදන කාර්යය සං ග්‍රහය)	කොන්ත්‍රාත් සඳහා පරිපාලන පිරිවැය සියයට 1 ට අඩුවිය යුතු වුවත් මධකලපු දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් නිල නිවස ඉදිකිරීම සඳහා සකස් කරන ලද පිරිවැය ඇස්තමේන්තුව තුල පරිපාලන පිරිවැය සෘජු කොන්ත්‍රාත් පිරිවැයෙන් සියයට 2 ක් දක්වා තිබුණි.
(v) 4.3.2 වගන්තිය	කොමිෂන් සභාව විසින් පහත කාර්යයන් ඉටු කිරීමට අදාළව ආයතන ප්‍රධානියා විසින් අනුමත කරන ලද මුළු පිරිවැය ඇස්තමේන්තු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. • මධකලපු දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් නිල නිවස ඉදි කිරීම. • යාපනය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරීම. • මැතිවරණ කොමිෂන් සභා පරිශ්‍රයේ හීන් ඇලට යාබදව නව ගරාජයක් ඉදි කිරීම.
(vi) 5.3.1.(ඇ)	මධකලපු දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් නිල නිවස ඉදි කිරීම සඳහා සකස් කළ ලංසු කැඳවීමේ ලේඛන ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර නොතිබුණි.
(vii) 6.3.6 වගන්තිය	කොමිෂන් සභාව විසින් රු.1,619,085 ක් වටිනා ඉබි යතුරු මිල දී ගැනීමට අදාළව විධිමත් පරිදි ලංසු විවෘත කිරීමේ වාර්තා පවත්වා ගෙන ගොස් නොතිබුණු අතර ලංසු විවෘත කිරීමේ කමිටුවේ එක් සමාජිකයෙකු පමණක් ලේඛනවල අත්සන් කර

තිබුණි.

(viii) 7.9.2. වගන්තිය

කොමිෂන් සභා පරිශ්‍රයේ නව ගරාජයක් ඉදිකිරීමේ ප්‍රසම්පාදනයේදී ලංසුවල අංක ගණිතමය වැරදි නිවැරදි කර නොතිබුණි.

(ix) 8.9.1 වගන්තිය

(i) රු.500,000 ඉක්මවන පහත සඳහන් භාණ්ඩ මිල දී ගැනීමේදී ගිවිසුම්වලට එළඹුණු බවට තොරතුරු අදාල ගොණුවල නොතිබුණි.

- රු.2.,754,376 ක් වටිනා ඖයා පිටපත් යන්ත්‍ර 10 ක් මිලදී ගැනීම.
- රු.1,619,085 ක් වටිනා ඉබි යතුරු 12,350 ක් මිල දී ගැනිම.

(ii) කොමිෂන් සභා පරිශ්‍රයේ නව ගරාජයක් ඉදි කිරීමට අදාල ප්‍රසම්පාදනයේදී ඉදිරිපත් කර තිබූ ප්‍රතිග්‍රහන ලිපිය විධිමත් පරිදි සකස් කර නොතිබුණු අතර පහත අවස්ථාවලදී සකස් කර තිබූ කොන්ත්‍රාත් ගිවිසුම් විධිමත් පරිදි සකස් කර නොතිබුණි.

- කොමිෂන් සභා පරිශ්‍රයේ නව ගරාජයක් ඉදි කිරීම
- මඩකලපු දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් නිල නිවස ඉදි කිරීම.
- අතිරේක මැතිවරණ කොමසාරිස් (පාලන) කාමරය අලුත් වැඩියා කිරීම .
- පළාත් පාලන කාර්යාලය පරිගණක ජාල ගත කිරීම.
- යාපනය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරීම.

(x) 8.13.4 (ප්‍රසම්පාදන කාර්යය සංග්‍රහය)

මඩකලපු දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් නිල නිවස ඉදි කිරීමේදී රු.763,807ක අමතර කාර්යයන් ආයතන ප්‍රධානියාගේ පූර්ව අනුමැතියකින් තොරව සිදු කර තිබුණි.

(උ) අභ්‍යන්තර චක්‍රලේඛ

(i) **2019 සැප්තැම්බර් 24 දිනැති අංක PRE/2019/06 දරන ලිපිය**

(i)	2.7.1 ඡේදය ප්‍රකාරව 2019-ජනාධිපතිවරණ ඡන්ද විමසීමට අදාලව සිදු කල යුතු සියළු ප්‍රසම්පාදනයන්ට අදාලව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතුය.	මඩකලපු දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.
(ii)	2.9.6 ඡේදය ප්‍රකාරව 2019-ජනාධිපතිවරණයට අදාලව පිහිටුවන ලද කමිටුවල කාර්යභාරයට අදාළ කාර්යසාධන වාර්තාවක් ඡන්ද විමසීම අවසන් වී මසක් ඇතුළත සහකාර මැතිවරණ දිස්ත්‍රික් කොමසාරිස් වෙත ලබා දිය යුතුය.	මඩකලපු හා කොළඹ දිස්ත්‍රික් සහ කොළඹ නාගරික මැතිවරණ කාර්යාලවල ප්‍රසම්පාදන , ගබඩා,කාර්යමණ්ඩල හා තැපැල් ඡන්ද යන කමිටු විසින් නියමිත පරිදි කාර්යසාධන වාර්තා දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් වෙත ලබා දී නොතිබුණි.
(iii)	2.9.6 ඡේදය ප්‍රකාරව 2019-ජනාධිපතිවරණයට අදාලව පිහිටුවන ලද කමිටුවල කාර්යමණ්ඩලයේ පැමිණීමේ ලේඛන ඡන්ද විමසීමෙන් පසු සහකාර දිස්ත්‍රික් මැතිවරණ කොමසාරිස් වෙත ලබා දිය යුතුය.	මඩකලපු දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුවට අදාළ පැමිණීමේ ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය හා කාර්යසාධනය

ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් මෙහෙයුම් සමාලෝචනය, තිරසාර සංවර්ධනය, යහපාලනය හා මානව සම්පත් කළමනාකරණයට අදාළ විගණන නිරීක්ෂණ ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ලැබේ.

එම්.ජී.බී.ජී. පී.ප්‍රනාන්දු
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට